FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

**"රංගිරි ශ්‍රී ලංකා"**

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER



FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

**"රංගිරි ශ්‍රී ලංකා"**

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

ශ්‍රී.බු.ව. 2565- ක්‍රි.ව. 2021
දෙසැම්බර් (උදුවප්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

37




**රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය**

RSL TELEVISION

**UHF CH 60**
**PEO TV CH 22**
**Dialog Tv 21**
**Dish Tv 2532**

**රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය**
**දේශයේ රන් හඬ**

RSL RADIO

**FM 104.4 - 105.7**

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# උඳුවප් පෝය වර්ණනාව

ශ්‍රී ලංකාවේ ආර්‍ය ජනාවාස ආරම්භයේ සිටම ජනතාව කෘෂිකර්මාන්තය මූලික කරගෙන ක්‍රියාකර ඇති බව ඓතිහාසික තොරතුරු වලින් පෙනේ. මෙරටට බුදු සමය ලැබීමෙන් පසු කෘෂි කර්මාන්තය යළි ක්‍රමානුකූලව සිදුවිය. සිංහල මාස ක්‍රමය අනුගමනය කරමින් ඒවාට සුදුසු දින වකවානු වෙන්කර ගත්හ. ඒ අනුව උඳුවප් මාසය තුළ කෘෂිකර්මාන්ත කටයුතු පුළුල් ලෙස පවත්වාගෙන ගිය බවක් පෙන්නුම් කෙරේ. උඳුවප් යන නාමය මේ සඳහා යොදාගත් බව ජනසම්මත විශ්වාසයයි. ශාසනික වශයෙන් වැදගත්වන කරුණු කිහිපයක් මෙම පොහොය හා සම්බන්ධව පවතී. ඒයින් ප්‍රධාන වන්නේ ධර්මාශෝක අධිරාජ්‍යාගේ දියණියවන සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාවද රැගෙන ශ්‍රී ලංකාද්වීපයට වැඩම කරවීමය. එවකට ලක්දිව රජකළ දේවානම්පියතිස්ස රජතුමා එම රාජකීය දූත පිරිස ජම්බුකෝල පටුනේදී ගෞරව භක්තියෙන් යුක්තව පිළිගෙන පෙරහරින් අනුරාධපුරයට වැඩම කරවා මහමෙවුනා උයනෙහි සකස් කරන ලද උස් භූමියක බෝධීන් වහන්සේ රෝපණයකර මහපූජාවන් පැවැත්වූ බව වංශකතාවල සඳහන් වෙයි. (බෝධිවංශය), (සමන්තපාසාදිකාව) මෙම දූත පිරිසට රහත් මෙහෙණින් වහන්සේලා එකළොස් නමක් වැඩම කරවිය. ''අනුලා දේවිය'' ප්‍රධාන රාජකීය පවුල්වල කාන්තාවන් පැවිදිවීමෙන් පසු භික්ෂුණී මෙහෙනිවර මෙරට ආරම්භ විය. පළමුවරට මිහින්තලාව අවට ප්‍රදේශයේ භික්ෂූන් හා භික්ෂුණීන් සඳහා ආරාම කිහිපයක් ඇති වූ බව සෙල්ලිපි වලින් පැහැදිලි වෙයි. සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ සමඟ පැමිණි අටලොස් කුලයන්ද ලක්දිව විවිධ ප්‍රදේශවල පදිංචි වී කර්මාන්ත ආරම්භ කළ බව වංශකතාවෙහි (මහාවංශය) සඳහන් වෙයි. එමගින් කාර්මික නව ජනසමාජයක් ආරම්භ විය. එය හෙළ ජනතාවගේ මූලික ආර්ථික අවස්ථාවක් ලෙස සැළකිය හැකිය. එමෙන්ම විවිධ කලාවන්ද මේ සමගම බිහිවීමෙන් ජනතාවගේ නව ප්‍රබෝධයක්ද ඇති වූ බව සඳහන් කිරීමට පුළුවන.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය

# ලංකාතිලක පිළිමගෙය



පොළොන්නරු රාජධානි සමයේ ඉදි වූ පිළිමගෙවල් අතරින් ලංකා තිලක පිළිමගෙයට හිමි වන්නේ වැදගත් තැනකි. පොළොන්නරු රාජ්‍යයේ රජකළ පළමුවන පරාක්‍රමබාහු රජතුමා විසින් මෙම විහාරය කරවූ බව ඉතිහාසයෙහි සඳහන් වෙයි. වාස්තු විද්‍යාඥයින් රැසකගේ උසස් නිර්මාණයක් ලෙස මෙය සැළකේ. මෙම විහාරයේ පියස්ස ගඩොල් යොදාගෙන නිර්මාණය කරතිබීම විශේෂ දෙයකි. එනිසාම මෙම විහාරයට ''ගෙඩිගේ'' යන නාමයද ඇතුළත් කරතිබේ.

මහල් කිහිපයකින් යුක්තව තිබීමත් උළුවස්ස කළුගලින් නිර්මාණය කිරීමත් නිසා එය විශේෂ අවස්ථාවක් ලෙස පෙන්නුම් කර තිබේ. අභ්‍යන්තරයෙහි කැටයම් සහ චිත්‍ර කලාවන්ගෙන් සමන්විත වූ බව දැනට මෙහි ඉතිරි වී ඇති නටඹුන් වලින් පැහැදිලිවෙන බව පුරාවිද්‍යාඥයින්ගේ අදහසයි. මෙම විහාරයෙහි දිග අඩි 124ක් වන අතර පළල අඩි 66කි. දැනට ඉතිරිවී ඇති බිත්තියේ උස ප්‍රමාණය අඩි 58කි.

විශේෂ ආසනයක් මත ප්‍රධාන පිළිමය අභ්‍යන්තරයෙහි නිර්මාණය කරතිබේ. එම ප්‍රධාන පිළිමයට හානි සිදු වී ඇති නිසා මුලින්ම පැවැති ස්වභාවය අවබෝධ කරගැනීම දුෂ්කර වී තිබේ. දැනට ප්‍රතිමාවේ ඇති උස ප්‍රමාණය අඩි 42කි.


මෙම විහාරයට ඇතුල්වන පියගැටපෙළ දෙපසෙහි මුරදේවතා රූප දෙකක් දක්නට පුළුවන.මෙයට පියස්සක් තිබූ බවට ශේෂ වී ඇති ගල්කණු සාක්ෂි දරයි. මෙම කොටස විශේෂ ආගමික අවස්ථාවලදී ජනතාවට රැඳී සිටින්නටත් හේවිසිකරුවන් ශබ්ද පූජා පැවැත්වීම සඳහාත් භාවිතා කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. (පුරාවිද්‍යාඥයින්ගේ මතයට) ලාංකික ගෘහ නිර්මාණ කලාවේ විශිෂ්ඨතම නිර්මාණයක් ලෙස සැළකෙන මෙම විහාර මන්දිරය දෙස්, විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණය දිනාගැනීමට සමත් වැදගත් ඓතිහාසික පුදබිමක් ලෙස සඳහන් කිරීමට පුළුවන. මෙවැනි වැදගත් ඓතිහාසික ස්ථාන මතු පරපුර සඳහා ආරක්ෂා කිරීම අප සැමගේ යුතුකම වන්නේය.



හිටි පිළිමය



පියගැටපෙළ



විජය තලවත්තේගෙදර

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER



# දියුණුවට බාධා පමුණුවන කෙලෙස්

සිත විකෘති වන ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඇති වන ''මත් ගතිය ''දිගුකල් නොපවතී. එය හෝරා කිහිපයකින් නැති වී යයි. එයට වඩා ප්‍රබල වූ දෙයක් ලෙස ජාති මදය හෙවත් මනස දැක්විය හැකි බව බුදු දහමෙන් පෙන්වා දී තිබේ. ලෝකයේ වෙසෙන ජනතාව විවිධ ජාතීන්ට වෙන්කර ඇත. සිංහල, දෙමළ, බර්ගර්, මැලේ, ඉංග්‍රිසි, පෘතුගිසි යනාදි වශයෙනි. මෙසේ බෙදා වෙන් කරන ජාතීන් අතර උස්, පහත් වශයෙන් භේදයන්ද පවතී. තමා උසස් ජාතියේ ශ්‍රේෂ්ඨ බව හුවා දක්වමින් අනෙක් ජාතීන් යටහත් කිරීමට උත්සහා දරති. උසස් කුලයක (වංශවත්) උපත ලබා ඇතැයි සිතා අන් අය පහත්කොට සලකනු ලබයි. එවැනි පුද්ගලයින්ට සෙය්‍යමානයද පහත් යැයි පිළිගන්නා අයට හීනමානයද නිරායාසයෙන්ම ඇතිවේ.

මෙවැනි ජාති මදයක් සියුම් උමතු බවත් ඇති කරවයි. ඇතැම් පුද්ගලයින් ජාති මදය නිසා නිර්ධනව සිට ධනය ඇති අය අනුකරණය කිරීමට යෑමෙන් විශාල ණය බරකට ගොදුරු වේ. බුද්ධකාලීන භාරතීය සමාජයේ විසූ බමුණන් ජාති මදයෙන් යුක්ත වූවෝ වෙති. බමුණන් බුදුරාජාණන් වහන්සේගේන්ද ගෞරවය අපේක්ෂා කලහ. ඒ සඳහා බුදුරාජාණන් වහන්සේ වසල සූත්‍රය ඇසුරෙන්

''නජ්ජච්චා වසලො හොති
නජ්ජච්චා හොති බ්‍රාහ්මණො
කම්මනා වසලොහොති
කම්මනා හොති බ්‍රාහ්මණො''

ජාතියෙන් වසලයෙකු හෝ බ්‍රාහ්මණයෙකු නොවන බවත්, සිදු කරනු ලබන ක්‍රියාවන්ට අනුව වසලයෙකු හෝ බ්‍රාහ්මණයෙකු වන බව පෙන්නුම් කෙරේ. බමුණන් විසින් ඉදිරිපත් කරන ලද ''මැවීම් වාදය'' හෙවත් බ්‍රාහ්මණ සංකල්පය බුදුරාජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ සේක. බුද්ධ ශාසනයෙහි සැදැහැවත් ඕනෑම කෙනෙකුට පැවිද්ද ලබාගත හැකි බවත්, විවිධ කුලවලින් පැවිදි වූවත් සසුනට ඇතුල්වීමෙන් පසු එකම ශ්‍රාවක පිරිසක් බවට පත් වෙන බව බුදුදහමෙහි පෙන්වාදී තිබේ. ගංගාවක් වෙන් වශයෙන් ගලා බැස ගියත්, සාගරයට වැටුණු පසු එම ජලය එකම ලවණ රසය ගත් ජලයක් බවට පත්වන්නේ යම්සේද එපරිද්දෙන් යැයි, විස්තරකර තිබේ. ධ්‍යානලාභි මාර්ගඵල ලාභින් බවට පත්වීමට ජාති, කුල, ගෝත්‍ර බාධාවක් නොවන බවත් එය උත්සාහයෙන් ලැබිය හැකි බවත් විස්තර කර දී තිබේ.

නිරෝගිකම නිසා ඇතිවන මත, උඩඟුකම ආරෝග්‍යමද නම් වේ. ලොව උසස් සෑම කෙනෙකුටම විවිධ ශාරීරික අපහසුතාවයන් ඇති වේ. බුදුරාජාණන් වහන්සේගේ ශරීරයද රෝග පීඩාවන්ට ගොදුරු වී තිබේ. ලෝහිත පක්ඛන්දිකා රෝගය අන්තිම කාලයේ දී බුදුරාජාණන් වහන්සේට වැළඳුණි. ශරීරයත් ඇත්නම් රෝගය හටගත්තේය. ''නකුලපිතාට'' බුදුරාජාණන් වහන්සේ වදාළේ ''ආතුරොහය, ගහපති කායෝ'' ශරීරය රෝගයන්ට ගොදුරුවන බවයි. සාගින්නත් රෝගයකි. පිපාසයත් රෝගයකි.

ශරීරයේ නව දොරටුවකින් අප ද්‍රව්‍ය වැගිරෙන්නේ රෝගි බව නිසාමය. ශරීරයන්ගේ නිර්මාණයන්ට අනුව රෝගයන් ඇති වේ. විවිධ ප්‍රතිකාර මගින් රෝගි බව යටපත් කරගෙන සිටිමෙන් ''ආරෝග්‍යමදය'' ඇති වේ. ආරෝග්‍යමදය ඇති වූ විට නූගත් පෘථජ්ජනයා සිතින් කයින් විවිධ පාපි ක්‍රියාවන් සිදු කරනු ලබයි. ''ආරෝග්‍යමද මතෙතාවා භික්ඛවෙ අසසුතවා පෘථජ්ජනො කායෙන දුච්චරිතං චරති'' (අංගුත්තර නිකාය තික නිපාත) ආරෝග්‍යමදයෙන් යුක්ත වූවන් සිතන්නේ රෝගී බව එක් පුද්ගලයෙකුට සිදුවන එකක් ලෙසයි. තමන්ට එබඳු රෝගයක් ඇති නොවන බවයි. බුදුරජාණන් වහන්සේ ''පූතිගත්ත තිස්ස'' තෙරුන් අරභයා දේශනා කෙලේද රෝගී බව සෑම කෙනෙකුටම පොදු වන බවත් එවැනි අවස්ථාවල දී සහයෝගයෙන් ක්‍රියාකර රෝගි තත්වයෙන් මිදිය යුතු බවයි.

මෙම දේශනාවන් මගින් අපේක්ෂා කරනුයේ දුලලභ වූ මිනිසත් බව නිවරැදි ලෙස පවත්වාගෙන යෑමත් දුකින් මිදීමට අවශ්‍යවන මාර්ගයෙන් යෑමට මඟ පෙන්වීමක්ය. (ධර්මග්‍රන්ථ ඇසුරෙන්)

**මතු සබැඳි....**

**විජය තලවත්තේගෙදර**

# පංච සීල පිළිවෙතින් මානව හිමිකම් රැකෙන හැටි

මානව අයිතිවාසිකම් ලෙස සැලකෙන්නේ මිනිසෙකු වශයෙන් උපත ලබාගත් තැනැත්තෙකුට ජන්මයෙන් හිමිවූ නිදහස භුක්ති විඳිමේ ඉඩ ප්‍රස්ථාව සැලසීමයි. බුදු සමයේ මූලිකාංගයක් මෙන්ම ගිහි සමාජයේ නිත්‍ය සීලයක් වූ පංච සීල පිළිවෙත මානව අයිතින් සුරැකිමේ නිවැරිදි මාර්ගයක් වේ. ලෝකයේ මානව අයිතීන් උල්ලංඝණය කෙරෙන විවිධ අවස්ථා හා විවිධ සිදුවීම් ගැන නිරන්තරව අසන්නට ලැබේ. ඒ සියල්ලෙන් මිනිසාට ආරක්‍ෂා වීමට හැකි පහසු මෙන්ම යෝග්‍යය ප්‍රතිපත්ති මාලාව පංච සීලයයි. බුදුරජාණන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදි සීලය හඳුන්වා ඇත්තේ සම්පත්තයක් වශයෙනි. එයින් අදහස් කරන්නේ උදාර මිනිසෙකු වීමට සීලය සම්පතක් වන බවයි. බුදු දහම උගන්වන සෑම ආචාර ධර්මයකම පදනම වන්නේ කරුණාව හා මෛත්‍රියයි. කරුණාව ලෙස සැලකෙන්නේ දුකට පත් සත්වයන් සුවපත් කිරිමේ කැමැත්ත වන අතර මෛත්‍රිය යනු සියලු සත්ව වර්ගයාම සුවපත් වේවා දුකින් මිදේවා යන ප්‍රාර්ථනයයි. මේ හැඟිම් යමෙකු තුළ පවත්නේ නම් ඔහු මානව අයිතිවාසිකම් සුරකින පුද්ගලයෙකු වන අතර අනිවාර්යෙන්ම ඒ තැනැත්තා පන්සිල් රකින කෙනෙකුද වනු ඇත.

'සෑම පුද්ගයෙකුම ජිවත් විමටත් නිදහසේ හැසිරීමටත් පෞද්ගලික ආරක්‍ෂාවටත් හිමිකම් ඇත' යනු මානව අයිතිවාසිකම් සම්බන්ධ විශ්ව ප්‍රකාශනයේ එක් කොටසකි. එහි ප්‍රධානම පරමාර්ථය වන්නේ මිනිස් ජිවිතය පිළිබඳ ආරක්ෂාවයි.

සමස්ථ ලෝකවාසි සත්ව ප්‍රජාවටම නිදහසේ ජිවත්වීමේ උරුමය හිමිකර දෙන වැදගත්ම ශික්ෂා පදය වන්නේ පංච සීලයට ඇතුළත් පළමුවැන්න වන පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන්නයි තමන් තමන්ගේ ජීවිතයට වඩාත් ආශා කරන බව 'අත්තාහි අත්තනො නාතෝ කොහී නාථෝ පරෝසියා' යන බුදු වදනින් පිළිඹිබු වන අතර එසේ තමන් ආශා කරන්නාක් මෙන් අන්‍යයන් ද ඔවුන්ගේ ජීවිතයට ආශා කරන බව සිතා කටයුතු කිරිමට පෙළඹීම මානව අයිතිය තහවුරු කරන්නකි. සෑම අවස්ථාවකම තමා උපමා කොටගෙන වේදනාවට දුකට හා මරණයට තමන් ද අකමැති බව සිතා ගැනීම මේ තත්වය තවදුරටත් තහවුරු වන අවස්ථාවක් වේ. වෙනත් සත්වයකුගේ ජීවිතය තොර කිරීමෙන් වැළකීමට පොරොන්දු වීම පළමු ශික්ෂා පදයෙන්ම සිදුවන අතර එයම මානව අයිතිය පංච සීල පිළිවෙත හා බැඳී ඇති බවට වන සාධකයකි.

දිවි පැවත්මේ අයිතිය මෙන්ම දේපල අයිතිය සම්බන්ධව ද මානව අයිතිවාසිකම් පිළිබඳ වන විශ්ව ප්‍රකාශනයේ ඇතුළත්ව තිබේ. කිසිවෙකු සතු දේපල බලෙන් අහිමි කළ නොහැකිය යනු එහි සඳහන් වගන්තියකි. අනුන් සතු දෑ සොරකම් කිරිම භාණ්ඩය අයිති තැනැත්තාගේ කැමැත්තකින් තොරව තමා සතු කර ගැනිම නොකළ යුතු බව අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන පදයෙන් ප්‍රකාශ වේ. සොරකම යනු තවත් අයෙකුට හිමි දේපලක් අයිතිකරුවාට බලෙන් අහිමි කිරිමකි.

වර්තමාන සමාජයේ සිදුවන බොහෝ අපරාධ ගැටුම් කලකෝලාහල වැනි දෑ කුමන හේතුවක් පදනම් කොටගෙන ඇතිවී දැයි විමසා බලන්නෙකුට පෙනී යන්නේ බොහොමයක් හේතුවලට පදනම් වී ඇත්තේ පංච සීල ප්‍රතිපත්තියේ තෙවන ශික්ෂා පදය වන කාමේසුමිච්ඡාචාරා වේරමණී යන ශික්ෂා පදය ආරක්‍ෂා නොකිරිම බවයි. වැරදි කාම වස්තූන් කෙරෙහි ලොල්වීම මගින් වෙනත් තැනැත්තෙකුට හෝ තැනැත්තියකට මුහුණපෑමට සිදුවන දුෂ්කරතාවය ඔහුගේ හෝ ඇයගේ අයිතිය පැහැර ගැනිමක් වේ.

තමා කැමති කෙනෙක් හා විවාහ වීම ඔහු හෝ ඇය සමග කැමති ප්‍රදේශයක ඔවුනොවුන් රුචිකරන පරිදි ජීවත් වීම මානව හිමිකමකි. කම්සැප විඳීම ගිහි සමාජයට අහිමි වූවක් නොවේ. බුදු දහමින් එයට ඉඩකඩ ලබා දි ඇතත් කාමයෙහි වරදමා හැසිරිම නොකළ යුත්තක් ලෙස දක්වා තිබේ. යම්කිසි පුරුෂයකු හෝ ස්ත්‍රියක විසින් යථෝක්ත වැරදි මග අනුගමනය කරන්නේ නම් ඒ හේතුවෙන් ඔවුන්ගේ පවුල් දිවිය විනාශ වී යයි. ගෙදර දොර සාමය සමගිය



නැතිව යයි. ඒ නිසාම මුලු මහත් සමාජයම නොසන්සුන් තත්වයට පත්වේ. අහිමි කාම වස්තූන් කෙරෙහි ඇලුම් කිරිමෙන් දෙමාපිය දූ දරු සබඳතා හා ස්වාමි භාර්යා සබඳතා කැඩී යාමක් සිදුවන බැවින් එය තවත් පිරිසක් සතුවන මානව අයිතිය අහිමි කිරිමකි. ඕනෑම දරුවෙකුට දෙමාපිය ආදරය සෙනෙහස කරුණාව ලැබීමේ හිමිකම් තිබේ. වැරදි කාම සේවනයට යොමුවීමෙන් අවුල් වියවුල් වී යන පවුල් වලට අයත් දරුවන් හුදකලා බවට පත්වේ.

එබන්දක් සිදු වෙතොත් එයද දරුවන් උපතින්ම උරුම කරගත් හිමිකමක් නොලැබී යාමකි. දරුවන් සතු අයිතිය උදුරා ගැනීමකි.

බොරුකීමෙන් වැලකීම උසස් ගුණ ධර්මයක් මෙන්ම බෞද්ධ පිළිවෙත් අතර වැදගත් තැනක් හිමි කර ගනු ලබන්නකි. බොරු කියන හා බොරු කරන පුද්ගලයන් නිසා සමාජය දූෂිත වේ. මුසා බස් දොඩන්නාට සමාජයේ ගෞරවනිය ස්ථානයක් හිමි නොවේ. ඔහු කිසිවෙකු විශ්වාස නොකරන පිළිකුලට භාජනය වන්නකු වෙයි. බොරුවක් කියන අයෙකු එය කරන්නේ තමා සමඟ ජිවත් වන තවත් කෙනෙකු හා කණ්ඩායමක් මුලාවට පත් කිරිමේ අදහසිනි. යමෙක් සිතාමතාම තවත් කෙනෙකු මුලා කිරීම ඔහුගේ මානව හිමිකම උල්ලංඝණය කිරීමකි.

බුදුරජාණන් වහන්සේ භික්ෂුන් වහන්සේලා වෙනුවෙන් විනය ශික්ෂාවන් පැනවීමේදි තමා සතු නොවන ගුණයක් තමන් වෙත ඇතැයි ප්‍රකාශ කිරීම එසේ ප්‍රදර්ශනය කිරිමට උත්සාහවත් විම භික්ෂූත්වය පවා නැති වී යන වරදක් සේ හඳුන්වා දෙති. සතර පාරාජිකාවන්ගෙන් එය ද එකකි. අප වෙසෙන වත්මන් සමාජයේ නැති ගුණ පෙන්වන ප්‍රසිද්ධියේ මෙබදු දේ ප්‍රකාශ කරන අය බොහෝ සිටිති. බෞද්ධ ඉතිහාසයේ එන ථුල්ලතිස්ස තෙරුන් වහන්සේගේ කතා ප්‍රවෘත්තිය මෙයට හොදම නිදසුනක් වේ. උන්වහන්සේ කළේ තමන් මාර්ගඵලලාභි වයෝවෘද්ධ මහා තෙරණමක් වශයෙන් පෙනී සිටිමින් සෙසු භික්ෂූන් වහන්සේලාගෙන් වැදුම් පිදුම් ගරු බුහුමන් ලැබීමයි. එතැන්හිදි ථුල්ලතිස්ස තෙරුන් කළේ වෙනත් භික්ෂූන් වහන්සේලා සතු මානව හිමිකම් අහිමිකර දැමීමකි. කෙනෙකු ව්‍යාජ සහතික පත්‍ර සකසා ගෙන උසස් රැකියාවක් ලබාගත හොත් ඔහු කරන්නේ සැබැවින්ම එම තත්වයට හිමිකම ඇති අයගේ අවස්ථාව වැරදි ලෙස උදුරා ගැනිමකී. මුසාවාදා වේරමනී සික්ඛාපදං සමාදියාමි යන පොරොන්දුව මනාව ආරක්ෂා කිරිම මානව හිමිකම් රැක ගැනිමක් වශයෙන් පෙන්වා දිය හැකිය. අද ලෝකයම ගිලගෙන ඇති විශේෂයෙන් තරුණ පරපුර විනාශ කරන භයානක රකුසෙකුගේ තත්වයට පත්ව ඇති සුරාව හා වෙනත් මත් ද්‍රව්‍යයන්ගෙන් වැළකීම පංච සීලයට ඇතුළත් ශික්ෂාවකි. බුදුරජාණන් වහන්සේ එබදු ශික්ෂා පදයක් පනවන ලද්දේ සුරාව පුද්ගලයාගේ මදයට හා ප්‍රමාදයට හේතුවන නිසයි.

තමා උපයා ගන්නා මුදල් වැයකර තමාට මත්ද්‍රව්‍යය මත් පැන් පානය කිරිමේ අයිතියක් ඇතැයි කෙනෙකුට තර්ක කළ හැකිය. එහෙත් ඔහුගේ එම ක්‍රියාව නිසා සෙස්සන්ට හිරිහැරයක් දෙජස ඒ මානව හිමිකම් විනාශ කිරිමකි. මත්පැනට ඇබ්බැහි වු ඇතැම් පියවරු නිවසට පැමිණ ඔවුන්ගේ භාර්යාවනට කරන හිරිහැර දරුවන්ට අධ්‍යාපන කටයුතුවලට කරන බාධා හේතුවෙන් ඔවුන්ගේ හිමිකම් නැතිවී යයි. තවත් අවස්ථාවක වාහනයක් පදවන රියදුරෙකු මත්පැන් පානයෙන් මහමඟ යන එන අයගේ ජීවිත වලට තර්ජනයක් කරයි නම් ජීවිත හානියක් කරයි නම් එයද මිනිසාට ඇති නිදහසේ ප්‍රයෝජනයක් නැතිවන මොහොතකි. පොදු වාහනයක හෝ පෞද්ගලික වාහනයක හෝ ප්‍රසිද්ධ ස්ථානයක අවිනීත ලෙස යමෙකු හැසිරෙතැයි සිතමු එයද තමා අවට සිටින්නවුනගේ මානව අයිතියට බාධාවකි.

වර්තමාන ලෝකයේ මානව හිමිකම් සුරුකීම සම්බන්ධ විවිධ සංවිධාන බිහිවෙමින් අහිමිවන අයිතීන් රැක ගැනිමට නානා මාදිලියේ ක්‍රියා මාර්ග යෙදෙන බව පැහැදිලි කාරණයකි. එහෙත් මීට වසර 2551 කට පෙර බුදුරජාණන් වහන්සේ ගිහි සමාජයට නිරන්තරයෙන් ආරක්‍ෂා කිරිම පිණිස දේශනා කොට වදාළ පංච සීල පිළිවෙත ඕනෑම රටක ඕනෑම ජනතාවකට උචිත වන මානව හිමිකම් ආරක්‍ෂා කිරීමේ උසස් ප්‍රතිපත්ති මාලාවක් ලෙස හැඳින්වීම සුදුසුය.

බුදුරජාණන් වහන්සේ උන්වහන්සේ වැඩ විසූ වකවානුවේදි පමණක් නොව අප ජීවත්වන විසි එක්වන සියවසේදි අනාගතයේදි මිනිස් අයිතිය සුරැකෙන ලෙස පංච සීල පිළිවෙත ලොවට හඳුන්වා දුන්හ. මානව හිමිකම් ආරක්‍ෂා කිරිමට වෙර දරන පුද්ගලයින්ට හා සංවිධාන වලට ඒ සසුන පහසුවෙන් ක්‍රියාත්මක කල හැකි සාර්ථක වැඩ පිළිවෙලක් වන්නේ ජනතාව පන්සිල් ආරක්ෂා කිරිමට පෙළඹවීමයි.

**මහේෂ් සේනාධීර**

# දුක්ඛපටිපදා දන්ධාභිඤ්ඤාවෙන් මෛත්‍රී අප්‍රමාණයට



භාග්‍යවතුන් වහන්සේ ධර්මය අවබෝධය සඳහා මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර අප්‍රමාණයන් වැඩිය යුතු බව දේශනා කර ඇත. ඒ සඳහා පටිපදා හතරක් භාවිතා කළ යුතු බව, අඞ්ගුත්තර නිකායේ, චතුක්ක නිපාතයේ එන තතිය පටිපදා සූත්‍රය (බු.ජ.ත්‍රි, අං.නි 2-290 පිටුව) තුළින් පෙන්වා දී ඇත. එම පටිපදා හතර පහතින් දැක්වේ.

1. දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා - දුක් වූ පිළිවෙත් ඇති ලැසි ව ලබන අභිඥා
2. දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා - දුක් වූ පිළිවෙත් ඇති සීඝ්‍ර ව ලබන අභිඥා
3. සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා - සුඛ වූ පිළිවෙත් ඇති ලැසි ව ලබන අභිඥා
4. සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා - සුඛ වූ පිළිවෙත් ඇති සීඝ්‍ර ව ලබන අභිඥා

එයින් දුක්ඛපටිපදා දන්ධාභිඤ්ඤා මෙසේ විස්තර කර ඇත.

"කතමා ච භික්ඛවේ දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා? ඉධභික්ඛවේ භික්ඛූ අසුභානුපස්සී කායේ විහරති, ආහාරේ පටික්කූලසඤ්ඤී, සබ්බලෝකේ අනභිරතසඤ්ඤී, සබ්බසඞ්ඛාරේසු අනිච්චානුපස්සී. මරණසඤ්ඤා ඛෝ පනස්ස අජ්ඣත්තං සුපට්ඨිතා හෝති. සෝ ඉමානි පඤ්ච සේඛබලානි උපනිස්සාය විහරති. සද්ධාබලං, හිරිබලං, ඔත්තප්පබලං, විරියබලං, පඤ්ඤාබලං. තස්සිමානි පඤ්චින්ද්‍රියානි මුදූනි පාතුභවන්ති. සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං. සෝ ඉමේසං පඤ්චන්නං ඉන්ද්‍රියානං මුදුත්තා දන්ධං ආනන්තරියං පාපුණාති ආසවානං ඛයාය. අයං වුච්චති භික්ඛවේ දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා."

"මහණෙනි, දුක් වූ පිළිවෙත් ඇති ලැසි ව ලබන අභිඥා කවර? මහණෙනි, මෙ සස්නෙහි මහණ තමාගේ කයෙහි අසුභානුපස්සී වූයේ, කබලිඞ්කාර ආහාරයේ පටික්කූල සංඥා ඇත්තේ, මුළුලොවෙහි උකටලී සංඥා ඇත්තේ, සියලු සංස්කාරයන් හි අනිත්‍යානුපස්සී වූයේ වෙසේ. ඔහුගේ සිතෙහි මරණ සංඥාව මැනවින් එළඹ සිටියේ වෙයි. හේ ශ්‍රද්ධාබලය, හිරිබලය, ඔත්තප්පබලය, විරියබලය, ප්‍රඥාබලය යන පඤ්ච සේඛබලයන් ඇසුරු කොට වෙසෙයි. ඔහුට ශ්‍රද්ධෙන්ද්‍රිය, වීරියේන්ද්‍රිය, සතීන්ද්‍රිය, සමාධීන්ද්‍රිය, ප්‍රඥේන්ද්‍රිය යන පඤ්චේන්ද්‍රියෝ මෘදුව පහළ වෙති. හේ මේ පඤ්චේන්ද්‍රියන්ගේ මෘදු බැවින් ආසවක්ෂය පිණිස ආනන්තරික මාර්ග සමාධියට ලැසිව පැමිණේ. මහණෙනි, මෙය දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා යී කියනු ලැබේ."

මෙම පටිපදාව අනුව යම් භාවනා කරන අයෙක් කයේ කෙස්, ලොම්, නිය ආදී පිළිකුල් කොටස් තිස්දෙක අනුව භාවනා කරමින් හෝ කනබොන ආහාරයේ පිළිකුල් ස්වභාවය අනුව භාවනා කරමින් හෝ ගිරිමානන්ද සූත්‍රයේ එන සබ්බලෝකේ අනභිරතසංඥා අනුව භාවනා කරමින් හෝ සබ්බසඞ්ඛාරේසු අනිච්චසංඥා අනුව භාවනා කරමින් හෝ නිරතවනවිට, ඔහුට මරණානුස්සතිය මැනවින් වැඩෙන බව පෙන්වා දී ඇත. එහිදී ඔහුගේ ශ්‍රද්ධාබලය ආදී පඤ්ච සේඛ බලයන් ඇතිවී, ශ්‍රද්ධෙන්ද්‍රිය ආදී පඤ්ච ඉන්ද්‍රියන් මෘදුව හෙවත් සියුම්ව පහල වේ. එබැවින් ඔහු කෙලෙස් ආස්‍රව ප්‍රහීන කිරීම සඳහා ලැසිව හෙවත් හෙමෙන් ගමන් කරයි.

මෙහි එන සබ්බලෝකේ අනභිරතසංඥා වැඩීමේදී, තමන්ගේ හිසේ සිට දෙපතුල දක්වා වන පුද්ගල පැවැත්ම හෙවත් රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ලෝකයේ පවතින සියලු සංඥා තෘෂ්ණා, දෘෂ්ටි වශයෙන් උපාදානකර නොගත යුතුය. එනම් සිතට ස්ථාන වන දේ වලින් හෙවත් අධිෂ්ඨාන (සත්‍ය ,ත්‍යාග, ප්‍රාඥා, උපසමාධි) වලින්ද, සංස්කාරවලට ඇති ඇලීම් හෙවත් අභිනිවේසයෙන් ද , සිතේ අභ්‍යන්තරික වශයෙන් අප්‍රකටව පවතින රාගානුසය, පටිගානුසය, අවිද්‍යානුසය ආදී අනුසය ධර්ම වලින් ද සිත අලවා නොගැනීමයි.

මෙහි එන සබ්බසඞ්ඛාරේසු අනිච්චසංඥා වැඩීමේදී, සියලු සංස්කාරයන්හි ඇතිවීම නැතිවීම දකිමින් වාසය කරයි. එහිදී සියලු සංස්කාරයන්, (අට්ටීයති) පීඩා ගෙනදෙන බව, (හරායති) ලැජ්ජාවට පත්වන බව සහ (ජිගුච්ඡති) පිළිකුල් සහගත බව අවබෝධ කරමින් බැහැර කරයි.

මෙම දුක්ඛා පටිපදා දන්ධා භිඤ්ඤාව තුළින් මෛත්‍රී අප්‍රමාණය වැඩිය හැකි බව දේශනා කර ඇත. එය පෙටකොප දේසේ (බු.ජ.පෙ.දෙ.315) දක්වා ඇත.

ඉහත ආකාරයෙන් දුක්ඛා පටිපදා දන්ධා අභිඤ්ඤා වඩන කල්හි, බහුල කරන කල්හි ප්‍රථම ධ්‍යානය සම්පූර්ණ කරයි. මෙම ධ්‍යානය සමථය වැඩීම නිසා ඇති වන්නකි.

මෙම ප්‍රථම ධ්‍යානය වැඩුන විට පළමු සතිපට්ඨානය හෙවත් කායානුපස්සනාව වැඩේ. කායානුපස්සනාව පරිපූරණය වූ විට ප්‍රථම විහාරය හෙවත් දිබ්බ විහාරය සම්පූර්ණය කෙරෙයි. දිබ්බ විහාරය යනු සතර ධ්‍යානයි. මෙය යම් පටිච්ච සමුප්පාදයක් අවබෝධයෙන් ඇති වන්නකි.

දිබ්බ විහාරය පරිපූර්ණ වූ විට ප්‍රථම සම්යක් ප්‍රධාන වීර්ය සම්පූර්ණය කෙරෙයි. එනම් නූපන් ලාමක අකුසල ධර්මයන් හෙවත් කාම විතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක නූපදනා පිණිස කරනු ලබන පළමු වීර්යයි.

ප්‍රථම සම්යක් ප්‍රධාන වීර්ය පරිපූර්ණය වූ විට ප්‍රථම අශ්චය්‍ය අද්භූත ධර්මය හෙවත් දුක්ඛ ආර්ය සත්‍යය පරිපූර්ණය කෙරෙයි.

1.දුක්ඛ ආර්ය සත්‍යය පරිපුරණය වූ විට ප්‍රථම අධිෂ්ඨානය හෙවත් සත්‍යාධිෂ්ඨානය පරිපූර්ණය කෙරෙයි.

2.සත්‍යාධිෂ්ඨානය පරිපූර්ණය වූ විට ඡන්ද සමාධිය ඇතිවේ.

3.ඡන්ද සමාධිය පරිපූර්ණය වූ විට ඉන්ද්‍රිය සංවරය ඇතිවේ.

4.ඉන්ද්‍රිය සංවරය පරිපූර්ණය වූයේ මෛත්‍රී අප්‍රමාණය පරිපූර්ණය කෙරෙයි.

මෙලෙස දුක්ඛාපටිපදා දන්ධාඅභිඤ්ඤා වඩන කල්හි, බහුල කරන කල්හි ප්‍රථම ධ්‍යානය සම්පූර්ණ කරයි. කෙස්, ලොම් ආදිය අසාර, අසුභ වශයෙන් මෙනෙහි කරනවිට විතක්ක විචාර සහිත ප්‍රථම ධ්‍යානය ඇතිවේ. එම චිත්ත සමාධිය පදනම් කරගෙන කායානුපස්සනාව හෙවත් කය අනුව ඇත්ත දකිනවිට, රූපයේ ඇති වීම සහ නැති වීම අවබෝධයෙන් වන දිබ්බ විහාර හෙවත් සතර දැහැන් ඇතිවේ. මෙලෙස සතර දැහැන් පවත්වාගෙන යාමට නම් නැවත කාම විතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක ඇතිවීම වැළැක්වීමට වීර්ය කළ යුතුය. එවිට පළමු සම්යක්ප්‍රධාන වීර්ය සම්පූර්ණ වේ. මෙසේ සිත පිරිසිදු වූ කල්හි ලෝකයේ සිටින සියලු ම සත්වයන් ජාති වී ජරා වී ව්‍යාධි වී මරණයට පත්වන බව අවබෝධ වේ. එනම් එය දුක්ඛ ආර්ය සත්‍යදය යි. මේ අනුව මෙම සත්වයා විඳින දුකට ලෝක ධර්මයන් තුළින් කොතරම් පිළිතුරු සෙව්වත් හරයක් නැති බවත්, ඒවා සියල්ල මුසාවන් බවත්, යම් සත්‍යයක් ඇත්නම් එය ලෝකයෙන් ඉවත්වූ ලෝකෝත්තර නිර්වාණය තුළ පමණක් ඇතිබවත් අවබෝධ වේ (මුසා යං මෝසධම්මං තං සච්චං, යං අමෝසධම්මං නිබ්බානං). එය සිදුවන්නේ සත්‍යාවධිෂ්ඨානය තුළිනි. එබැවින් නොපවතින ලෝකයට ඇති කැමැත්ත නැතිවී, පවතින නිවනට කැමැත්ත ඇතිවේ. එමගින් ඡන්ද සමාධිය ඇතිවේ. මෙම ඡන්ද සමාධිය පැවැත්වීමට අභිජ්ජාව (රූපාදී අරමුණු වලට ඇලීම) සහ දෝමනස්සය (රූපා දී අරමුණු වලට ගැටීම) බාධකයන්ය. එනම් ඡන්ද සමාධිය පැවැත්වීමට නම් ඇස, කණ ආදී ඉන්ද්‍රියන් සංවර කරගත යුතුය. මෙසේ ඉන්ද්‍රිය සංවරය ඇති කරගෙන මෙලෙස ලෝකයෙන් වෙන්ව ලෝකෝත්තර සැපය සියලු සත්වයෝ ලබත්වා! යි මෙත්තාවක් ඇතිවේ. එම මෙත්තාව සියලු සත්වයන්ට වෙනසක් නොකර සිදුකරන්නට හැකිනම් මෙත්තාවෙන් අප්‍රමාණයට ගමන්කළ හැකිය.

සාමාන්‍යයෙන් තමන්ගේ භවය පැවැත්මට උපකාර කරන අයට මෙත්තාව වැඩිය. උදාහරණයක් ලෙස ආයතනයේ ප්‍රධානියාගේ පෞද්ගලික කටයුත්තකට තමා නොවැරදීම සහභාගීවීමත්, ආයතනයේ ලිපිකරුගේ පෞද්ගලික කටයුත්තකට තමා සහභාගී නොවීමත් දැක්විය හැකිය. මෙසේ සිදුවන්නේ තමන්ගේ භවය පැවැත්වීමට ලිපිකරුට වඩා වැඩි උපකාරක් ප්‍රධානියා තමන්ට කරන නිසාය. තමන් මෙත්තා අප්‍රමාණයේදී ප්‍රධානියාත්, ලිපිකරුත් දෙදෙනාම "දුක්විඳින සත්වයන්" බව අවබෝධ කරගෙන කුලයක නොඇලී මෙත්තාව පැවැත්විය යුතුය.

මේ අනුව මෛත්‍රී අප්‍රමාණය සිදුකිරීමට නම්, තමන් ද ලෝකය දුක බව අවබෝධ කරගෙන සියලු සත්වයන් දුක්විඳින සත්වයන් ලෙස සලකා ඔවුන්ට එක හා සමානව මෙත්තාව පැවැත්විය යුතුය. එවිට ඔහුට මෛත්‍රී අප්‍රමාණයට ගමන්කළ හැකිය. මෛත්‍රී අප්‍රමාණය නිවන් දොරටුවකි. සැවොම අවබෝධයෙන් මෙත්තාව වැඩීමට අධිෂ්ඨාන කරගනිමු. සියලු සත්වයෝ සුවපත් වෙත්වා.

පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි

# බුදුරජාණන්වහන්සේ මනෝවිද්‍යාව උපයෝගි කරගත් අවස්ථා

බුදුරජාණන් වහන්සේ නිතරම, තමන් වෙත එළඹෙන අයගේ කායික මානසික අවශ්‍යතා සලසා කටයුතු කළ බව බුද්ධ චරිතයේ සඳහන්සිදුවීම් වලින් පැහැදිලිව පෙනීයයි.

වරෙක තමාගේ නැතිවූ ගොනෙකු සොයා ගිය මහලු බමුණෙක් ඉතා පීඩාවට පැමිණ බුදුරජුන් වෙත ද ගොස් තමාගේ ගොනා ගැන විපරම්කර බැලීය, තොරතුරු ද විමසීය. වෙහෙසට පත්ව කුසගින්නේ උන් බමුණාට පළමුකොට කුසගින්න නිවා ගැනීමට අහරක් සැපයීමට බුදුන් වහන්සේ සැලසූ සේක. බඩගින්න සියලුම රෝග අතුරෙන් දරුණුම රෝගය යැයි වදාරා ඇති බුදුරජාණන් වහන්සේ බමුණාගේ මූලික කායික අවශ්‍යතාවය පළමුකොට සපුරා ඔහු තුළ සුදුසු මානසික තත්වයක් ඇති කොට ඉක්බිත් අවශ්‍ය ධර්මෝපදේශ දුන්සේක.

තවත් වරෙක සිරුර පුරා තුවාල සෑදී ඉතා අසරණව සිටි පූතිගත්තතිස්ස තෙරුන් වහන්සේට බුදුරජාණන් වහන්සේ විසින් දහම් අවවාදයක් කරන ලද්දේ එම තෙරුන් නහවා සිරුරට අවශ්‍ය ප්‍රතිකාර ලබා දී මානසික සැනසිල්ලක් ඇති කිරීමෙන් පසුවය.

මෙසේ කායික අවශ්‍යතා පමණක් නොව ආදරය හා ප්‍රශංසාව ලබාදීම පිළිගනු ලැබීම වැනි මානසික අවශ්‍යතාද සපුරාලීම ඉතා වැදගත් බව නූතන මනෝවිද්‍යාඥයෝ ද පවසති.

සාරමසක් යනතුරු එක ගාථාවක් පාඩම් කරගැනීමට අපොහොසත් වූ සිය බාල සොහොයුරු චුල්ලපන්ථක තෙරණුවෝ මහාපන්තක තෙරුන් විසින් විහාරයෙන් පිටමන් කරන ලදහ. සිය සොහොයුරාගේ දයාව, අනුකම්පාව නොලැබුණු චුල්ලපන්ථක පොඩි හාමුදුරුවෝ සිවුරු හැර ගම යන්නට සිතා ගත්හ. මේ දුටු බුදුරජාණන් වහන්සේ චුල්ල පන්ථක හාමුදුරුවන් වෙත පෙනී සිට ආදරයෙන් හිස අතගා විහාරයට කැඳවාගෙන ගොස් උන්වහන්සේගේ මානසික සුරැකියාව ඇති කොට සුදුසු කමටහන් දුන්හ.

සාරමසකින් ගාථාවක් කටපාඩම් කරගත නොහැකි වූ චුල්ල පන්ථක හාමුදුරුවෝ පැය කීපයකින් රහත් වූහ.

ශිෂ්‍යයාට ගුරුවරයාගෙන් ලැබිය යුතු ආදර කරුණාව දෙමව්පියන්ගෙන් දරුවට ලැබෙන ආදරය හා කරුණාව බඳු විය යුතු බව .මහණෙනි, ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි මේ මාගේ පුතාය යන හැඟීම ඇති කරගත යුතුය. ශිෂ්‍යයා ගුරුවරයා කෙරෙහි මේ මාගේ පියාය යන හැඟීම ඇති කරගත යුතුය යන මහා වග්ගයේ එන ප්‍රකාශයෙන් පැහැදිලි වේ.'

ප්‍රශංසාව, පිළිගැනීම වැනි මානසික අවශ්‍යතා සපිරීමද බුදුන් වහන්සේ උන්වහන්සේගේ ගුරු කාර්‍යයෙහි දී මැනවින් ඉටු කළහ. එක් අවස්ථාවකදී ශාක්‍යයන්ට දහම් දෙසීම ආනන්ද හිමියන්ට පැවරූ බුදුන් වහන්සේ දේශනාව අවසානයේ ආනන්දය, ඔබ බොහොම හොඳට බණ කීවෙහිය යනුවෙන් ප්‍රශංසා කළහ.

තවත් වරෙක නන්දක හාමුදුරුවන් ධර්මශාලාවෙහි බණ දේශනා කරන අවස්ථාවක බුදුන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි දොරටුව ළඟට විත්, ධර්ම ශාලාවට ඇතුල් නොවී , බණ අවසන් වනතුරුම දොර ළඟ සිටි පියෙහි ම සිට ගෝලයාගේ ධර්මය අසා සාදුකාර දුන්නහ. මෙබඳු අවස්ථා එමටය. ශිෂ්‍යා තම හිතවතුනට හඳුන්වාදීම ගුරුවරයාගේ යුතුකමක් බව බුදුරජාණන් වහන්සේගේ සිඟාලෝවාද සූත්‍රයේ දී පෙන්වා දී ඇත. මේ සියල්ල ශිෂ්‍යයා තුළ ප්‍රශංසාව හා පිළිගැනීම ලැබීමට ඇති කැමැත්ත වැනි මානසික අවශ්‍යතා සපුරාලීම නොවෙදරැ

යම් යම් චිත්තවේගී ස්වභාවයන්ට ගොදුරුවූ පුද්ගලයන් සමඟ බුදුරජාණන් වහන්සේ කටයුතු කළ ආකාරයද මනෝවිlත්මක වූ බව පෙනේ.

වරෙක සිය එකම පුතු මළ විට අධික ශෝකයට පත් කිසා ගෝතමිය බුදුරදුන් වෙත පැමිණ සිය මළ පුතුට බෙහෙත් ඉල්ලා සිටියාය. බුදුරජාණන් වහන්සේ ඇය හාස්‍යට හෝ නිග්‍රහයට ලක් නොකළා පමණක් නොව, ඇත්ත ඇති සැටියට තේරුම් ගැනීමට තරම් සුදුසු මානසික තත්වයක ඇය නොමැති බව පැහැදිලිව තේරුම් ගෙන ඇයට සත්‍ය තේරුම් ගැනීමට සලස්වන අදහසින් ඇයගේ මළ පුතුට බෙහෙත් සඳහා කිසිවෙකු නොමළ ගෙයකින් අබ ස්වල්පයක් ගෙනෙන ලෙස දන්වා සිටි සේක. ඇයගේ ආදරණීය පුතුගේ දිවි ලබාගැනීම සඳහා බලාපොරොත්තුවක් ලද ඇය, කිසිවකු නොමළ ගෙයකින් අබ සොයා ඇවිද එබඳු අබ නොලද හැකි බව තේරුම් ගෙන මළ පුතු සොහොනකට දමා නැවත බුදුරජුන් වෙත පැමිණියේ ජීවිතය පිළිබඳ බොහෝ කරුණු අවබෝධ කරගැනීමෙනි. බුදුරජාණන් වහන්සේ කිසා ගෝතමී වෙත දෙන ලද මේ පැවරුම මනෝ විද්‍යාත්මක පදනමක් මත ගොඩනැගුණකි.



අහංකාරකමින් පිරුණු, කේන්තියෙන් දැවෙමින් සිට ආලවකයන් බුදුරජුන් විසින් දමනය කරන ලද්දේ පළමුවෙන් ඔහුගේ ඉච්ඡාවට අනුව හැසිරීමෙනි. බුදුරජාණන් වහන්සේගේ නිහතමානී හැසිරීමෙන් ආලවකට පියවි සිහිය පහළ විය.

පුද්ගලයන්ගේ චරිත බලා සුදුසු පැවරුමක් හෝ කමටහනක් දීම බුදුන්ගේ සිරිත විය.රාග චරිතයක් ඇති උවසුවකුට පංචස්කන්ධයෙහි නිරුස බව පෙන්වන අරමුණක් මුල් කරගෙන භාවනාවේ යෙදීමට සැළැස්වීම උදාහරණයකි. මිනිස් සිතේ ඇති සමහර ස්වභාවයන් බුදුරජාණන් වහන්සේ තම ඉගැන්වීමේ කාර්‍යයන් සඳහා ප්‍රයෝජනයට ගත්හ.

.මහණෙනි, ගැහැණියකගේ රූපය තරම් පිරිමියෙකුගේ සිත් ඇඳගන්නා තවත් දෙයක් මම නොදකිමි. යනුවෙන් ප්‍රකාශ කළ උන්වහන්සේ විරුද්ධ ලිංගිකයන් කෙරේ ඇදී යන මිනිස් සිතේ ඇති රාගනිශ්‍රිතභාවය උදව්කර ගනිමින් වරක් සසුනේ උකටලී ව උන් නන්ද හාමුදුරුවන්ට සුරඟනන් පෙන්වා සසුනෙහි රඳවා ගත්හ. සුරඟනන් ලැබීමේ අටියෙන් බවුන් වැඩූ නන්ද තෙරණුවෝ ස්වල්ප කාලයකින් සත්‍ය අවබෝධ කළහ. මෙය එක් අතෙකින් බුදුන් වහන්සේ අභිප්‍රේරනය හෙවත් පෙළඹවීම පාවිච්චි කළ අවස්ථාවකට උදාහරණයකි.

කෙළින්ම මනසෙහි ග්‍රහණය කිරීමට දුෂ්කර තැන දී ඉන්ද්‍රිය අත්දැකීම් පළමුකොට ලබා දීමෙන් තේරුම් ගැනීම පහසු කිරීමට හැකිය යන මනෝවිද්‍යාත්මක මූල ධර්මය උන්වහන්සේ නොයෙක් විට ක්‍රියාත්මක කළහ.

වරක් බුදුරජාණන් වහන්සේ කොළ මිටක් කඩාගෙන භික්ෂූන් වෙත පෙන්වා .මහණෙනි, මේ මගේ අතේ තිබෙන කොළද වැඩි,නැතිනම් මේ වනයේ ගස්වල තිබෙන කෙළ ද වැඩි . යනුවෙන් ප්‍රශ්න කළහ. .ස්වාමීනී, වනයෙහි ගස්වල කොළ ඉතා වැඩිය.යි භික්ෂූන් වහන්සේ උත්තර දුන්හ. .එසේ ම මහණෙනි මා අවබෝධ කොට දේශනා කළ ධර්මය අතේ තිබෙන කොළ මෙන්ම ස්වල්පයයි, අවබෝධ කොට දේශනා නොකළ ධර්මය වනයෙහි ඇති කෙළ මෙන් ඉතා විශාල ප්‍රමාණයකි. යනුවෙන් වදාළහ.

මෙසේ ම නිය පිටට පස් බිඳක් රැගෙන පෙන්වා, උන්වහන්සේ භික්ෂූන් අමතා කළ කථාවක් නඛසිඛා සූත්‍රයේ සඳහන් වෙයි.

ප්‍රස්තුතයට උචිත අන්දමින් දෘශ්‍යාධාර භාවිතයෙහි බුදුන් වහන්සේ සමත් වූහ. රූප මදයෙන් මත් වූ ඛේමා බිසව .බුදුන් රූපයට ගරහති. යි බුදුරජුන් දැකීමට පවා යාමට මැලි වූවාය. ඇගේ මේ සිත දැන සිටි බුදුහු ඇය දෙව්රමට පැමිණි අවස්ථාවක ඇයට වඩා ලස්සන කාන්තාවක් මවා තමන් වහන්සේට පවන් සැලීමට සැලැස් වූහ. .බුදුරදුන් ලස්සන කාන්තාවන්ට නිග්‍රහ කරති.යි යන්න බොරුවක් යයි සිත හදාගත් ඛේමා බිසව බලා සිටියදීම මේ මවන ලද ශෝභන කාන්තාව ක්‍රමයෙන් වයසට පැමිණ, මහලු වී අබලන් ව බිම ඇද වැටීමට සලස්වන ලදී. රූපයේ අනිත්‍යභාවය අවබෝධ කළ ඛේමා සසුන්ගත වූවාය.


පුද්ගලයෝ අදහස් වලින් විවිධය. (නානත්ථ කායෝ නානත්ථ සංඥා) යන අදහස ප්‍රකාශ කළ බුදුරජාණන් වහන්සේ පුද්ගල විවිධත්වය පිළිගෙන අවස්ථාවට හා ප්‍රස්තුතයට ගැළපෙන පරිදි මනෝවිද්‍යානුකූලව සිය ඉගැන්වීම් සකස් කරගත් බැවින් උන්වහන්සේගේ දෙසුම් ඇසූ ශ්‍රාවකයෝ ඒවා අවසානයේ උන්වහන්සේට මුව නොසැහෙන සේ ස්තූති කළහ.

.මැනව , ස්වාමීනි, යටිකුරු කරන ලද්දක් උඩුකුරු කළා සේ, මං මුලාවූවෙකුට මඟ හෙළි කළා සේ ඇස් ඇත්තන් රූප දකිත්වායි අන්ධකාරයට ආලෝකයක් සැපවුවා සේ ඔබවහන්සේ මැනවින්, නොයෙක් අයුරින් දේශනා කළා ස්වාමීනි. වැනි සූත්‍රාන්ත පාඨවලින් මේ බව ප්‍රකට වේ.

නූතන මනෝවිද්‍යාවේ ප්‍රබෝධය යුරෝපාදී රටවල ඇති වූයේ 19 වන සියවසෙන් පසුවය. එහෙත් මීට ශතවර්ෂ 25කට පෙරත් අද අප නවීන යැයි සලකන බොහෝ මනෝවිද්‍යාත්මක අදහස් බුදුරජාණන් වහන්සේ සිය ඉගැන්වීම් කටයුතුවල දී භාවිත කළ බව ඔබට පැහැදිලි වෙනවා ඇත.

**පොතපත ඇසුරින්**

# උදාවෙන අලුත් අවුරුද්දේ උට්ඨාන වීයයීයෙන් කටයුතු කිරීමට අධිෂ්ඨාන කරගනිමු



2022 ජනවාරි පළමුවනදට වසරක් ගෙවී නව වසරක් උදාවනු ඇත. එහිදී නව සිතුම් පැතුම් හා නව ක්‍රියාකලාප ඔස්සේ වැඩ කිරීමට නොයෙන් දෙනා සිතා සිටිති. 2021 වර්ෂය තුළ සිදු වූ වැරදි අඩුපාඩු සකසාගෙන තම අරමණු කරායන්නට රටවැසියාට හැකියාවක් ඇත්තේ උත්සාහය තුළිනි. අද අප අතර ක්‍රමක්‍රමයෙන් නැති වී යන උට්ඨානවීයයී අපි නැවත දියුණු තියුණු කරගෙන උදාවෙන මෙම නව වසර තුළ සියළු අභියෝග ජයගන්නට සිතා ගැනීම ඉතා වැදගත් වේ.

උට්ඨානවීයයී ඕනෑම පුද්ගලයෙක් තුළ තිබිය යුතු දියුණුවීමේ ලක්‍ෂණයකි. එය ඇත්නම් කළ නොහැකි දෙයක් නැති තරම්ය. ගොවිතැන, වෙළදම, ගවපාලනය, දුනු ශිල්පය, රාජ්‍ය සේවාව ආදියට දක්‍ෂවීම ඒ කෙරෙහි අනලස්වීම, උපායෙන් හා විමසීමෙන් යුක්තවීම සුදුසු කළ ඒ කායයීයන් සම්බන්ධව කටයුතු කිරීම උට්ඨානවීයයී නම් වේ. රටක නායකයෙක් වේවා, ගොවියෙක් වේවා, භික්‍ෂුවක් වේවා, වෙළෙන්දෙක් වේවා, ගෘහාධිපතියෙක් වේවා, ඕනෑම තරාතිරකම වේවා උට්ඨානවීයයී පැවතිය යුතුය. නැත්නම් රටක, සමාජයක, ගමක, නිවසක දියුණුවක් අභිවෘද්ධියක් ළඟාකරගත නොහැකිය. අද ලෝකය ගත්තත් එම නාටකයාගේ උත්සහය නිසා දියුණු වූ රටවල් බොහෝ ගණනාවක් ඇත. ජපානය, සිංගප්පූරුව, මැලේසියාව, තායිවානය වැනි රටවල් ඒ අතර සුවිශේෂි වේ. මී මැස්සන් සේ, වේයන් සේ උත්සහය ඇති කරගැනීම දියුණුවීමේ මාර්ගයයි. කම්මැලිකම, අලසකම ජීවිතයක් තුළ තිබුනොත් සැමදා පිරිහීමට ලක්වේ. එවැනි අලස අය තුළ නිතරම පවතින ගති ලක්‍ෂණ 06ක් සිඟාලෝවාද සූත්‍රය තුළ පෙන්වා දී ඇත. එනම්,

01. දැන් ඉතා සීතලය 02. දැන් ඉතා උෂ්ණය
03. දැන් ඉතා සවසය 04. දැන් ඉතා උදේය
05. දැන් බඩගිනිය 06.දැන් බඩ පිරිලාය

යනාදි වශයෙනි.

මෙවැනි ගති ලක්‍ෂණ තිබුනොත් කවදාවත් දියුණුවීමට පුළුවන්කමක් නැත. එනිසා එවැනි අලසකම් නැති කරගත යුතුය. අපේ රටේ ඉතිහාසය ගත් කළ එදා පැරැන්නන් තුළ උත්සාහය උපරිම වශයෙන් තිබූ බව ඔවුන් කළ කී දේ තුළින් වටහාගත හැකිය. ආගමික වශයෙන් ගත්තත්, ආර්ථික වශයෙන් ගත්තත්, දේශපාලනික සංස්කෘතික යන මොන අංශයෙන් ගත්තත් එහි දියුණුව අද පවා දැකගත හැකිය. කෘෂිකර්මාන්තයේදී දෑත දෙපය මහන්සි වී ලබාගත් අස්වැන්න වෙනත් රටවලටද යැවූ බව සඳහන් වේ. අක්කර දහස් ගණන් බීජ වැපිරීම සඳහා විශාල වැව්, ඇළ, වේලි හා ජලනල පද්ධති නිර්මාණය කිරීමෙන් කෘෂිකර්මාන්තය දියුණු වී රටේ ආර්ථික ස්වංපෝෂිත වූ එවුනට ආගමික සහනශීලීතාවය ඇති කරගැනීම සඳහා විශාල වෙහෙර විහාර, ස්ථූප නිර්මාණය වූයේද, උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි. උදයට උදැල්ල රැගෙන කුඹුරට යන ගොවියා යළිත් නිවසට පැමිණෙන්නේ සවසටය. ඒ තරමට පැරැන්නන් තුළ කම්මැලිකමක් නොතිබුණි. වී ප්‍රධාන භෝගය වූවත් ඊට අමතරව විවේක වෙලාවට අල, බතල, මඤ්ඤොක්කා වැවීමටද, එයින් ප්‍රයෝජනය ගැනීමටද පැරැන්නන් උත්සුක විය. අද කාලයේ තරුණ පිරිසට එය ආදර්ශයට ගෙන දියුණු විය හැකිය.

බුද්ධ චරිතය තුළින්ද අපට උට්ඨාන වීයයීයේ ඇති අගය වටිනාකම මනාව පිළිබිඹු වේ. උන්වහන්සේ දස පාරමිතා අතර වීයයී පාරමිතාවක් හැටියට සසරේ පුරන ලද්දේ මෙම උත්සාහයයි. ඒ අනුව උන්වහන්සේ නොයෙක් ආත්මවල ඇස්, ඉස්, මස්, ලේ පමණක් නොව අඹුදරුවන් පවා දන් දුන් සේක. උන්වහන්සේට දීපංකර පාදමූලයෙහි දී නිවන් දැකීමේ වරප්‍රසාදය තිබුණත් එසේ නොකොට ප්‍රාර්ථනා කළේ,

''බුද්ධෝ හං බෝධ ඉස්සාමි
මුත්තෝ හං මෝචයේ පරේ
තිණ්ණෝ හං තාර ඉස්සාමි
සංසා රෝග මහබ්බයා''

තමන් සසරින් මිදී අන්‍යයාද මුදවීමේ හා සසරින් එතෙර වී අන්‍යයාද සසරින් එතෙර කරවීමේ පරම පවිත්‍ර චේතනාව උට්ඨාන වීයයීයත් සමග උන්වහන්සේ තුළ තිබුණි. සිදුහත් බෝසත් සමය තුළ සියලු සැප හැර පියා උට්ඨානයෙන් බණ භාවනාකර ලද ජයග්‍රහනය ලෙස නිවන් සැපත හැඳින්විය හැකිය. එම උතුම් චරිතය තුළින් ඕනෑම කෙනෙකුට ආදර්ශයක් ගෙන අභියෝග ජයගැනීම සඳහා එය පිටුවහලක් කරගත හැකිය.


''චුල්ල සෙට්ටි ජාතකය'' ආදර්ශයට ගත්තත් කෙනෙකුට දියුණුවීමට බැරිකමක් නැත. එහි සඳහන් වන්නේ මී කුණක් උපයෝගී කරගෙන තරුණයෙක් ක්‍රමක්‍රමයෙන් දියුණු වූ ආකාරයයි. බුදු දහම තුළ නිතරම පෙන්වා දෙන්නේ නිවැරදි කායකර්මාදිය තුළින් මෙලොව සැප ලබාගන්නා ආකාරයයි. එය ඉද්දිපාදයක් හැටියට "සම්මා වායාම" යනුවෙන් ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ වැඩිය යුතු බව පෙන්වා දී ඇත. වර්තමානයට අවශ්‍යම දෙයක් හැටියට උත්සහය නොහොත් වීයයී පෙන්වාදිය හැකි අතර එය පළමුවෙන්ම මනසේ ධෛයයීය වශයෙන් ඇති කරගත යුතු අතර පසුව එය ක්‍රියාවට නැංවීමේදී නොපසුබස්නා වීයයීය ඇති කරගත යුතුය. එය කුඩා දරුවාගේ පටන් වැඩිමහල්ලා දක්වා රටක, සමාජයක, ගෙදරක තිබිය යුතු ලක්‍ෂණයක් ලෙස පෙන්වා දිය හැකිය.

''ලෞකික මෙන්ම ලෝකෝත්තර සැපත පිණිස කරන කුසල් කර්මාදිය සඳහාද උත්සහය අවශ්‍යය. සිතෙහි පවතින ලෝභ, ද්වේශ, මෝහ වැනි අකුසල, සිතුවිලි යටපත් කරගෙන කුසල් කිරීමටත් එවැනි අකුසල් සහමුලින් උපුටා දමා නිවන් සැපත ලඟාකර ගැනීමටත් උත්සාහය අවශ්‍යය.'' ඒ නිසාම බුදු පසේබුදු මහරහතන් වහන්සේලා තුළ පැවති උන්වහන්සේලා විසින් අගය කොට වදාළ ශ්‍රේෂ්ඨ ගුණ ධර්මයක් වන උට්ඨාන වීයයී රටක ජීවත්වන සෑම කෙනෙකු තුළම පැවතිය යුත්තකි. කටයුතු සාර්ථක කරගැනීමට අනාගතය සැපවත් කරගැනීමට කැමති සෑම කෙනෙක්ම උත්සාහය ඇති කර ගත යුතුය. ආගම්,ජාති, කුල,මල තුළ සිරනොවී එකම රටක පුරවැසියන් හැටියට අපි සෑම දෙනෙක්ම එකතු වී සමගියෙන් සහයෝගයෙන් රට දියුණු කිරීමටත් අපගේ දියුණුව ඇති කරගැනීමටත් උත්සහයෙන් සියලු කටයුතු කරගෙන යාමට උදාවන අලුත් අවුරුද්ද තුළ ප්‍රාර්ථනාවක් වශයෙන් තබාගනිමු.

.

කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවෙනේ
ගලගෙදර රතනවංශ හිමි

# බෞද්ධ සමාජයම සිව්වනක් පිරිසකි.



ක්‍රි.පූ.06 වන සියවසේ පැවැති බ්‍රාහ්මණ ඉගැන්වීම් වලට අනුව මුළු මහත් සමාජයම වර්න භේදය මතුවන ආකාරයෙන් ක්‍ෂත්‍රිය,බ්‍රාහ්මණ, වෛශ්‍ය, ක්‍ෂුද්‍ර යනුවෙන් කොටස් 04කට බෙදා දක්වා ඇති බව අපි දනිමු. එහෙත් බුදුරජානන් වහන්සේ දක්වා ඇත්තේ ''චත්තාරො වණ්ණා සම සමා හොන්ති'' යනුවෙන් උස්, පහත් භේදයෙන් තොරව සමාන බව වදාළා ඇති බවයි. සියලු මනුස්ස වර්‍ගයාම එකම පිරිසක් බව බෞද්ධ ඉගැන්වීමයි. සමස්ත බෞද්ධ සමාජයම කොටස් 04කට බෙදා දක්වමින් ඒ බව මනාව පැහැදිලිකර ඇත. එනම්, බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්ම මාර්ගය අනුගමනය කරන සිව්වනක් පිරිසයි. සිව්වනක් පිරිස මුළු මහත් බෞද්ධ සමාජයම අර්ථවත් කරයි.

**භික්‍ෂු සමාජය, භික්‍ෂුණී සමාජය, උපාසක සමාජය, උපාසිකා සමාජය** වශයෙනි.

මෙම පිරිස් අතරින් භික්‍ෂු,භික්‍ෂුණී දෙපිරිසම ගිහි සමාජ ජීවිතයෙන් බැහැරව පරමනිෂ්ටාව සඳහා මුළු මහත් ජීවිතයම ඇප කැප වී ක්‍රියා කරන පිරිසයි. එම පිරිස විමුක්ති මාර්‍ගයේ ගමන් කළත් උපාසක, උපාසිකා දෙපිරිසම ප්‍රතිපත්ති අනුගමනය කරන ධර්මික වූ ලෞකික සැප සම්පත් විඳිමින් මෙම ජීවිතය ගත කරන පිරිසයි. ඉහතින් දැක් වූ සිවුවනක් පිරිසම ගිහි සමාජය පැවිදි සමාජය යනුවෙන් දැක්විය හැකිය. බුදුරජාණන් වහන්සේ වැඩසිටින කාලයේ භික්‍ෂු සංස්ථාවට සම්බන්ධ වූ සියලුදෙනාම ඒකාන්තයෙන්ම ගිහි ජීවිතය පිළිබඳව කලකිරී දුක් දුරු කර ගන්නා පිණිසම පැමිණි පිරිසක් ආරම්භයේදීම පස්වග මහණුන්ගෙන් පටන්ගෙන ඉතා කෙටි කලකින් විශාල සංඝ සංස්ථාවක් බවට පත් වූයේ එම නිසාය.

''අපපසණනානංවා පසදය
පසණනානංවා භියෙයාභාවාය''

යන මේ පාඨයට අනුව භික්‍ෂු, භික්‍ෂුණී දෙපිරිසම තම තමන්ගේ ජීවිත සකස් කරගත යුතුවන්නේ නොපැහැදුනු වුන්ගේ පැහැදීම සඳහාත් පැහැදුනු වුන්ගේ පැහැදීම වැඩිවීම සඳහාය. ඒ අනුව තම ජීවිතය සකස් කරගත යුතුය.

1.භික්‍ෂුව පිළිබඳව විග්‍රහ කීපයක්ම දැක්විය හැකිය. ඡින්න භින්න පටධාරෙති භික්ඛු - වටිනාකමකින් අඩු වූ සුන්බුන් වස්ත්‍ර දරන්නේ භික්‍ෂුවයි.

2.භික්ඛතීති භික්ඛු - පිඩුසිඟා යැපෙන නිසා භික්‍ෂුවයි.

3.භද්‍රො භික්ඛු - ශිලාදියෙන් යහපත් වූ නිසා භික්‍ෂුවයි.

4.සාරො භික්ඛු - ශීලාදියෙන් සාර වූ නිසා භික්‍ෂුවයි.

5.අග්‍රෙගා භික්ඛු - ශීලාදියෙන් උසස් වූ නිසා භික්‍ෂුවයි.

6.සංසාරෙ භයං ඉක්ඛතීති භික්ඛු - සංසාර භය දුරු කරන නිසා භික්‍ෂුවයි.

ඉහත් කී නිර්වචනවලට අනුව විග්‍රහකර ඇති කරුණු වලින් භික්‍ෂුව යනු කුමන ආකාරයක කෙනෙක් දැයි මනාව වටහා ගත හැකිය.අවම අවශ්‍යතා මත භික්‍ෂු ජිවිතය පවත්වාගෙන යාමද එම භික්‍ෂු ජීවිතයේ පවතින සුවිශේෂ වූ ලක්‍ෂණයකි.සියලු දුක් දුරුකිරීම සඳහාත් බ්‍රහ්ම චරියාවේ හැසිරීම සඳහා පැවිදි උපසම්පදාව ලබාදී තිබේ. පැවිද්දෙහි මූලික පරමාර්ථ 04කි.

1.පාංශුකූල චීවර නිසසාය පබ්බජ්ජා - පාංශකූල සිවුරු නිසා පැවිද්ද පවතී.

2.පිණ්ඩියා ලෝපභෙජනං නිසසාය පබ්බජ්ජා - පිණ්ඩපාත ආහාර නිසා පැවිද්ද පවතී.

3.රුක්ඛ මූල සේනාසනං නිසසාය පබ්බජ්ජා - රුක් මුල් සෙනසුන් නිසා පැවිද්ද පවතී.

4.පූතිමුත්ත භෙසජ්ජං නිසසාය පබ්බජ්ජා - ගව මූත්‍ර බෙහෙත් නිසා පැවිද්ද පවතී.

මෙම කරුණු 04න් භික්‍ෂුව තෘප්තිමත් විය යුතු බව පෙන්වා දෙයි.

පැවිද්ද සාමණේරසීලය, උපසම්පදා සීලය යනුවෙන් යුක්ත වන අතර පූර්ණ පැවිද්දෙකු වීමට සතර සංවර සීලයෙන් යුක්ත විය යුතුය. එනම්, ප්‍රාමෝක්‍ෂ සංවර සීලය, ඉන්ද්‍රිය සංවර සීලය, ආජීව පාරිශුද්ධි සීලය, ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය යනුවෙනි.

සිව්වනක් පිරිසෙහි දෙවන පිරිස වන්නේ භික්‍ෂුණීන් වහන්සේලායි.බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව කාන්තාවන්ට ආගමික නිදහසක් නොලැබුණි. ජාතික හෝ ආගමික නිදහසක් අහිමි වූ පිරිසක් ලෙසද කාන්තාව අපිරිසිදු වූ, චපල වූ, බුද්ධියෙන් තොර වූ මහ අවා සනාවන්ත තැනැ ත්තියක් ලෙසට කාන් තාව හඳුන්වා දී ඇත.එහෙත් බුදුරජාණන් වහන්සේ ආන න්ද හිමියන්ගේ ආරා ධනාව පරිදි බුදුධ ත්වයෙන් පස්වන මස විශාලා මහනුවරදී මහා ප්‍රජාපතී ගෝතමී භික්‍ෂු ණීන්ට පැවිද්ද ප්‍රධානය කළ හ. එදා සිට සමාජයේ විවිධ වූ අවස්ථාවලදී නොයෙක් තරාතිරම්වල කාන් තාවන් භික්‍ෂුණී ශාස නයට ඇතුළත් වී ආධ්‍යාත්මික අංශ දියුණු කරගෙන ඓහලෞකික සුවය හා පාරලෞකික සුවය ලබාගත්හ.

ක්‍රි.ව.03වන සියවසේදී මිහිඳුමහ රහතන් වහන්සේගේ උපදෙස්වලට අනුව දේවානම් පියතිස්ස මහරජතුමා විසින් දඹදිවට දූත පිරිසක් යවන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංඝමිත්තා මහරහත් ප්‍රධාන භික්‍ෂුණීන් වහන්සේලා ජය ශ්‍රීමහා බෝධි අංකුරයක් සමඟ ශ්‍රී ලංකාවට වැඩම කළහ. එවකට සකෘද්‍රාගාමි ඵලයට පත්ව සිටි අනුලා බිසව ඇතුළු රාජකීය කාන්තාවන් 500ක් පැවිදි උපසම්පදා කිරීමෙන් ශ්‍රී ලංකාවේ භික්‍ෂුණී ශාසනය පිහිටුවීය. ශ්‍රී ලංකාවාසී කාන්තාවන්ට විමුක්ති මාර්ගය උදාකළ පොහොය දිනයක් වශයෙන් වැදගත් වන්නේද උඳුවප් පෝයයි. ලංකාවාසී කාන්තාවන්ගේ විමුක්ති මාර්ගය පසක් වූයේද අනුලා දේවිය ඇතුළු කාන්තාවන්ගේ විමුක්ති මාර්ගය උදාවූයේද සංඝමිත්තා මෙහෙණින් වහන්සේගේ පැමිණීම නිසයි. ඉතාම කෙටි කාලයකින් භික්‍ෂුණී සංඛ්‍යාව ව්‍යාප්ත විය.දුටුගැමුණු මහරජතුමාගේ මිරිසවැටි පූජෝත්සවයට භික්‍ෂුණීන් වහන්සේලා 90000ක් සැපත් වූ බව වංශකතාවල දැක්වේ.

කාලයාගේ ඇවෑමෙන් කුමන හේතුවක් නිසාහෝ එම භික්‍ෂුණී සමාජය අතුරුදහන් විම ඛේදනීය වූ තතත්වයකි.එය කුමක් වුවත් අදවන විට ශ්‍රී ලංකාවේ දෙවනිවරටත් රංගිරි දඹුලු මහා විහාරය ප්‍රධාන කොටගෙන රජගිරි ශ්‍රී ලංකා මාධ්‍යජාලයේ නිර්මාතෘ අතිගෞරවණීය ඉනාමළුවේ ශ්‍රී සුමංගල නායක් ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ප්‍රමුඛ මහාසංඝ සභාව නැවතත් භික්‍ෂුණී ශාසනය පිහිටුවීමට මූලිකත්වය ගෙන ක්‍රියා කිරීම අතිශයින්ම වැදගත් පියවරකි. භික්‍ෂුණී ශාසනය සුරක්ෂිත කරවීම ඉතා උතුම් ක්‍රියාවකි.

ථේරවාදී පිළිගැනීමට අනුව උභතෝ සංඝයාගෙන් භික්‍ෂුණීන් උපසම්පදාව ලැබිය යුතුය. ඒ අනුව උපසම්පදාව ලත් භික්‍ෂුණීන් වහන්සේලා සහ ධර්මධර, විනයධර ත්‍රෛයිනිකායික භික්‍ෂු මහා සංඝයා වහන්සේලා හා උපාසක, උපාසිකාවන්ගේද සහභාගීව 1998 මාර්තු 12වන දිනට යෙදුණු මැදින් පුරපසළොස්වක පෝය දින පුහුණුව ලැබූ සාමණේර වහන්සේලා විනයානුකූලව උභතෝ සංඝයා විසින් උපසම්පදා සීලයෙහි පිහිටවනු ලැබීය.

එමගින් දෙවනිවරට ශ්‍රී ලංකාවේ භික්‍ෂුණී ශාසනය පිහිටවනු ලැබීය. එම සිව්වනක් පිරිසම ශක්තිමත් වීමකි.එම නිසා සම්බුද්ධ ශාසනය ශ්‍රී ලංකාවේ චිරස්ථායි වනු ඇතැයි ලංකාවාසී අපගේ හැඟීමයි. මුළු දිවයින පුරා පමණක් නොව මුළු ලෝකය පුරාම විහිදී සිටින භික්‍ෂුණීන් වහන්සේලා දහස්ගණනක් නිස්සරණාධ්‍යාසයෙන් සිදුකරනු ලබන ශාසනික, සාමාජික මෙහෙවර පිළිබඳව සැලකීමේදී එය චිරාත්කාලයක් සසුනේ පැවැත්ම සඳහා හේතුවන බව දැක්විය හැකිය.එබැවින් මෙවැනි අවස්ථාවේදී උගත් ධර්මධර, විනයධර සංඝයා වහන්සේලාගේ පරම යුතුකම වන්නේ භික්‍ෂුණීන් වහන්සේලාට අවවාද අනුශාසනා කරමින් උතුම් ශාසනික වූ සේවාවන් යෙදවීම සඳහා ආශිර්වාදය ලබාදීමයි.

බෞද්ධ ශාසන අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධානම කාර්ය යභාරය විය යුතුවන්නේ බුදුධ ශාසනයේ චිරස්ථිතිය සඳහාත්, සිව්වනක් පිරිසෙහි අභිවෘද්ධිය සඳහා අවශ්‍ය කරන කටයුතු රාජ්‍ය ගෞරවය ලැබෙන ආකාරයට සහයෝග දැක්වීමයි.

උපාසක, උපාසිකා යන්නෙහි අදහස් වන්නේ බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන්ට සමීප තැනැත්තා හෝ තැනැත්තිය යනුවෙනි. ''රතනත්තයං උපාසතිති උපාසිකා'' යන්නෙන් ඒ බව මනාව පැහැදිලි වේ. ගිහි සමාජයේ මෙලොව යහපත සඳහාත් පරලොව යහපත සඳහාත් අදාළ වූ සූත්‍ර ගණනාවක් බුදුරජාණන් වහන්සේ විසින් වදාරා ඇත. එයින් සිඟාලෝවාද ව්‍යග්ඝපජ්ජ මංගල,ධම්මික ආදි සූත්‍ර ප්‍රධාන වේ. ගිහි පැවිදි සම්බන්ධතාවය ගොඩනැංවීම පිළිබඳව කරුණු සිඟාලෝවාද සූත්‍රයෙන් විස්තර වේ. සමාජයේ ජීවත්විමේ දී ඔවුනොවුන්ගේ යුතුකම් ඉටුකිරීම අනෙක් අයගේ අයිතිවාසිකම් රැකීමට ගිහියන් පැවිද්දන්ට යුතුකම් ඉටු කිරීම ශාසනයේ චිර පැවැත්මට හේතුවේ.ගිහියන් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිනානප්‍රත්‍ය යන සිව්පසයෙන් සංග්‍රහ කිරීමත් භික්‍ෂුන් වහන්සේලා ප්‍රත්‍යුපකාර වශයෙන් ධර්‍මීදානයෙන් ගිහියන්ට සංග්‍රහ කිරීමත් කළ යුතුවෙයි. ඒ බව,

''ගිහීනමුප කරොණතානං - නිච්චාමිසද්‍රනතො
කරොථ ධමමද්‍රනෙන - තෙසං පච්චුපකාරකං''

යන්නෙන් මනාව පැහැදිලි වේ. උපාසක, උපාසිකාවන් නිත්‍ය පංචශීලයෙන් පොහොය දිනවල අෂ්ඨාංගශීලය, නවාංග උපොසථ ශීලය, ආජීවාෂ්ටමක ශීලය වැනි උසස් ශීලයන්ද ආරක්‍ෂා කළ යුතුය. නිරන්තරයෙන්ම දසපුණ්‍ය ක්‍රියාවල හා දස කුසල කර්‍මයන්හි නිරත විය යුතුය. දැහැමි දිවිපෙවතක් අනුගමනය කළ යුතුයි. මේ කරුණු අනුව ගිහි පැවිදි සමාජය භික්‍ෂු, භික්‍ෂුණී, උපාසක, උපාසිකා යනුවෙන් සිව් කොටසකට බෙදෙන ආකාරයත් ඔවුනොවුන්ගේ අන්‍යොන්‍ය සම්බන්ධතාව ශාසනයාගේ පැවැත්මටත් බුදු දහමේ සුරක්ෂිතභාවයටත් හේතුවන බව පෙනේ.

සිව්වනක් පිරිස ව්‍යක්ත විනීත විශාරද බහුශෘත ධර්‍මධර , විනයධර, ප්‍රතිපත්ති ගරුකව කටයුතු කරනතාක් කල් ශාසනය පවතින බව මහාපරිනිබ්බාන සූත්‍රය , දීගනිගලක්‍ෂණ සූත්‍රය, පාසාදික සූත්‍රය, ම.නි.වච්ඡගොත්ත සූත්‍රය ආදී ත්‍රිපිටක ධර්‍මයෙහි බොහෝ තැන්වල සම්බුද්ධ ශාසනයේ චිරස්ථිය පිණිස සිව්වනක් පිරිසගේ අවශ්‍යතාවය මැනවින් දේශනා කොට ඇත. මෙම සිව්වනක් පිරිස සම්බුද්ධ ශාසනයේ බොහෝ කල් පැවැත්මට හේතුවේවා....

ශාස්ත්‍රවේ ගෞරව අධ්‍යාපන ඩිප්ලෝමා,
එච්.එම්.අයි.හේරත්,

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# උඳුවප් ....

මීට වසර 2565කටත් ඔබ්බෙන් දිනෙක උඳුවප් මස පුර පසළොස්වක පෝ දිනක ජය ශ්‍රී මා බෝ සමිඳුන් අප රටට වැඩම කරවන ලදහ.

ලෝක ධාතුවේ පවතින සජීවී ශ්‍රේෂ්ඨ වෘක්ෂයක් මුල් කරගනිමින් එදා සිට ශ්‍රී ලංකද්වීපය බුද්ධ, ධම්ම, සංඝ යන තුන් සරණෝ ආනුභාවයෙන් උතුම් සංස්කෘතියක උරුමකම් ලද බව ලොවට හඬගා කීමට තවත් උදහරණ අවැසි නොවෙති.

ශ්‍රී ලාංකීය ජාතියත්, සංස්කෘතියත් ශ්‍රීමා බෝධියත් එකම රන් හුයකින් ඇමිණු අනර්ඝත්වයකට හිමිකම් කියනු ඇත.

දළඳා සමිඳුන් ශ්‍රී ලංකාවට වැඩම කරවන තෙක්ම රාජ්‍යත්වයේ මාහැඟි සංකේතය වූ ජය ශ්‍රීමා බෝධිය, දඹදිව රාජ්‍ය දෙවරක්ද, ශ්‍රී ලංකා රාජ්‍ය තෙවරක්ද වශයෙන් වැදුම් ලබා ඇති බවද අප මෙනෙහි කළ යුතුව ඇත.

ශ්‍රීමා බෝධිය සමඟින් අපට සංස්කෘතියක්ද, චාරිත්‍ර වාරිත්‍ර රැසක්ද ශ්‍රාති සමූහයක්ද නව ජීවන මාර්ග හා සංස්කෘතින ආගමික පූජෝපහාර රැසක්ද ලැබිණි. එසේම නව ඇවතුම් පැවතුම් රටාවක්ද, ජනාවාස සමූහයක්ද අප වෙත දයාද විය. බෝධි පූජාව ඒ අතරින් ප්‍රමුඛ අංගයකි. එය අද පවා ලංකාවේ ගම් නියම් ගම් පුරා පවතින ශ්‍රේෂ්ඨ පූජාකර්මයකි.

මෙලෙස සැලකූ කළ රටත් එහි සමස්ථ රට වැසියනුත්, අප සංස්කාතියත් ජය ශ්‍රී මහබෝධින් වහන්සේට ණය ගැතිය. ජය ශ්‍රී මා බෝධිය මුල් කොට ගෙන ශ්‍රී ලංකාවේ ආගමිකත්වය හා සමාජත්වය සකස් වී ඇතුවා සේම ගම් නියම් ගම් නගර හා පළිත් මට්ටමින් විහිදී ඇති අනේක බෝධි රාජයාණන් වහන්සේලා මුල් කරගනිමින් ගම්මාන දහස් ගණනක ආගමික කේන්ද්‍රස්ථාන ගොඩනැගී ඇති බව පැහැදිළි සත්‍යයකි. ඒ සියල්ල ශ්‍රී ලංකීය විශ්‍ඥානයේ මුදුන් මල්කඩ බඳු ආගමික වස්තූන් වී තිබේ. දෛනික ජීවිතය දුක සැප, නින්දා ප්‍රශංසා, ලෙඩ දුක ආදී සියල්ලේම අපේක්ෂාව, සංහිඳියාව මෙන්ම ප්‍රත්‍යක්ෂ බවද පෙනෙනු ඇත්තේද ශ්‍රීමා බෝධින් වහන්සේ සඳහාමය. කිරිදරුවෙකුගේ පටන්ම නිර්වානය දක්වා බෞද්ධයින් සියල්ල අපේක්ෂා කරන්නේ ඒ වෙතිනි.

මෙසේ බිහිවූ සභ්‍යත්වයක් ලෝකයේ තවත් නම් තිබිය නොහැකිය. අතිපූජනීය ජය ශ්‍රීමා බෝධිය යනු ලෝවැසි බෞද්ධයින්ගේ ප්‍රාණ නාලිය බව ඉඳුරාම කිවහැකිය.

පවුල් ඒකකයද, ගමද, නගරයද, රටද, රාජ්‍යයද ගොඩනැගුනේ මේ මඟිනි.

එහෙත් අද වන විට රටේ සංස්කෘතිය, සභ්‍යත්වය, සදාචාරය මෙන්ම සමාජීය ජනජීවිතයම පවා මහා ඛේදවාචකයකට ගොදුරු වූ බවක් දිස්වෙයි. අනිත්‍ය බුදු ගුණ ජය ශ්‍රීමා බෝ සමිඳුන්ගේ ආශිර්වාදයෙන් යළිත් මෙරට තුළ මනා ආගමික පුනර්ජීවනයකට මගහසල සැළසීමට එක්ව කටයුතු කරමු.

නිමල් කන්නංගරආරච්චි

# බුදු දහම හා කාන්තාව

ප්‍රාග් බෞද්ධ යුගයේ කාන්තාව සමාජයේ සැඟවුණු චරිතයක්සේ ම ඇයට ආගමික සාමාජික අධ්‍යාපනික වශයෙන් කිසිම හිමිකමක් අයිතිවාසිකමක් ලබා නොදුනි. කාන්තාව කෙරෙහි ලබා දුන්නේ අන්ත අසරණ තත්වයක් බව වටහා ගත් බුදුරජාණන් වහන්සේ වනිතාව කෙරෙහි අහිමි වූ ආගමික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා සාමාජික යන සියලුම අයිතීන් ලබා දීමට පියවර ගත්හ. ඒ අංශ අතර දියණියක වශයෙන්, බිරිඳක් වශයෙන්, උපාසිකාවක් වශයෙන්, භික්ෂුණියක් වශයෙන් ලබා දිය යුතු සියලු වරප්‍රසාදයන් හිමිකර දීමට ක්‍රියා කළහ.

බ්‍රාහ්මණ සමාජයේ ඔවුන්ගේ ආකල්පයන් යටතේ දියණියක් බිහිවීම සැලකුවේ පරපුරේ විනාශය ගෙන දෙන අසුභදායක පෙර නිමිත්තක් වශයෙනි. එහෙත් මෙම වැරදි චින්තනය මුළුමනින්ම වෙනස් කිරීමට බුදු දහම කටයුතුකර තිබේ. දියණියක වශයෙන් ඇයට හිමිකර දිය යුතු සියලු වරප්‍රසාද නොඅඩුව හිමිකර දුන්හ. වර්තමානයේ වුවද එදා ලැබුණු ඒ වර ප්‍රසාද කාන්තාවන් භුක්ති විඳින බව අමතක කළ යුතු නොවේ. බිහි වූ දරුවා පිළිබඳව සැළකිය යුත්තේ ගැහැණු බව හෝ පිරිමි බව නොව සෑම දරුවෙක්ම දරුවෙක් යන, ආකල්පයෙන් ක්‍රියා කිරීමට බුදු දහම පෙන්වා දී තිබේ. එහිදී ස්ත්‍රී හෝ වේවා පුරුෂ වේවා කවර හෝ දරුවෙකු ඇමතීමට බුදුරජාණන් වහන්සේ භාවිතා කළේ "පුත්ථිමා"(පුතා) යන ආදරණීය වචනයයි. මෙයට කදිම නිදසුනක් ලෙස, දිනක් කොසොල් රජතුමා බුදුරජාණන් වහන්සේ හමු වීමට පැමිණ කණස්සල්ලෙන් සිටීමට හේතු විමසන විට මල්ලිකා දේවියට දියණියක් ලැබුණු බව කණගාටුවෙන් දැන්වීය. එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ කොසොල් රජුට පැහැදිලි කළේ,

"ඉත්ථීපිහි ඒකච්චියා - සෙය්‍යො පෝස ජනාධිප
මේධාවිනි සීලවතී සස්සු දේවා පතිබ්බතා"
"තස්සායෝ ජායතී පොසෝ - සූරෝ හෝති දිසම්පති
තාදිසා සුභගියා පුත්තෝ - රජ්ජම්පි අනුසාසති"

රජතුමනි, කනස්සල්ලට පත් නොවන්න. දියණිය පුතෙකුටත් වඩා ශ්‍රේෂ්ඨ විය හැක. සිල්වත්ව පතිවත ආරක්ෂාකර සිට පුතෙකු බිහි කළ හොත් එම පුතණුවන් රාජානුශාසනාවට පවා සුදුසුය. ඔබේ දියණිය ද එවැනි කෙනෙකු විය හැකිය. මේ තුළින් කාන්තාව පිළිබඳ ඇඳ තිබූ වැරදි චිත්‍රය මුළුමනින් ම මකා දැමීමට හැකි විය.

බ්‍රාහ්මණ සමාජය යටතේ කාන්තාවට බිරිඳක් වශයෙන් ද අත් වූයේ ඉතා ශෝචනීය තත්වයකි. එදා බිරිඳට කටයුතු කිරීමට සිදු වූයේ සහකාරියක් වශයෙන් නොව මෙහෙකාරියක් වශයෙනි. නිවසක ප්‍රධානියා විය යුත්තේ ස්වාමියා පමණක් නොව බිරිඳ ද එම තත්වයට පත් විය යුතු බව සූත්‍ර රාශියකින් ම කරුණු දක්වමින් බිරිඳගේ වරප්‍රසාද තහවුරුකර තිබේ. කාන්තා වරප්‍රසාදයන් තහවුරු කළ බුදුරජාණන් වහන්සේ ඇයට හිමිකර දිය යුතු වරප්‍රසාදයන් පුරුෂයාට සමාන ලෙසින් ම ලබා දී ඇති අයුරු සිඟාලෝවාද සූත්‍රයේ දී මනාව පැහැදිලි වේ. එහි දී ස්වාමියා විසින් බිරිඳ විෂයෙහි ඉටු කළ යුතු යුතුකම් පහක් සඳහන් කර තිබේ. ගෞරවයෙන් කථා කිරීම, අවමන් නොකරීම, පර ස්ත්‍රී සේවනයෙන් වැළකීම, ඉසුරු පවරා දීම හා අලංකාර වස්ත්‍රාභරණ ලබා දීම දැක්විය හැක.

මෙහිදි ස්වාමියාට තම අයිතිවාසිකම් පමණක් තහවුරු කොටගෙන හුදකලා වීමට ඉඩ දී නැත. මේ තුළින් බිරිඳකගේ අයිතිවාසිකම් ද ඉටුකර දිය යුතු බව පෙන්වා දී තිබේ. එසේම කාන්තාවට සමාජයේ ගෞරවාන්විතව ජීවත්වීමට ද මේ නිසා ඉඩ ප්‍රස්ථාව ලැබේ.

සංවාස සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ පැහැදිළිකර දෙන්නේ ආචාර ධර්මයන්ගෙන් සමන්විය යුතු වන්නේ කාන්තාවන් පමණක් නොව දෙදෙනාම ආචාර ධර්මවල පිහිටා ක්‍රියා කළ යුතු බවයි. එහිදී සමාජයේ ජීවත්වන පවුල් හතරක් පිළිබඳ මෙම සූත්‍රයේ දක්වා තිබේ. එම කණ්ඩායම් වන්නේ ඡවෝ ඡවාය සද්ධිං සංවසති මළ මිනීයක් මළමිනීයක් සමඟ ජීවත් වීම, ඡවෝ දේවියා සද්ධිං සංවසති, මළ මිනියක් දෙව්දුවක හා විසීම, දේවෝ ඡවාය සද්ධිං සංවසති, දෙවියෙක් මළමිනියක සමඟ විසීම, දේවෝ දේවියා සද්ධිං සංවසති, දෙවියෙක් දිව්‍යාංගනාවක් සමඟ විසීම ආදියයි. මෙහි දී බුදුරජාණන් වහන්සේ මෙම කණ්ඩායම් හතරෙන් ම අනුමත කොට ඇත්තේ හතරවන පවුල් ඒකකයයි. මෙහි දී ප්‍රකාශ වන්නේ බිරිඳත් ස්වාමියාත් දෙදෙනාම ගුණ ධර්මවලින් යුක්ත වු අය විය යුතු බවයි. එක් පාර්ශවයක් පමණක් යහපත් ව අනෙක් පාර්ශවය රිසිසේ කටයුතු කිරිමක් මෙහි දී සිදු නොවේ. ගුණ ධර්මවලින් යුක්තවීම දෙදෙනාටම අනිවාර්ය වේ. මෙය වර්තමානයේ පිරිහී යන පවුල් සංස්ථාව නැවත ගොඩනැඟීමට ප්‍රබල සාධකයක් කොට ගැනීම ඉතා වැදගත් වේ.

සංයුක්ත නිකායේ කෝසල සංයුක්තයේ භාර්යාවක් සතු විය යුතු උතුම් ලක්ෂණ පහක් පෙන්වා දේ. පතිපූජිකා (සිය ස්වාමියා ගරු සරුව පුදන), කුල නන්දනී (නෑයන් සතුටු කරන), ජනරංජනී (ජනයාගේ සිත් සතුටු කරන), ධර්මචාරිණී (සීලා දී ගුණ ධර්මයන්හි හැසිරෙන), වරාංගනා (කාන්තාවන්ට උතුම් වන්නී) යනුවෙන් වරප්‍රසාදයට ලක් වී තිබේ. මෙම උතුම් ලක්ෂණ භාර්යාවක් තුළ එක් එක් වශයෙන් නොව සෑම කරුණක්ම අඩු වැඩි වශයෙන් තම ජීවිතවලට පුරුදු පුහුණු කර ගත යුතුය. ඕනෑම ගෙයක් අලංකාර, ප්‍රිය මනාප, නිවසක් බවට පත් වන්නේ බිරිඳක් නිසාය. ගෙදර දොර කටයුතු මැනවින් පාලනය කරමින් දරුවන් හදා වඩා ගනිමින් බිරිඳක් වශයෙන් උසස් සේවයන් ඇය සලසයි.

"සත්තභරියා" සූත්‍රයෙන් භාර්යාවන්ගේ ලක්ෂණ අනුව කොටස් හතකට වර්ගකර ඇති ආකාරය දැකිය හැකිය. මාතු භරියා (මවක් බඳු බිරිඳ), භගිනි භරියා ( සොහොයුරියක් බඳු බිරිඳ), දාසි භරියා ( දාසියක් බඳු බිරිඳ), සඛි භරියා (මිතුරියක් බඳු බිරිඳ), චෝර භරියා ( සොරෙක් බඳු බිරිඳ), වධක භරියා (වධකයෙක් බඳු බිරිඳ), සාමි භරියා ( ස්වාමියෙක් බඳු බිරිඳ) මොවුන් අතුරින් පළමු හතරදෙනා ශ්‍රේෂ්ඨ උතුම් කොට දක්වා ඇත. ඉතිරි තුන්දෙනා ගර්හාවට ලක් කොට ඇත.

බුදු දහමේ කාන්තාවකට බමුණු මිථ්‍යා සංකල්ප බැහැර කොට උත්තරීතර නිදහසක් ලබා දී ඇත. බුදු දහමට අනුව කාන්තාවට ලැබිය හැකි උත්තරීතරම පදවිය වන්නේ භික්ෂුණී භාවයයි. ශාසන දායාදයක් ලබමින් සසර දුක් කෙළවර කොට නිවන් පසක් කරගැනීමට ද ඒ තුළින් ඇයට ඉඩ හසර සැලසුණි. ථේරි ගාථා තුළින් එය මනාව ස්ඵුට වේ. සෝමා තෙරණියගේ ප්‍රකාශය වන

"ඉත්ථිභාවෝ නො කිං කයිරා
චිත්තම්හි සුසමාහිතො
ඤාණම්හි වත්ත මානම්හි
සම්මා ධම්මං විපස්සිනො"

මෙයින් සඳහන් වන්නේ සිත සමාධිගත වන්නේ නම්, චතුරාර්ය සත්‍යය අවබෝධ කරගත හැකි නම්, ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ගමන් කිරිමට හැකි නම්, ස්ත්‍රී භාවයේ කිනම් අඩුවක් ද යනුවෙනි. මේ තුළින් වර්තමානයේ කාන්තාවට ලබා දෙන්නේ මහත් වූ පණිවිඩයකි. කාන්තාවගේ අගය ප්‍රකට කරන ලද තවත් අවස්ථාවක් ලෙසින් මාතෘත්වය සඳහන් කළ හැක. ඇය මහා බ්‍රහ්මයාට සම කළ අවස්ථාවක් ලෙස (බ්‍රහ්මාති මාතා පිතරෝ), මව තම නිවසේ මිතුරියක් ලෙස ( මාතා මිත්තං සකේ ඝරේ), දෙමාපියන් පෙරදිග දිසාව ලෙස (මාතාපිතා දිසා පුබ්බා), දෙමාපිය උපස්ථානය මංගල කරුණක් ලෙස (මාතා පිතු උපට්ඨානං), මව්පියන්ට නොසළකන්නා පිරිහෙන බව (යෝ මාතරං වා පිතරං වා) යන අවස්ථා තුළින් බමුණු මත බිඳ දමා කාන්තාවන්ට සමාජයේ ගෞරවාන්විතව කටයුතු කිරීමට, බුදු දහම තුළින් උදාකර දුන් බව මනාව ප්‍රකට වෙයි. එසේ ලබා දුන් එම ගෞරවාන්විත බව ආරක්ෂා කරගැනීමට කටයුතු සලසා ගැනීමට, නැවත උදා වූ මහඟු අවස්ථාවක් ලෙස උඳුවප් පොහෝ දිනය හඳුන්වා දිය හැකිය.

ශාස්ත්‍රපති පානදුරේ උප්පලවණ්ණා
දීපනී මෙහෙණින් වහන්සේ

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## තුන්සිංහලය ලෙව බබලයි......

1. මුලු ලෝකය තුලම සිරිලක බබලනවා
ඕනෑම රටක කෙනෙකුට මෙහි සැප දෙනවා
තුන්සිංහලය කවදත් ලොව ලෙලදෙනවා
සිරිලක ඇවිදලා මෙහි සිරි නරඹනවා

2. සෙංකඩගල නුවර දළඳා වැඩ ඉන්නේ
අනුර පුරේ රන්වැලි සෑ වැඩ ඉන්නේ
අනුර පුරේ බෝ සමිඳුන් ලෙළ දෙන්නේ
දකුණු පුරේ කිරි වෙහෙරින් බබලන්නේ

3. මුලු සිරිලකම නිල් ගොයමින් බබලනවා
කල්ප වෘක්‍ෂ ලෙස පොල්ගස ගෙඩි දෙනවා
කදුරට තේ ගසින් සැමටම කොළ දෙනවා
රබර් ගසින් ඒ අය හට කිරි දෙනනවා

4. කෙසෙල් ගසින් සිරිලකටම ගෙඩි දෙනවා
කොස්ගෙඩි වලින් සැමගෙම බඩ පුරවනවා
දෙල්ගස අපේ සම්පත බව පවසනවා
කෑම බීම නැහැ සිරිලක අඩු වෙනවා

5. රත්න පුරේ මැණික් ලොවටම ගෙන දෙන්නේ
ලක් පොළවෙන්ම මිනිරන් අපහට දෙන්නේ
ලඟදීම ඉන්ධනත් අපහට ලැබදෙන්නේ
සියලුම සසම්පතින් සිරිලක බබලන්නේ

6. තුන් සිංහලේ ජීවත්වන මිනිසුන්ට
කම්මැලි නොවී අත් හොලවන මිනිසුන්ට
හිස් මොළ යෙදෙව්වොත් සිරිලක මිනිසුන්ට
දියුණුව පිණිස සිදුවෙයි වැඩ මිනිසුන්ට

7. මේ පිං බිමේ ජීවත්වන ඔබ සැමට
සිහි නුවණින් යුතුව වැඩකළහොත් ඔබට
වෙළහෙළදම් සහ ගොවිතැන් කළ අයට
නැහැ වරදින්නේ කවදාවත් ඔබ සැමට

8. රජවරුර ඇමතිවරු ධනවත් සියලු දෙනා
සමගිව වැඩ කලොත් ඔබ හැම සියලු දෙනා
පොදු ජනතාව ගැන හිතුවොත් සියලු දෙනා
සිරිලක සුර පුරක් කරණට හැකිය මනා

**කාව්‍ය ශ්‍රී පූජ්‍යපාද**
**කුරුදුකුඹුරේ සුමනසිරි හිමි**
**ශ්‍රී සුගතාරාම පුරාණ විහාරය**
**මං උනාව-බිංගිරිය**

## හද කුටිය

**බුදු සමිදු පුදන්නට**
**මලක් නෙලන්නට**
**මල් ගසක් වවන්නට**
**ඉඩක් නැහැනේ මා බුදු සමිදේ**

**බුදු සමිදු පුදන්නට**
**පහනක් දල්වන්නට**
**බුදු රුවක් තබන්නට**
**ඉඩක් නැහැනේ මා බුදු සමිඳේ**

**එනමුදු කම් නැත**
**මා හද කුටියේ වැඩ සිටිනා**
**බුදු සමිදුගේ සමාදි ගත රුව**
**ජීවමාන ලෙස දිස්වේ මා අභියස**

**දොහොත් මුදුන් දී වදිමි සමිදුනේ**
**සාදු සාදු මා බුදු සමිඳේ**
**සදාකල්හිම මා හද කුටියේ**
**වැඩ සිටිනු මැන මා බුදු සමිඳේ-**

**ඩබ්.එම්.එල්.නවරත්න**

## අප්පච්චි........

ජීවන බර කරට අරන් මුදල් සොයන පියා
දරු සෙනෙහස හිතේ තියන් අගවන්නැති පියා
වෙහෙස වෙලා උදේ ඉඳන් ගෙදරටවිත් පියා
හෙට දවසේ අප පැතුමන් සඵල කරයි පියා

කුමාර ගුරුසිංහ ආරච්චි
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

## නිල් කටිරෝල් මල

නිල්කටිරෝල් මල
නුඹයි කුමාරි
නුරා බැලුම් දී
මා සැනසූ
ආලක මන්දාවේ
පර්වත සීගිරි ප්‍රන්තයේ

සුළං කපොල්ලේ
ගල් බෙයදෙන් බැස
සිරි යහනාවේ
අසිරි මැවූ
පින්සරදේවී නුඹයි
පර්වත සීගිරි ප්‍රන්තයේ

පිළි මල් අත මා
හිස පත් වූවත්
මා එන පෙර මඟ
නෙතු දල්වාගෙන
බලා හිඳී ඔබ නීල කුමාරී
පර්වත සිගිරි ප්‍රාන්තයේ

**ඊ. එම්. ජී. ධර්ම රාජපක්ෂ**
**අ/ කාගම යාය 06 ම.වි.**
**කටිකාව.**






## ලොවුතුරා නිවන්

නගිමින් එකින් නෙක
ලෙසු පියගැට
වැන්දෙම් වැඳුම්
දෑ හිසමත
තබාගෙන
කියමින් බුදු ගුණ
තුන් ලොවටම
ඇසෙන්නට
ගැයුවෙමි ගැයුම්
බුදුගුණ නිති සිහිකරමින්
අසමින් සුමිහිරි බණ පද
බොදු සිත් පහන් කරමින්
පිරුවෙමි පිරුම්
කරුණාබර දයාවෙන්
මනසින් හැඳිනගෙන
සදහම් වූ බුදු ගුණය
පැතුවෙමි
පැතුම්
ලැබුමට
ලොවුතුරා නිවන්.....

සුගන්ධිකා බණ්ඩාර
කුඩාවැව.

## ........නොමියෙන රහසක්..........

අන්න බලන් දුර අහසේ
පුන් පෝදා සඳ නැගුණා.....
නිල් තරු කැට දිළිහි දිළිහි
නොමියෙන රහසක් කිව්වා.....

හමා ඇදෙන මඳ සුළගේ
දහසම් සිසිළ හමා ගියා.....
කුසුම් පිපෙන වසන්තයේ
බුදු ගුණ ලොව හමා ගියා.....

තිලොව තිලක බුදු සමිඳේ
ඔබ දෙසූ දම් පද අසලා.....
මිගදා මහ උයන් පෙතේ
හැම ගහකම මල් පිපුණා.....

එම්. සිරිධම්මචාරී මෙහෙණින් වහන්සේ
පොල්පිතිගම.

## මහා යන්ත්‍ර රාජයා

කරපු පව් මුදවාලා
සරු වන්න ජීවිතේ......
රකින බව කිය කියා
එල්ලිලා අපෙ කරේ......
පුළුටු-කිලි- රේදිවැලක්
දකින විට පන බයේ......
අප විසින් රකිනවා
බයේ වෙව්ලන සුරේ......

භාග්‍යා එම්. හේරත්
කැකිරාව

# ජීවිතය ජයගන්න

හරියාකාරව අර්ථයක් නැතිව හැල්මේ දියවෙන ලෝකයෙහි අපිත් බලා නොයිඳ එම තරගයට එක්විය යුතුම වී තිබේ. නමුත් දුවන්නන්වාලේ දිවීමට එකතු නොවී අරමුණක් ඉලක්කයක් වෙනුවෙන් අර්ථවත් ගමනකට එක්විය යුතුය. මිනිසුන් වන අප ඒ සඳහා ක්‍රියා කළ යුතුයි. දිනෙන් දින වසරින් වසර වයසින් මුහුකුරා වැඩෙද්දි එසේත් නැත්නම් දවස් අවුරුදු බැගින් ගෙවී අප වැඩිහිටියන් බවට පත් වෙද්දි පුංචි කාලේ හිටපු අපි අපටම අමතක වෙලා යනවා. ළමා ලොව අසිරි අපට නොදැනීම අපෙන් ගිලිහිලා මතකයෙන් ඈත්වෙලා. පුංචි කාලේ අපි දැකපු හීන ලොකු වුන දවසක දැනුම් තේරුම් ඇති වුන දවසක කිරීමට බලාපොරොත්තු වූ දෑ අපේ මතකයෙන් ගිලිහිලා අවසන්. ඒ වෙනුවට මවාගත් ගැහැණු පිරිමි රූපයන් පමණක් ඉතිරිව තිබේ. බෝහෝ වේලාවට අපි විසින්ම ඒ සුන්දර දේ සිතින් යටපත් කර එය අමතකකර ජීවත් වෙනවා. සෑම පුද්ගලයෙකු තුළම කුඩා කළ මැවපු සිහිනයක් හෝ බලාපොරොත්තුවක් ජීවත් වෙනවා. ඒත් අද දවසේ ජිවන රටාව එක්ක අවිවේකී බව තුළ ඔබේම සුන්දර දේ කලාත්මක හැඟීම් වැලලිලා තිබෙනවා. නමුත් අපි දන්නේ නැති වුනත් අපේ ජිවිත වෙනස් කරන්නට ඒ සිහින වලට බලාපොරොත්තු වලට ක්‍රියාකාරකම්වලට හැකියාව තිබෙනවා.

හිතන්න මොහොතක්, ඔබ ස්වභාව ධර්මයට ලංවී ඔබේ සුන්දර හැකියාවන්ට නැවත පණදෙන්න. ඇලක, දොළක ගලා යන සීතල දිය ඇල්ලක සුන්දරත්වය මිහිරියාව පරිසරයේ ඇති අලංකාරත්වය සුන්දරත්වය නෙතින් දැක සිත පුරා විඳගන්න ඔබේ මිතුරන්ට ඔබේ ඇසුර ප්‍රිය කරන බව දැනෙන සැබෑ සමීපතමයන්ට ඔබේ කාලයෙන් ඉඩක් ඉතිරි කරන්න. ඔවුන්ට ඔබේ හිතේ ඉඩක් දෙන්න. ජීවිතය කියන්නේ වැඩ කරනවා කියනා දෙයට කියනා තවත් එක් නමක් නම් වෙයි. අන්තගාමී නොවී ජීවිතය ගැන අවබෝධයෙන් සිතන්න. අවබෝධයෙන් කටයුතු කරන්න. සිනහවකින් හෝ තමන් දන්නා දෙයකින් සමීපතමයන්ට සංග්‍රහ කරන්න. ජීවිතයේ සැබෑ අසරණ වුනු අයට නැගී සිටින්න අත දෙන්න. ධෛර්ය දෙන්න. ශක්තියක් වෙන්න. එයින් ඔබට පෙරළා උපරිම සතුටක් ලැබෙනවා. එයයි සත්‍ය. හිතට වාගේම ශරීරයටත් ඉතාම හොඳ ඔසුවක් ලෙසින් සිනහව පිළිගැනේ. පුංචි දරුවෝ බොහෝම සතුටින් සැහැල්ලුවෙන් සිනහවෙන් ඒ සතුට විඳිද්දි වැඩිහිටියන් දවසකට සිනහව දක්වන්නේ කී වතාවක්ද? ඔබ ඒ අවස්ථාවෙත් හිතට අවංකවම සිනහව පහළ කළාද? කියලා ඔබට විශ්වාසද? ඒ තමයි ඇත්ත.

වර්තමානයේ අපි සෑමදෙනාම ජීවත් වන සංකීර්ණ රටාව තුළ සිනහාවිමට හෝ අපට අප ගැන සිතීමට කාලයක් ඉතිරි වෙලා නැත. සිනහව සැහැල්ලුව අපේ ජීවිතවලට එක්කර ගැනීමෙන් අපට පාඩුවක් සිදු කිරීමට බාහිර බලවේගයකට හැකියාවක් ලැබෙන්නේ නැහැ. නිතර එහා මෙහා යමින් නමට විතරක් ජීවත් වන අපි බොහෝ දෙනෙක් හරියාකාරවම තමන් පිළිබඳ දන්නේ නැහැ. ඒක ඇත්තක් ජීවත් විමට. මමත් ජීවත් වෙනවා යැයි තමන්ටම දැනීමටනම් අපට අරමුණු හා බලාපොරොත්තු අවශ්‍ය වේ. අපි සිතිය යුත්තේ සැබෑවෙන සිහිනය.

සිහින, බලාපොරොත්තු, අරමුණු ඉටුකර ගැනීම සඳහා දාඩිය හෙළිය යුතුය. අරමුණු වලට සිත යොදවා කටයුතු කළ යුතුය. සැලසුම් සකස් කළ යුතුවේ. එවිට ඔබත් නොදැනීම ඔබේ බලාපොරොත්තු අරමුණු යථාර්ථයක් බවට පත් වේ. මේ දෙවල් අමතකව යන්න ඉඩනොදී සැබෑ කරගන්නේ එලෙසිනි. බලාපොරොත්තු සඵල කර ගැනීමටද අරමුණු ඉලක්ක සැබෑ කර ගැනීමටද මෙලෙස ධෛර්යවන්තව කටයුතු කළ යුතුය.

සමාජයේ තවත් එක් සමානය පුද්ගලයෙකු බවට පත්නොවී ජීවිතය සැබෑ ලෙස ජය ගන්න ඔබ සුවිශේෂී පුද්ගලයෙක් බවට නිරායාසයෙන් පත්වන්නේ වෙනත් පුද්ගලයන් තුළ නොමැති ඔබ තුළම පමක් ඇති විශේෂ දක්ෂතාවයන් හේතුවෙනි. ජීවිතයේ ජයගන්න ඔබත් උත්සහවන්ත වෙන්න.

**ධම්ම දින්නා මෙහෙණින් වහන්සේ**
**නියඳවනය, කෝන්වැව**

# මහපොළොව හෙල්ලූ බුදුගුණ මහිමය

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ චරිතය පිළිබඳව පැරණි පඬිවරුන් ලියා පල කළ ග්‍රන්ථ වල උන්වහන්සේගේ ලෞකිකවුත් ලොකොත්තර වුත්, ජීවිත ප්‍රවෘත්තින් මහත් උත්කර්ශයෙන් වර්ණනා කොට ඇත. ලෝකයේ යම්පුද්ගලයෙකු පිළිබඳ ලිය යුතු ලිය හැකි සෑම ගුණ ධර්මයකින්ම පරිපූර්ණ බුද්ධ චරිතය කෙනෙකුට වර්ණනා කළ හැක්කකි. බුදුවරයෙකුගේ ගුණ වර්ණනා කළහැක්කේ එබඳුම බුදුවරයෙකු විසිනි. සෙසු කිසිම පුද්ගලයෙකුට බුද්ධ ගුණය වර්ණනා කළ නොහැක. කපක් මුළුල්ලේහි බුදුගුණ කියන්නට සිතන කෙනෙකුට ඒ කප මුළුල්ලේම කියා නිම කරලිමට කිසිසේත් කළ නොහැක. කල්පය අවසන් වේ. බුදුගුණ අවසන් නොවේ.

"බුද්ධෝපි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං
කප්පංපි චෙ අඤ්ඤමභාසමානෝ
ඛීයේථ කපෙපා චිරදීඝ මන්තරෙ
වණ්ණො න ඛීයෙථ තථාගතස්ස"

යන්නෙන් එය පවසති. දෙවි මිනිස් මිනිසුන් බඹුන් ආදීන් විසින් බුදුගුණකීම ආශ්චර්යයක් නොවේ. අප්‍රාණික වූ මහා භූත වස්තූන් පවා බුද්ධ බලය කාරනා කොට ගෙන මහත් හර්ෂයෙන් යුක්ත ගුණ ගායනා කරන කෙනෙකුන් මෙන් ඒ වස්තූන්ට අනුරූප ප්‍රීතිය පවත්වති. මහා පෘථිවිය කම්පා වීම අකල් වැසි වැඩි වීම සිනිදු වාතය හැමීම රුක් වැල් ආදියේ අකාල පුෂ්ප ඵල ජනිතව බබළන්නට විම. ගංගා හෝ සමුදුරු නිශ්චලව පැවීම ආදී ආශ්චර්ය දේ සිදුවනුයේ ගුණ බලය කරණකොට ගෙනය. භූගත වුවද අහස් ගත වුද සිව්පාවුන් හා පක්ෂිහුද මේ ගුණ බලයෙන් වශීව ශබ්ද නගත් ප්‍රීතිය එළ කලත් ලොවි මහා රජවරුන්, ශුද්ධ පුද්ගලයන් ආදී විශිෂ්ඨ ගණයේ පෘථග්ජන පුද්ගලයන්ගේ බල විශේෂ කරණකොට ගෙන ලෝකයේ අද්භූත සිදුවීම් ඇරතිවන බවද ලොව ප්‍රසිද්ධ කරරුණකි. එසේම අපට නොපෙනෙන අදෘෂ්‍යමාන බල ශක්තීන්ගේ ක්‍රියාකාරීත්වය හා ශක්ති ප්‍රමාණයද මෙකළ විද්‍යාඥයන් විසිනිදු සොයා හෙළි පෙහෙළි කරගෙන යනු ලැබේ.

බෞද්ධයාගේ ශ්‍රේෂ්ඨ ශාස්තෲන් වූ බුදුරජුන් වහන්සේලා පිළිබඳ සිදුවන අද්භූත සිද්ධීන්ගේ බලය වනාහි සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් හෝ එයට වැඩි වූ හෝ පාරමිතා බල මහිමයෙන් සිදුවන්නෙකි. එය අන්ත අප්‍රමාණ ලෝක ධාතූන් හි පැතිර පවත් වන්නේ ය. මෙහි සඳහන් වනුයේ උන්වහන්සේගේ ගුණ මහිමයෙන් පෘථිවි කම්පනයෙන් සිදු වූ ආකාරය පිළිබඳ කරුණු ස්වල්පයකි.

බුදුරජාණන් වහන්සේ තුසිත දෙව්ලොවින් චුතව මිනිස් ලොව පහළ වූ අවස්ථාවේ පටන් සිදුවූ භූමි කම්පා පිළිබඳ පොත්පත් වල සැකවින් සඳහන් වේ.

දීපංකර බුදුරජාණන් වහන්සේගෙන් විවරණ ලත් සුමේධ තවුසාණන් පාරමී ධර්මයන් සම්පූර්ණ කරන කල්හි ඇති වූ මහා භූමිකම්පාව ප්‍රධාන අවස්ථාවක්සේ සැළකිය හැකිය. මතු බුදුවන බුදුවරයෙකු නියත විවරණ ලත් අවස්ථාවේ සුමේධ තාපසතුමාට කළ මහී ගර්ජන පූජාවක් ලෙසද එය සැලකේ. පාරමී ධර්මයන් සම්පූර්ණ කිරීමේ අවස්ථාවේදී සිදුවූ පෘථිවි කම්පා සත්වරයක් සිදුවූ භූමිකම්පා තත්වයක් විය. එය මෙසේය.

01. වෙස්සන්තර රජතුමන් "යමක ඉල්ලූ යම් හැම දෙයක්ම පරිත්‍යාග කරන්නෙමියි" අධිෂ්ඨාන කළ අවස්ථාවේදී ප්‍රථම භූමිකම්පාව සිදුවිය.

02. කලිඟු රටින් පැමිණි බමුණන් අට දෙනා පාණ්ඩව නම් හස්තිරාජයා දන් දුන් අවස්ථාවේ පොළොව ගුගුරා ගියේය.

03. සත්තසතික මහා දානය දුන් අවස්ථාවේ තුන්වන භූමි කම්පාව ඇතිවිය.

04. වෙස්සන්තර බිසව හා දරුවන් දෙදෙනා සමඟ හිම වතට ගිය අවස්ථාවේදී සතර වන භූමි කම්පාව ඇති විය.

05. දරුවන් දෙදෙනා දන් දුන් අවස්ථාවේදී පස්වන භූමි කම්පාව ඇති විය.

06. වෙස්සන්තර බිසව බමුණාට දන් දුන් අවස්ථාවේදී සයවන භූමි කම්පාව ඇති විය.

07. දරුවන් දෙදෙනා බමුණා අතින් මුදවාගෙන සඳ මහරජතුමාට දොළොස් අක්ෂෞහිණියක් සෙනඟ සමග හිමාලයට ගොස් ඵුසති දේවිය, වෙස්සන්තර රජු, ජාලිය, ක්‍රිෂ්ණජිනා යන මොවුන් සමඟ සතුටු කඳුළු වගුරුවමින් සිටි අවස්ථාවේ සත්වන භූමිකම්පාව විය.

බෝ මැඩදී ප්‍රතීත්‍ය සමුක්ෂා ධම්ය සමරන අවස්ථාවේදී දසදහසක් සක්වල මහ පොළොව දොළොස් දොළොස් වාරය බැගින් මෙසේ එක්ලක්ෂ විදි දහසක් වාරයෙහි මහී ගර්ජන නම් පූජාවක් විය. ධම්ම චක්ක පවත්වන සූත්‍ර දේසනාව අවසාන වූ අවස්ථාවේ සකළිස් යොදුන් ඝණකඩ මහ පොළොව කම්පිත විය. ධම්ම චක්ක පවත්වන සූත්‍රය අවසාන වූ අවස්ථාවේ සතළිස් යොදුන් ඝණකඩ මහපොළොව කම්පිත විය. බිම්බිසාර රජු වේළුවනාරාමය බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට පූජා කළ අවස්ථාව, මච්ඡිකාසණ්ඩ නම් නුවර චිත්‍ර නම් සිටාණන් මහානාම මහා ස්ථවිරයන්ට අම්බාටක උයන පූජා කිරීම හා ලක්දිව මහමෙව්නා උයන මහා සඟනට පූජා කළ අවස්ථාව යන තුන් තැන්හීදී පොළොව කම්පා විය.

මහා ප්‍රජාපතී රහත් මෙහෙණින් වහන්සේ පිරිනිවන් පාන්නට සිතූ අවස්ථාව, පිරිනිවන් පෑම තුන් අවස්ථාවේදී ද පොළොව කම්පා විය. යශෝදරා මෙහෙණිය පිරිණිවන් පෑමට සිතූ අවස්ථාවේදිද පොළොව කම්පා විය. බෝසතුන් තුසී දෙව්ලොවින් බැස මහාමායා දේවිය කුස පිළිසිඳ ගැනිම, බිහිවීම, බුදුවීම යන අවස්ථා වලද මහී ගර්ජනා ඇතිවිය. බුදුරදුන් ආයුසංස්කාරය හැරි, පිරිණිවන් පෑම යන අවස්ථාවේදී දස දහසක් පොළොව එක්ලක්ෂ විසිදහස් වාරයක් කම්පිත විය. මෙකී බුද්ධ බල මහිමය කරණ කොට ගෙන ඇති වූ පෘථිවි කම්පා සියළු බුදුවරුන්ට සාධාරණ ධර්මයන්ම වේ.

**නිලූකා සේනාරත්න (පොත පත ඇසුරිනි)**

# සඝමිත් තෙරණිය හා ජය ශ්‍රීමා බෝධීන් වහන්සේ

සීතල උඳුවප් මාසයේ පුර පසළොස්වක පෝය දින උඳුවප් සඳ නැගී එන ගුවනෙහි බබලන කල්හි ඒ සෞම්‍ය සඳවතිය සේ, සදා කල්හි බෞද්ධයන්ගේ සැදැහැති හදවත් තුළ වැඩ වාසය කරන සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේ මතකයට නැගී එන්නේය. ශ්‍රී බුද්ධ වර්ෂ 236 වැන්නේ එනම් ක්‍රි.පූ. 307 වැන්නේ ශ්‍රී මහ බෝධීන් වහන්සේත් වැඩමවාගෙන සඝමිත් තෙරණින් වහන්සේ, දීප වංශයෙහි සඳහන් පරිදි,

01. උත්තරා මහරහත් මෙහෙණියි
02. හේමා මහරහත් මෙහෙණිය
03. මසාරගල්ලා මහරහත් මෙහෙණිය
04. අග්ගමිත්තා මහරහත් මෙහෙණිය
05. දාමිකා මහරහත් මෙහෙණිය
06. වේග්ගු මහරහත් මෙහෙණිය
07. පබ්බතා මහරහත් මෙහෙණිය
08. මත්තා මහරහත් මෙහෙණිය
09. මල්ලා මහරහත් මෙහෙණිය
10. ධම්මදාසි මහරහත් මෙහෙණිය

යන මහ රහත් මෙහෙණින් වහන්සේලාත් සමඟ මේ රටට වැඩම වන ලදී. ඒ බව බෝධි වංශයේ විස්තරයට අනුව මෙසේ සඳහන් කළ හැකිය.

එනම් ධර්මාශෝක රජතුමා විධුරින්ද නම් රාජ කුමාරයෙකුට පිරිවර සමඟ බෝධීන් වහන්සේ ආරක්ෂා කිරීමට නියම කලේය. එසේම අටළොස් කුලයක දෙවියන් හට ආරක්ෂාව රැකවරණය ලබා දෙන ලෙසද නියම කලේය. දහඅට කුලයකට අයත් 210 ක් වූ පිරිවර ජන සමූහයාද බෝධීන් වහන්සේ සමඟ මේ රටට එවන ලදි. එවුන්ට පහත සඳහන් තනතුරු පවරා තිබිණි. බෝධි වංශයේ සඳහන් පරිදි එම තනතුරු 24කි. (සුවිස්සකි)

01. කඩුගන්නා තනතුර
02. බමුණු තනතුර (මාහා බෝධියට ශාන්ති කිරීම සඳහා)
03. උතුරු පස්නා තනතුර (මහබෝ මඟුලෙහි රන් ධජ,රිදී ධජ, ආදිය නැංවීම සඳහා)
04. මහවෙළ දනා (සුවඳ දුම් දීම, සුවඳ දුම් ඇල්ලීම)
05. මහබෝ රකිනා (දුනු හී ගෙන බෝධියට බැසිය හැකි කපුටන් ආදි සතුන් එළවීම)
06. සරස්නා (කුඩ ඉහලීමේ තනතුර)
07. කිලිගුණ (අලුත් මල් සැපයීමේ තනතුර)
08. කපුනා (ලද පස් මල් සැපයීම)
09. දොරනා (මහා බෝ ගෙයි දොරටුවෙහි ආරක්ෂා කටයුතු)
10. පෙහෙර කරුණා (පෙරහන්කඩ හා නූල් සැපයීම)
11. කුඹල් කරුණා (පාත්‍රා භාජනාදිය සැපයීම)
12. මල් කරුණා (මල්දම්, මල්වඩම් සැපයීම)
13. ගඳ කරුණා (සුවඳ ද්‍රව්‍ය සැපයීම)
14. මහසීනා (ධජපතාක සැපයීම)
15. මුළුරකිනා (පූජාව සඳහා බත් සැපයීම)
16. කඹුරුනා (කතුරු, කියත්පත් කරවීම)
17. ලෝකුරුනා (රන් රිදී කැටපත් සැපයීම)
18. අටකෙලිනා (රන්වැට රිදිවැට හා රන් වළන් සැපයීම)
19. ඇදුරුනා (වියත් මඩුළු, රුවන් මඩුළු කරවන්නා)
20. මුදුන්ත වරුෂා (වියන් කරවන්නා)
21.පැළවානා (හේවිසි පූජා පැවැත්වීම)
22. සත් කරුණා (සේසත් කරවා දීම)
23. උයන්ගොවුවා (මල් රුක් රෝපණය කරවීම)
24. පෙරහර බිසෝ (පැන් වැඩීම) ආදී වශයෙනි.

සුමිත්ත හා බෝධි ගුප්ත යන ශාක්‍ය පුත්‍රයන් දෙදෙනාට රාජකීය ඇඳුම් පැළඳුම් අන්දවා මුසින්ත කුමරාට කුලවාසීන්ද, බෝධිගුප්ත කුමරාට බෝධීන් වහන්සේද ආරක්ෂා කරන ලෙස භාර දුන්හ. බෝධීන් වහන්සේට පැන් වඩනු සඳහා රාජකන්‍යාවන් 04 දෙනෙක්ද රන් කෙන්ඩි 08 ක්ද, රිදී කෙන්ඩි 08 ක්ද දෙන ලදි. ගංගා නදියේ සරසන ලද නැවක බෝධීන් වහන්සේත්, සඝමිත් තෙරණියත්, අරිට්ඨ කුමාරයාත්, බෝධිගුප්ත නම් කුමාරයකු ප්‍රධාන කොට ඇති උසස් වංශික කුමාරවරුන්ද නන්වා සෙසු කුල වලට අයත් පිරිස් වෙනත් නැව් වලටද නැන්වීය.

දින 07කින් නැව තාම්රලිප්ත නම් තොටට පැමිණියේය. ඒ එන අතර මගදී නොයෙක් තොටුපලවලහිදී මිනිසුන් මෙන්ම දෙවියන්ද පුද පූජා පැවැත්විය. ධර්මාශෝක රජතුමා විසින් තාම්රලිප්ත තොටෙහිදි නැවත මනරම් මණ්ඩපයක් මත බෝධීන් වහන්සේ නැවත දඹදිව රාජ්‍යයෙන් පුදා නැවත සතියක්ම පුද පූජා පැවැත්විය. රජතුමාගේ ස්වර්ණමය වූ සංඛය රාජ කන්‍යාවන් අතටද රිදී සංඛය සිටු කන්‍යාවන් අතටද දී අනෝතත්තවිල ජලයෙන් අභිශේක කලේය. ඉන්පසු උඳුවප් පුර පෑලවිය දිනක බෝධීන් වහන්සේ ඔසවා තම හිස මුදුනෙහි කරවටක් ජලයට බැස නැවෙහි තැන්පත් කරවිය. එසේ කර සෙසු බෝධීන් වහන්සේ රැගත් නැව ලංකාව බලා පිටත් කොට කඳුළු සලමින් නැව් පෙනෙන තෙක් මානයේ බලා සිටියේය. බෝධීන් වහන්සේ රැගත් නැව මුහුදට පිවිසි කල්හි යොදුනක් පමණ මුහුදු රළ නැතිව ගොස් පස් පියුමින් සුපිපි මලින් අලංකාර වුන අතර අහසෙහි පොළවෙහි වසන දෙව් දේවතාවන් නොයෙක් ආකාරයේ පුද පූජා පැවැත්විය. මේ අතර නාග ලෝකයෙන් පැමිණි නාගයන්ට බෝධීන් වහන්සේ ලබා ගැනීමට මහත් ආශාවක් ඇති විය. නාගයින් දසදහස් ගණනක් එකතු වී මුහුදේ රැළි නංවමින් අන්ධකාර කරමින් විෂ දුමක් පිට කළාය. දෙවියන්ටත් බෝධීන් වහන්සේ ආරක්ෂාවට පැමිණි සෙන්පතියන්ටත් මේ සිදුවන්නේ කුමක්දැයි සිතා ගන්නටවත් නොහැකි විය. එවිට සඝමිත්තා මහරහත් තෙරණින් වහන්සේ දිවසින් බලා සියල්ල තේරුම් ගෙන ඉතා විශාල ගුරුළු වේශයක් මවාගෙන නාගයන් බිය වද්දවා ඔවුන් මෙල්ල කළහ. නාගයන් සඟමිත් තෙරණින්ගෙන් සමාව ඉල්ලා සතියක් පුද ජූජා පැවැත්වීමට බෝධීන් වහන්සේ නාග ලෝකයට රැගෙන යාමට අවසර පැතීය. ඒ අනුව බෝධීන් වහන්සේ නාග ලෝකයට වැඩම කරවා එහිදි නොයෙක් ආකාරයෙන් පුද පූජාවන්ට බඳුන් විය. ඉන් පසු නැව ලංකාවේ දඹුලු තොට නම් ස්ථානයට ගොඩ බැස්සේය.

දෙවන පෑතිස් රජතුමා නුවර උතුර දොරටුවෙහි පටන් දඹුලු තොට දක්වා මාර්ගය අලංකාරකර චතුරංගනී සේනාව සමඟ දඹුලු තොටට පෙරහරින් ගොස් පංච තූර්ය නාදයෙන් හා මල් සුවද විලවුන් ආදියෙන් පූජා පවත්වා කරවටක් දියට බැස බෝධීන් වහන්සේ හිසින් ගෙන අලංකාර මණ්ඩපයක තැන්පත් කර අශෝක අධිරාජයා අනුගමනය කරමින් මුළු ලංකාද්වීපයම බෝධීන් වහන්සේට පූජා කළහ. එහිදී දින 03 ම විවිධ පුද පූජා පැවැත්විය.

අනතුරුව බෝධීන් වහන්සේ නැගෙනහිර තිස්ස විහාරය පිහිටි තැනට වැඩම කරවිය. මිහිඳු හිමියන් විසින් උපදෙස් දෙන ලදුව බුදුන් වහන්සේ වැඩ සිටි තැන් වල දා ගැබ් ආදිය පිහිටවනු පිණිස ඒ ඒ තැන්වල බෝධීන් වහන්සේ මඳක් වැඩ හිඳ වූයේය. තිවක්ක නම් බ්‍රාහ්මණයාගේ ගම එවන් ස්ථානයකි.

මේ අයුරින් පෙරහරින් අනුරාධපුර නුවරට පැමිණි බෝධීන් වහන්සේ රෝපණය සඳහා විශේෂ පුද පූජා සහිත උත්සව සංවිධානය කෙරිණි. බෝධි ගුප්ත කුමාරයන් හා පිරිස රජ වෙස් ගත් අතර දෙවනපෑතිස් රජු දොරටුපාල වෙස් ගත්තේය. සඟමිත් තෙරණිය සමඟ පැමිණි සොළොස් කුලයට අයත් පිරිස විසින් බෝධීන් වහන්සේ රථයෙන් බිමට වැඩමවන ලදී. ඔවුන් අතින් මිදුණු බෝධීන් වහන්සේ අසූරියනක් අහසට පැන නැගී ෂඩ්වර්ණ රශ්මි මාලාවක් විහිද වූ සේක. මේ ප්‍රතිහාර්ය දුටු දසදහසක් බුදු සසුනේ පැවිදි වූහ. හිරු බැස ගිය පසු බෝධීන් වහන්සේ ආකාසයෙන් බැස රෙහෙණ නැකතින් භූමියේ පිහිටි සේක. ඒ වෙලෙහි මහපොළව කම්පා වූ සේක. රන් කටාරමෙහි සියලු මලු පිටතට විත් බිමට ඇද ගත්හ.

දෙවියෝ සාදු නාද දෙමින් දිව්‍යමය පංචතූර්ය නාද පැවැත්විය. ගිගුරුම් හා දහස් ගණන් විදුලි දහරා පැතිර ගොස් ඝන හිම වළාකුළු බෝධීන් වහන්සේ පිරිවරා රැස්විය. එසේ සත් දිනක් පැවතුණි. ඉන්පසු වළාකුළු වලින් මිදුණු බෝධීන් වහන්සේ දර්ශනය විය. මිහිඳු මා හිමියන්, සඝමිත් තෙරණිය හා දේවානම් පියතිස්ස රජතුමා ඇතුලු පිරිස රැස්වූහ. ඒ සියලු දෙනා බලා සිටියදීම බෝධීන් වහන්සේ නැගෙනහිර ශාඛාවෙන් පැලයක් ඉදිවී මිහිඳු හිමියන් දිගු කල අත මත පතිත විය. උන්වහන්සේ රජතුමා ලවා එය අන් කටාහයෙහි රෝපනය කරවූ සේක. සියල්ලම බලා සිටියදීම සතර රියන් පමණ වූ බෝ පැල 08 ක් පැන නැංගේය. මේ ප්‍රතිහාර්ය දුටු රජතුමා ස්වේත ඡත්‍රයෙන් පූජා කොට ත්‍රිශංඛයෙන් අභිශේක ජලය වත් කලේය. මේ බෝ පැල අට ,

01. දඹුලු තොට
02.කමක්ක නම් බ්‍රාහ්මනයාගෙ ගම
03. ථූපාරාමය අසල
04. හසුන්ගිරි වෙහෙර
05. ප්‍රථමක චෛත්‍ය ස්ථානය
06. සෑගිරිය
07. රුහුණේ කදරගම
08. රුහුණේ සඳුන්ගම

යන ස්ථාන වල රෝපණය කරන ලදි. ඉතිරි පැල 08 ගෙන්ම 04 බැගින් පැල 32 ක් ඇති විය. දෙතිස් එල වූහ. බෝධීන් නමින් මේවාද ස්ථාන 32 ක රෝපණය කරන ලදි.

01. මල් වැස්ස වෙහෙර
02. කොත්මලේ පුසුල් පිටිය
03. රුස්සරාම
04. තංගල්ලේ වනවාස විහාරය
05. තන්තිරිමලය
06. මායාරටේ වතුර
07. යාපව්ව
08. මාලිගම් වෙහෙර
09. මහා ජල්ලික කෙවුල්ගම
10. බෙලිගල
11. ඇඹලව
12.කහගල
13. කොට්ටියාරාම
14. රුහුණේ සගම
15. පැපිලිගන
16. පොතුගල් විහාරය
17. පොළොන්නරුව
18. විල්වල
19. මහියංගනය
20. බෙල්ලන්විල
21. මාතලේ රයිගම
22. වදුරව
23. විල්ගම් වෙහෙර
24. ගාල්ලේ පරගොඩ විහාරය
25. වට්ටාරාම
26. මුතියංගනය
27. මැද්දේගම
28. සුළුගල්ල
29. බුත්තල
30. ගණේගම
31. කටියාව
32. සිතුල් පව්ව

යනු එම ස්ථාන 32 ක වේ. දෙවන පෑතිස් රජතුමා මේ සෑම ස්ථානයක්හිම වෙහෙර විහාර ඉදිකර සියලු ලක්දිව බෝධීන් වහන්සේට පූජා කළහ. ඒ නිසාම ලංකාවාසී බෞද්ධයන් හැම දෙනෙක්ම අග්‍රගණ්‍ය දානාදියක්වේ නම් පළමුව පූජා කොට දෙවනුව තම ආහාරයට ගනු ලැබේ. එසේ නොමැති නම් පව් සිදුවේ යැයි අද දක්වාම බෞද්ධ සමාජය තුල විශ්වාසයක් ඇත.

සඟමිත් තෙරණිය මේ රටට වැඩමවීමේ පළමු අපේක්ෂාව වූයේ ලංකාදීපය තුළ මෙහෙණි සසුන ආරම්භ කිරීමයි. පැවිද්ද ලබනු අපේක්ෂාවෙන් කලක සිට ඊට ඇප කැප වී සිටි අනුලා බිසව ප්‍රමුඛ කාන්තා පිරිස සංඝමිත්තා තෙරණියගෙන් පැවිද්ද ලබාගෙන නොබෝ දිනකින් කෙලෙස් ප්‍රහීන කළහ. මේ අයුරින් ආරම්භ කරන ලද භික්ෂුණී සමාජය දුටුගැමුණු රාජ්‍ය කාලය වන විට ඉතාම දීප්තිමත්ව පැවතුනි. රුවන්වැලිසෑයේ කොත් පැළඳවීමේ මහා උත්සවයට භික්ෂුණීහු දාහතර දහසක් සහභාගී වූ බවත් මහා වංශයේ සඳහන් වේ. මිරිසවැටිය චෛත්‍යයේ කොත් පැළඳවීමේ පූජෝත්සව අවස්ථාවේදී රැස්වූ පිරිස අතර භික්ෂුණීහු අනූපන්දහසක් සිටි බව ථූපවංශයෙහි සඳහන් වේ. කාවන්තිස්ස

15 පිටුවට.....

පොතපත ඇසුරින්

# - ධම්මපදයෙන් -
# පව්කාරයා දෙලොවම තැවෙයි



සතුන් මැරීම, සොරකම් කිරීම ආදී පස්පව් දස අකුසල් කළ තැනැත්තා තමන් කළ පව්කම් සිහිකරමින් මෙලොවදී තැවෙන බවත් මෙලොවදී කළ කර්මවල විපාක වශයෙන් මරණින් මතු සතර අපායාදී දුගතිවල ඉපිද දුක් විඳින බවත් බුද්ධ දේශනාවේ සඳහන් වේ. මේ බව ප්‍රකාශවෙන දේශනා අතර ධම්මපදයේ යමක වග්ගයේ 17 වන ගාථාවෙන් කළ පැහැදිලි කිරීම ගැන අවධානය යොමුකරමු.

ඉධ තප්පති පෙච්ච තප්පති
පාපාකාරී උභයත්ථ තප්පති
පාපං මේ කතන්ති තප්පතී
භියෝ්‍ය තප්පති දුග්ගිතිං ගතෝ

ධම්මපදයේ ඇතුලත් සෑම ගාථා ධර්මයකටම යම් නිධාන කථාවක් පවතී. ඉහත දැක්වූ ගාථාව දේවදත්ත තෙරුන් වහන්සේ දුගතිගාමීවීම පිළිබඳ කළ දේශනාවකි.

අනෝමා නදී තීරයෙහි පිහිටි මල්ලරට අනුපිය නම් වූ අඹ උයනක බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කරද්දී අසූ දහසක් පමණ ශාක්‍ය වංශික කුමාරවරු පැවදිබව ලැබූහ. ඒ අතර සුවිශේෂී වූ කුමාරවරු හය දෙනෙක් වූහ. එනම්, භද්දිය, අනුරුද්ධ, භගු, කිම්බල, දේවදත්ත යන අයයි. මොවුන් අතරින් භද්දිය තෙරුන් වහන්සේ නොබෝ දිනකින් ත්‍රිවිද්‍යාලාභී වූහ. අනුරුද්ධ තෙරුන් වහන්සේ ද දිවැස් ලැබ රහත් වූහ. ආනන්ද කිම්බිල යන තෙරුන් වහන්සේලා ද පසුකාලීනව රහත්වූහ. දෙව්දත් තෙරුන් වහන්සේ රහත් නොවූහ. එහෙත් ලෞකික සෘද්ධිබල ලබා සිටියහ. එම සෘද්ධිබලය මහා බලයක් ලෙස පෙන්වා බිම්බිසාර මහරජපුත් අජාසත්ත කුමරු පහදවාගෙන නොයෙකුත් වැරදි මගපෙන්වීම් ලබාදුන්හ.

අජාසත්ත කුමරු සිය පියා ඝාතනය කොට පීතෲඝාතක අකුසල කර්මය සිදුකර ගත්තේය. බුදුන් වහන්සේ කෙරෙහි බැඳුණු දැඩි වෛරයක් නිසා බුදු පදවිය ලබා ගැනීම පිණිස විවිධ පාපකර්මවල යෙදුනු දේවදත්ත තෙරුන් සංඝ භේදය හා බුද්ධ ශරීරයේ ලේ සෙලවීම යන ආනන්තරිය පාප කර්මවල යෙදීම නිසා රහත් නොවී අවීචිමහා නරකයට පත්විය. ඒ සංවේගදායී අවස්ථාව මදක් සිහිකර බලමු.

බුදුන් වහන්සේ ඇතුළු මහා සංඝ පිරිවර කෙරෙහි පහන් සිත් ඇති සැදැහැතියෝ විවිධ අයුරින් උන්වහන්සේලා පිදූහ. අසූමහ ශ්‍රාවකයන් වහන්සේලා කෙරෙහි ද මහජන ප්‍රසාදය වැඩිවූහ. දෙව්දත් තෙරුන් කෙරෙහි කිසිදු ප්‍රසාදයක් නැත.

මේ බව දැන බුදුන්වහන්සේගෙන් භික්ෂු සංඝයා පාලනය කිරීමට වරමක් (අවසරයක්) ඉල්ලූහ. බුදුරජාණන් වහන්සේගෙන් එය ප්‍රතික්ෂේප විය. පසුව භික්ෂූන් වහන්සේලා කෙරෙහි පංචවරයක් පනවන ලෙස ඉල්ලා සිටියහ. එනම්

(i) භික්ෂුව දිවි හිමියෙන් ආරණ්‍ය ගත විය යුතුය.
(ii)භික්ෂුව දිවි හිමියෙන් රුක්ඛමූල ගත විය යුතුය.
(iii)භික්ෂුව දිවි හිමියෙන් මස් මාංශ අනුභව නොකළ යුතුය.
(iv)භික්ෂුව දිවි හිමියෙන් පිණ්ඩපාතික විය යුතුය.
(v)භික්ෂුව දිවි හිමියෙන් පාංශකූල චීවරය පමණක් දැරිය යුතුය.

ඒ සියල්ල ද බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ කල්හි සංඝ භේදය කොට ශ්‍රාවකයින් වහන්සේලා පන්සියයක් බුදුරජාණන් වහන්සේගෙන් වෙන් කරගෙන ගයා ශීර්ෂයට ගොසු විසූහ. පසුව අගසව් දෙනම එහි ගොස් උන්වහන්සේලාට නිවන් අවබෝධ කරවා රැගෙන ආහ. පසුව නව මසක් ගිලන්ව සිටි දෙව්දත් තෙරුන් බුදුන් දකිනු කැමතිව හඬා වැළපුනහ. දෙව්දත් තෙරුන් යහනක තබා භික්ෂූන් වහන්සේලා විසින් ඔසවාගෙන එන අතරතුර දෙව්රම් වෙහෙර සමීපයෙහි පොකුණ අසල පිපාසයට පැන් ඉල්ලා සිටියදී පැන් බීමට බිමට බසිත්ම පොළව පලාගෙන අවීචිමහා නරකයට ඇද ගෙන ගිය බව සඳහන් වේ. අවසන් මොහොතේ ඔහු බුදුන් සරණ ගියද කළ මහා පාපකර්මවල විපාකය බලවත් විය. මේ සිදුවීම පිළිබඳ සංවේගය පළකළ තථාගතයාණෝ ඉහත දැක්වූ දේශනාව සිදුකළහ.

මේ අනුව පව්කරන පුද්ගලයා මොලොවදී තැවෙයි. පරලොවද තැවෙයි. දෙලොවම තැවෙයි. මා විසින් පව්කරන ලදැයි සිහිකොට තැවෙයි. දුගතියට ගොස් බොහෝ සේ තැවෙයි. මෙහිදී දුගති ලෙස දැක්වෙන්නේ නරක, තිරසන්, ප්‍රේත, අසුර යන අපාය සතරයි. නරකය, සංජීව, කාලසූත්‍ර, සංඝාත, රෞරව, මහා රෞරව, තාප, ප්‍රතාප අවීචි යනුවෙන් අටවැදෑරුම් වේ. මේ නරකයන්හි පරිවාර නරක දාසයක් ද ඇත. සියළු නරකයන් එකසිය තිස් හතකි.

තිරිසන් යෝනියේ උපන් සත්වයෝ කාමයෙන් හා බියෙන් තැවෙන්නෝය. යමෙක් මෝහයෙන් මුළාවී අකුසල් කරයි ද ඔවුහු තිරිසන් අපායට පත් වී බොහෝ දුක් විඳිති. ප්‍රේත භවය සම්පූර්ණයෙන්ම සැපයෙන් තොර වූවකි. දන් නොදීම, ඊර්ෂ්‍යා කිරීම, ලෝභකම, දස අකුසල් කිරීම අනුන්ගේ ලාභ වැළැක්වීම, මව්පියන් කෙරෙහි විලිබිය නැතිබව, පින්කරන අයට හිරිහැර කිරීම, අනුන්නට පරිභව කිරීම, අල්ලස් ගැනීම, අගතියෙන් වැඩ කිරීම ආදී අකටයුතු මගින් ප්‍රේත ලෝකයෙහි උපදින බව සඳහන් වේ. ඔවුන් සා පිපාසා දෙකින් පීඩා විඳිමින් කෙළ සොටු මළ ආදිය කමින් දුක් විඳිති.

අසුර යෝනිය යනු මුවින් බැහැර උඩට හෝ යටට නෙරාගිය දත් පිහිටා ඇති සත්ව කොටසකි. දෙවියන්ට සතුරු වූ බැවින් අසුර නම් වේ. අසුරයෝ ප්‍රධාන වශයෙන් දෙකොටසකි. එයින් වේපචිත්ති නම් අසුරයන් දෙවියන් සමානව සැප විඳිති. කාලකඤ්ජ නම් අසුරයෝ දුක් විඳිති.

මේ අනුව මග වරදාගත් එවන් චරිත පිළිබඳව සිතා නිවන් මග සුචරිතවත් මාර්ගයක් ඔස්සේ පවතින බව තේරුම්ගෙන අපිදු අපායගාමී පිළිවෙත් අතහැර දුකින් මිදෙමු. විපත හා සැපත ඇස් මනාපිට පෙනී පෙනී පාපයන් තුළින් පහත් වින්දන නොලබා උතුමන් ඇසුරු කොට උතුම් පිළිවෙත් පිළිපැද සසරින් මිදෙමු.

කුරුණෑගල විශුද්ධායන විද්‍යායතන පිරිවෙන් ආචාර්ය
ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු


භද්‍රා කුණ්ඩලකේශී 12
සැකසුම හා චිත්‍ර..
- පාලිත -
....ථෙරී ගාථා ඇසුරෙනි.....
මැණියෙනි පියාණෙනි ඔබලාට පිං සිද්ද වෙනවා ..මා.. වෙනුවෙන් ..මේ.. කරන දේවල් වලට..
...සල්පිළි වලින් සැරසුණ... සත්තුක හා භද්‍රා කුමරිය සිටින ...සඳලු තලයට පැමිණියෝය...
සත්තුක
සිටු කුමාරි..
ඇයි ඔබ මාව මරණයෙන් ගලවාගත්තෙ
ඔබට.. තිබෙන ආදරේ නිසයි ඊදී ඔබව මරන්න ගෙන ගිය වෙලේ මා.. ඔබ දුටුවා.. ඔබේ ඔය රූප කායටත්.. හැඩි දැඩි සිරුරටත් මා වශී වුනා... සත්තුක.. මා.. ඒ මොහොතේමයි අදිටන් කර ගත්තේ.. ඔබව මගේම කරගන්න.....
නමුත්.. මා සොරෙක්.. කුමරිය..
ඒත් ඔබ.. රජතුමාගෙ අග්‍ර පුරෝහිත ගෙ පුත්‍රයා... ඔබ ඒක මතක තබාගන්න..
පියාණන් හා මැණියන් පවසා සිටියා.. සුදුසු දිනකදීම ඔබට මාව කරකාර බන්දා දෙන බවට...
මේ අවස්ථාවෙ මට ඉවසන්න වෙනවා..
ඔහ්.. ඇත්තද කුමාරි.. මමත් ..ඔබට හරිම ආදරෙයි.
ඉන් පසු.. අප කාටත් හොරෙන් මේ සිටු මැදුරේ අලුත් ජීවිතයක් පටන් ගනිමු සත්තුක...
ඔව්.. සත්තුක.. මමත් ඔබට හරිම ආදරෙයි.. හැබැයි.. මේ සිටු මැදුරෙන් පිටතට යන්න නම් හිතන්න එපා.. ඔබව.. හඳුනාගනී...




# ගමේ සුවඳ එකතු කරන් වරෙන් යාළුවේ....



පුර හඳත් එක්ක ඇවිත් යන්න
ඉඳහිටවත් මේ සිදාදියේ
අපේ ගමේ සුවඳ එකතු කරන් වරෙන් යාළුවේ

රෑ පානේ මුතු බේරෙන
මුතු ගානේ බැත මෝරන
නොනිදා හිනැහෙන කමතක් වගේ
මැඩුවන් සුවඳත් තුරුළු කරන් වරෙන් යාළුවේ

අරලිය මල් සිල් සුවඳට
නැලවෙන බෝපත් තාලෙට
රෑ නලියන වැව් කණ්ඩිය වගේ
පන්සලෙන් සාදු හඬක් අරන් වරෙන් යාළුවේ

ගේය පද - රතන කේ. ප්‍රේමසිරි.
තනුව හා සංගීත - එච්. එම්.ජයවර්ධන.
ගායනය - කරුණාරත්න දිවුල්ගනේ

සඳේ සෞන්දර්ය සැබවින්ම විඳගත හැක්කේ නගරයේදීද? ගමේදීද? මම ඔබෙන් අසන්නෙමි. ගමටත් නගරයටත් වෙනසක් නොදක්වා සඳ පායයි. එහෙත් නගරයේ දූවිල්ලෙන්, කර්ණ කඨෝරවූ විවිධ හැඬවල්ද සිතත් ගතත් වෙහෙසට පත් කරයි. අවිවේකී දිවාකාලයක් නිමකර නිවසට හෝ නවාතැන් පලට පැමිණෙන අප සොයන්නේ නිදි සුවයයි. නගරයේ විසල් ගොඩනැගිලි වලට ඉහළින් සඳවතිය සුපුරුදු ලෙස හිනහුනත් ඒ අසිරිය දක්නට විඳින්නට අවිවේකී නාගරික දිවිය අපට ඉඩ හසර ලබා නොදෙයි. සඳ එළිය පමණක් නොවේ. නාගරික ජීවිතය විසින් ජීවිතයේ තවත් බොහෝ දෑ සොදුරු දෑ වින්දනය කරන්නට ඉඩක් ලබා නොදෙයි. වින්දනය කළ යුතු දෑ වින්දනය නොකිරීමෙන් අපි, ජීවිතය විදවන්නන් බවට පත්ව තිබේ. නගරයේ ඉපිද නගරයේම දිවි ගෙවන ඇතමුන් තමන් විදවන්නෙකු බවට පත්වී ඇති බව නොහැගෙන්නේ ඔවුන්ට නාගරික පරිසරය සාමාන්‍ය කරණය වී ඇති නිසාය.

ගමේ වෙල් එළියේ, වෑ දියේ, බඩ වැටියේ සුන්දරත්වය නිදහසේ වින්දනය කළ පුද්ගලයකුට නගරයත් එහි ජීවිතයත් දැනෙනුයේ සිරගත ජීවිතයක් ලෙසිනි. එහෙත් ඒ නිසාම නගරය හැරදා ඔහුට යා නොහැක. රැකියාවත් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුත් නිසා අකමැත්තෙන් වුවද නගරයේ සිරගත වන්නට ඔහුට සිදුවේ.මඳ හෝ ඉසිඹුවක් ලැබෙන නිමේෂයේදී ඔහු සිත වැව් තාවුල්ලට, පන්සලට, වෙල්යායට දිව යන්නේ අසුරු සැනිනි.

ගමේ ඉපිද නගරයට සංක්‍රමණය වී එහි සිරගත වූවෙකුට ගමේ මිත්‍රයකු හෝ ඥාතියෙකු හමුවීම ප්‍රහර්ෂය දනවන්නකි. තම මිතුරා "පුරා හඳක" අසිරිය ගන්වන්නේක් බව පද රචකයා රූපනය කරන්නේ ඒ තුළින් සහෘදත්වය උතුරා යන නිසාමය.

නගරයේ කුණු කාණු වලින් නැගෙන දුර්ගන්ධයත්, වාහන වලින් පිටවන දුමත් වහන් කරන්නට කොතරම් සුවඳ විලවුන් ගැල්වුවත් සුවඳ දිය කර අවට පරිසරයට ඉසුවද පලක් නැත. ස්වල්ප මොහොතකින් කසළ වල දුර්ගන්ධය යළිත් මතුවෙයි. ගමේ වෑ දියේ, වෙල් යායේ, පන්සලේ, නැවුම් පසේ සුවඳ, මොහුට සිහිනයක්ම පමණකි. ගමේ සුවඳ, සහෘද බවත් අරගෙන නෑදෑයෙක් මිත්‍රයෙක් පැමිණෙනවානම් කොතරම් අපූරුද?

ගීතයේ වාචාර්ථය මතු පිටින් මෙලෙස විග්‍රහ කළද එහි ව්‍යංගාර්ථය ගැඹුරු සංකල්පනාවක් ඉදිරිපත් කරයි. මුදල් මතම යැපෙන නාගරිකයන්ගේ ජීවිතය අතිශය කටුකය. මේ නිසාම තම යහ ගුණ පවා උකසට තබා මුදළට විකිනෙන්නට නාගරිකයන්ට සිදුව තිබේ. ඔවුන්ගේ මේ සංකීර්ණ දිවි පෙවෙත නිසා ඖවුන් සතු යහපත් සමාජ ආචාරධර්මයන් ඔවුන් වෙතින් වියකී ගොසිනි. එහෙත් සරල ගැමි සමාජය තුළ තවමත් යහ ගුණදම් ආචාරධර්ම රැඳී පවතී. ගීතයේ "පුරහඳ" තුළින් නිරූපනය වන්නේ අවංක සුහඳශීලී, නිර්ව්‍යාජ සමීප සම්බන්ධතාවලින් යුතු ගැමි සමාජයේ අ2නුරුවයි.

කාල් මාක්ස් සිය පරාරෝපන න්‍යායෙන් පෙන්වා දුන්නේ නාගරික කාර්මික සමාජය තුළ පුද්ගලයා තම තමාගෙන්ද සමාජයෙන්ද පවුලෙන්ද පරාරෝපනය හෙවත් යාන්ත්‍රික ඒකාබද්ධ සමාජයක් බවට ගොඩ නැගෙන විට සදාචාරී පර්යාව බිඳවැටී ධර්මතා පිරිහෙන සමාජයක් ගොඩනැගෙන බවයි.

අයාසකර සබඳතාවලින් ගහන සාමූහික බැඳීමක් නැති, සහ සදාචාරධර්ම ගලිහුණු සමාජයක අසීරුවෙන් පය ගසා සිටින පුදුගලයකුට තම ගැමි මිතුරා "පුර හඳක්" ලෙස පෙනෙයි. "ගමේ සුවඳ" යනු යහගුණ ධර්මයන්ය. ගමේ සහ සමාජ ධර්මතා ගෙනැවිත් අදුරුවූ නාගරික ජීවිතය සුවඳවත් කළ හැකිනම් කොතරම් අපූරුද?

අස්වනු නෙලීමෙන් පසු කමකේ ගොඩ ගන්නේ ගොවියන්ගේ වෙහෙස මහන්සියේ ප්‍රතිඵලයයි. "මුතු ගාන් බැත මෝරන" යනු දහදිය, මහන්සිය, කැපවීමේ තරමට වී අස්වැන්න ලැබෙන බවයි. සහල් මුතු ඇට වන්නේ එය මුළු මහත් රටකම වැසියන්ගේ කුසගිනි නිවන නිසාය. එමෙන්ම මුතු ඇට වන් සහල් නිපදවන්නේ ගැමියාගේ සාමූහිකත්වය. සෙනෙහස, කැපවීම තුළිණි.

නාගරිකයාට තම ගැමි මිතුරා "නොනිදා හිනැහෙන කමතක්" සේ පෙනේ. කමතක ඇත්තේ කැපවීම, සහෘදත්වය, එකමුතු බව හා සෙනෙහසයි. ගැමි යහපැවැතුම් රැගෙන එන මිතුරා නොනිදා හිනැහෙන කමතක් සේම නගරයේ සිටින මොහුට අසීමිත සැනසුමක් ගෙන එයි.

අරලිය එල් සුවඳ කැටිවුණු සිල් සුවඳත්, නැලවෙන බෝ පත් වල සිසිලසත්, සාදු! සාදු! හඬත් හදවතට ගෙන එන්නේ ආධ්‍යාත්මික සුවයකි.

වෑ කණ්ඩිය රාත්‍රියට නලියන්නේ කෙසේ දැයි ඔබට සිතෙනු ඇත. පොහෝ දිනට රාත්‍රියට වෙනදා නිහඬව නිසලව සිටින වෑ කණ්ඩිය පණ ලබයි. සුදෝ සුදු වතින් සැරසුණු ගැහැණුන්, පිරිමින්, ළමා ළපටියන්ගේ හඬින් වෑ කණ්ඩිය පිරෙයි. වැවෙන් එතෙර පන්සල වෙත ඇදෙන ජනයාගෙන් ඔවුන්ගේ සෙවණැළි වලින් වෑ කණ්ඩිය නලියයි. රාත්‍රියට නලියන වෑ කණ්ඩිය සේ ගැමි ජීවිතයේ සජීවි බවත් මිතුරා රුගෙන එයි.

ගේය පද රචක රත්නායක කේ. ප්‍රේමසිරිගේ පද සංකල්පනාවට අනුභූතිය වූයේ අලුත් සහල්, මල්ලක් රුගෙන තම උපන් ගමේ සිට පැමිණි තම මිතුරාගේ හමුවයි. ගේය පද රචනාව තුළ ව්‍යාංගාර්ථවත්,රූපක සහිත බස් වහරක් අනුරූපීව යොදා ඇති අයුරු පෙනේ. පද රචකයා තම පුද්ගලානුභූතිය ගමේ උපන් නගරයේ සිරගතව සිටින මිනිසුන්ගේ පොදු අනුභූතියක් බවට පෙරළා ගීතමය බසකින් ප්‍රකාශ කරයි. එය ග්‍රාමීය. නාගරික බේදයකින් තොරව සියලු සහෘදයන්ගේ හදවත් සංවේදීව ස්පර්ශ කරයි.

කරුණාරත්න දිවුල්ගනේගේ හඬින් නිරුත්සාහයෙන් මතු වන්නේ ගැමි අව්‍යාජත්වය පරිපූර්ණ හඬකි. ඒ නිසාම මේ ගීතය අප හදවතේ දිවුල්ගනේගේ හඬින් සුසංවේදී වෙයි. එච්. එම්. ජයවර්ධන නම් ප්‍රතිභාපූර්ණ සංගීතඥයාගේ තනුව හා සංගීතය ගීතයේ සාර්ථකත්වයට හේතුවී ඇති බව ගීතය සවනත වැකෙන හැම මොහොතකම අපට හැගේ.

චාමිකා ජනානි ද සිල්වා



# බුදුදහම තුළින් ගෘහස්ථ හා සාමාජික දියුණුව

සමාජයේ කුඩාම ඒකකය වන්නේ පවුලය.

අඹු සැමියන් මුල් කරගනිමින් එය සකස් වේ. අඹු සැමියන් හා ඔවුන්ගේ දරුවන්ගෙන් යුක්ත ගෘහ ජීවිතය යහපත් කරගැනීම සඳහා එබඳු පවුල්වලින් යුක්ත සමාජය උදෙසා බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද දේශනා විවිධ සූත්‍ර ධර්මවල අන්තර්ගතව ඇත.

පවුලේ නායකත්වය ගෘහ ජීවිතයේ දියුණුව හෝ පිරීම කෙරෙහි බලපානු ලබයි. ආර්ථික වශයෙන් සමෘද්ධියට පත් වූ පවුලක පිරිහීම සඳහා හේතුවන මූලික කරුණු හතරක් අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ කුල සූත්‍රයේ සඳහන් වේ. දුස්සීල වූ කාන්තාවක හෝ පුරුෂයෙකු එම පවුලේ ප්‍රධාන ත්වයට පත්වීම ඉන් එකකි. මෙහි දුස්සීල යනුවෙන් අදහස් වන්නේ විවිධ දුසිරිත්වල ඇලුණු බවය. කාමඅපචාර, සූදුව, සුරාව, වංචාව, හිංසාව ආදියට යොමු වූ තැනැත්තාට නිවසක් පාලනය කිරීමට හැකියාවක් නොමැත. එවිට පවුලේ අනෙක් සාමාජිකයන්ද දුසිරිතට ලොල් වේ.

සුරා, සූදුව, කාමසේවනය ආදියට ප්‍රධානත්වයට පත් කරගැනීම පිරිහීමේ දොරටුවක් බව සුත්ත නිපාතයේ පරාභව සූත්‍රයේද සඳහන් වේ. පවුලක් දියුණුවීමට එම පවුලට චරිතවත් පුද්ගලයෙකුගේ නායකත්වය ඒ අනුව ඉතා වැදගත්වේ.

පවුලේ ආර්ථික ශක්තිය ගෘහ ජීවිතයේ දියුණුව උදෙසා අතිශයින් බලපානු ලැබේ. එහෙයින් එම ශක්තිය ආරක්ෂා කරගැනීමට ගත යුතු පියවර පිළිබඳව බුදුදහම මඟ පෙන්වා අත. ධනය ඉපැයීම පමණක් ප්‍රමාණවත් නොවන අතර එහි සුරක්ෂිතභාවය ද වැදගත්ය. කිසියම් පවුලක් සතු දෑ නැතිවන විට ඒ වෙනුවට අලුතින් රැස්කිරීම් නොකෙරෙන්නේ නම් එම පවුල පිරිහීමට ලක්වන බව කුල සූත්‍රයේ සඳහන් වේ. ආහාරපාන, ඇඳුම් පැළඳුම් ආදිය සඳහා අධික වියදම් කිරිම පවුලේ පිරිහීමට හේතුවන්නක් බව එම සූත්‍රයේම සඳහන්ව ඇත.

පවුල් සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය ලෙස සුහද සබඳතාවක් පැවතීමද ගෘහස්ත ජීවිතයේ සාර්ථකත්වයට ඉතාමත් වැදගත්ය. මවුපියන්ගෙන් දරුවන්ට හෝ දරුවන්ගෙන් මවුපියන්ට හෝ ඉටුවිය යුතු යුතුකම් කුමන පාර්ශවයකින් හෝ ඉටු නොවුනහොත් එම පවුල තුළ මනා දූ දරු මවුපිය සබඳතාවයක් ඇති නොවේ. එමෙන්ම බිරිඳගෙන් සැමියාට හෝ සැමියාගෙන් බිරිඳට හෝ ඉටුවිය යුතු යුතුකම් ඔවුන් දෙදෙනාගෙන් එක් අයෙකුගෙන් හෝ ඉටු නොවුනවිට මනා ස්වාමිභාර්‍යා සබඳතාවක් ඇති නොවේ. මේ පිළිබඳව සිඟාලෝවාද සූත්‍රයේ මනාව දක්වා ඇත.

අඹුසැමි යුවල තුළ පැවතිය යුතු ගුණාංග පිළිබඳව සිඟාලෝවාද සූත්‍රයට අමතරව අංගුත්තර නිකායේ සමජීවි සූත්‍රයේ සඳහන්ව ඇත. යුගදිවිය සාර්ථකවීම සඳහා සැමිය හා බිරිඳ දෙදෙනාම ශ්‍රද්ධාවෙන් ශිලයෙන් ත්‍යාගශීලිත්වයෙන් හා ප්‍රඥාවෙන් සමාන තත්වයක සිටීම වැදගත්වන බව එහි දැක්වේ.

සංවාස සූත්‍රයට අනුව අඹුසැමි දෙදෙනාම අශිලාචාර වුවහොත් ඒ දෙදෙනාගේ එකතුව මළමිනී දෙකක එකතුවක් සමානය. ධාර්මික වූ ජීවිතයකින් හෙබි පුරුෂයා සමඟ නම් එහි ඇත්තේ දෙවඟනක සමග මළමිනියක් එකතුවීමකි. අඹුසැමි යුවලම ධාර්මික නම් එවිට දක්නට ඇත්තේ දෙවියෙකුගේ හා දෙවඟනකගේ එකතුවකි.

වේළුද්වාර සූත්‍රයේ සඳහන් වන අත්තූපනායික ධර්ම පරියාය ද සමාජික දියුණුවට උපකාරවන ඉගැන්වීමකි. තමා විඳීමට අකමැති වේදනා අන් අයට විඳීමට සැලසීමෙන් වැළකීම එම ධර්ම පරියායෙන් සිදුවේ. යම් අයෙක් තමාට අයත් දෙයක් සොරකම් කරයි නම් එයට තමා අකමැතිය.

තමා අනෙකාට අයත් දෙයක් සොරකම් කරන්නේ නම් හෙතෙම ද ඊට අකමැතිය. යනාදීන් කල්පනා කර තමාත් සොරකමින් වැළකේ. අන් අයද සොරකමින් වළක්වයි. සොරකමින් වැළකීමේ වටිනාකම කියාදේ. මෙසේ සිදුකරන විට ක්‍රියාත්මක වන අත්තූපනායික ධර්ම පරියාය සමාජයේ සියලු සාමාජිකයන් අනුගමනය කළ හොත් සාමාජික වශයෙන් විශාල දියුණුවක් සැළකේ.

වසල සූත්‍රයේ සඳහන්වන ඇතැම් වසලකරන ධර්ම සාමාජීය දියුණුවට බාධාකාරීය. ණය හිමියෙකු ණයකරුවෙකුගෙන් තම ණය මුදල ආපසු ඉල්ලු විට මා ඔබගෙන් ගත් ණයක් නැතැයි ණය ගෙවීම වංචනික ලෙස පැහැර හැරීම, බැහැර නිවසකට ගිය විට තමාට ආහාරපානවලින් හොඳින් සංග්‍රහ කළ අයෙකු තම නිවසට පැමිණිවිට පෙරලා ඔහුට සංග්‍රහ නොකර සිටීම ආදිය ඒ අතර වේ.

මෙබඳු පුද්ගලයන් තුළින් ඉවත්වීම සාමාජික දියුණුව උදෙසා වැදගත් බව බුදුදහම පෙන්වා දේ. මේ අනුව ගෘහස්ත හා සාමාජික ජීවිතයේ දියුණුව සඳහා මඟපෙන්වන උපදෙස් රාශියක් බුදුදහම තුළ අඩංගු වී ඇති බව පෙනී යයි.

පී.පී.දේශාන් තාරුෂික ගමගේ
ගොඩගම

# ධන සම්පත් නිසා ගිලිහුන මනුස්සකම

මිනිසා පරිභෝග කරන වස්තූන් අතර ධන සම්පත් ප්‍රධානත්වයක් ගනු ඇත. මිල - මුදල්, යාන - වාහන, හරක - බාන, වතු - පිටි, ඉඩ - කඩම්, රන් - රිදී, මුතු - මැණික්, ආදී සියලු වස්තූන් මිනිසාගේ දෛනික අවශ්‍යතා උදෙසා භාවිතා කරනු ඇත. ඒ සියල්ල ලබාගැනීම උදෙසා සත්වයා බොහෝ වෙහෙසෙනු ඇත. උපතේ පටන් මියෙන තුරා වෙහෙසෙන්නේ භෞතික වස්තු සම්පත් උදෙසාය.

කාලීන වශයෙන් ගත් කල්හි අද බොහෝ දුරට ධනයට මුල් තැනදී ඇත. ධනය ඇත්නම් ඔහු සියලු දේ තුළින් පරිපූර්ණ කෙනෙකු ලෙස දැකීමටද පුහුදුන් සත්වයා හුරුවි ඇත. මිල මුදල් සෙවීමට වෙහෙසීම කොතරම් දුරට උග්‍ර වි ඇද්ද යන්න ඒ ඒ ජීවිත වල අභ්‍යන්තරය පරීක්ෂාකර බැලීමෙන් ප්‍රත්‍යක්ෂ වේ. හරියට ආහාර පානවත්, ඇඳුම් පැලඳුම්වත් පරිභෝග නොකර ධනයම ඉපයීමට සත්වයා හුරුවී තිබේ. මේ පිළිබඳ සාකච්ඡා කළ යුත්තේ ධනය පසුපසම හඹා යන පුද්ගලයන් තුළ ගුණධර්ම, යුතුකම් ක්‍රම ක්‍රමයෙන් ගිලිහී ඇති බැවිනි.

බුදුන් කල මුදල් වෙනුවට කහවණු භාවිතා කරන ලදී. ධනය සම්බන්ධව බුදු හිමිගේ දෘෂ්ඨිය සඳහන් වන පුවතක් බුද්ධ චරිතය තුළ ප්‍රකට වේ.

වරක් සැවැත්නුවර ධන වතකුගේ ගෙයක් බිඳ මුදල් සොරාගත් සොර කණ්ඩායමක් එම රාත්‍රියේම අසල කුඹුරකට ගොස් සොරගත් මුදල් බෙදා ගනිද්දී ඔවුන් අතින් එක් මුදල් පොදියක් කුඹුරේ වැටී තිබිණ. කුඹුරු හිමි ගොවියා උදෑසන සිරිත් පරිදි කුඹුරට ගොස් කුඹුර සාන්නට පටන් ගත්තේය. අළුයම කරුණා සමාපත්තියට සමවන් බුදුරජාණන් වහන්සේ මේ අහිංසක ගොවියා කරදරයට පත්වන බවත් ඔහුට පිහිට වීමට හැකිබවත් දැන උදෑසනම ආනන්ද තෙරුන් සමඟ ගොවියා කුඹුර සාමින් සිටි ස්ථානයෙන් වැඩම කරන්නේ කුඹුරෙහි වූ මුදල් පොදිය දැක ආනන්ද තෙරුන්ට කථාකර "ආනන්ද, සර්පයෙක් දුටුවෙහිදැයි විමසූහ. "ස්වාමින් දුටුමියි" කියා පිළිතුරු දුන් ආනන්ද තෙරණුවෝ පසුම්බිය දකිමින්ම බුදුරදුන් පසුපස වැඩම කළහ. මේ කථාව අසා ගොවියා සීසෑම නතර කර සර්පයා කොහිදැයි විමසන්නේ මුදල් පසුම්බිය දැක "බුදුරජාණන් වහන්සේ මෙයට සර්පයෙකැයි" ප්‍රකාශ කළේ කිසියම් හේතුවක් නිසා වියයුතුයැයි සිතා එය රැගෙන පෙනෙන ස්ථානයක තබා සීසාන්නට පටන් ගත්තේය. ගෙහිමියෝ සොරු සොයා ඒ මේ අත යන්නේ කුඹුරෙහි වූ සලකුණු දැක විමසන විට මුදල් පසුම්බිය දැක හැඳින ගොවියා ගැන සැක උපදවා ඔහුව රජුට අල්වා දුන්හ.

රජු ඔහුව මැරවීමට නියම කළේය. වධකයෝ ඔහු වධක ස්ථානය කරා ගෙන යද්දී "ආනන්දය සර්පයා දුටුවාද? ස්වාමීනී, දුටිමි" යි යන්න දිගටම කියන්නට වූයෙන් කුමක් නිසා එසේ කියන්නේදැයි රාජ පුරුෂයෝ ඔහුගෙන් විමසූහ. "රජු ඉදිරියට ගෙන ගියහොත් කියමි" යි ඔහු කීයෙන් ඔහු වහා රජු ඉදිරියට පමුණුවන ලදී. එවැන්නක් කීමට හේතු කවරේදැයි රජු ඔහුගෙන් විමසිය. උදෑසන බුදුරදුන් කුඹුර මැදින් වඩනා ගමනේදී එසේ කී පුවත ඔහු රජතුමාට හෙළි කළේය.

එදින සන්ධ්‍යාවෙහි ගොවියා ද රැගෙන රජතුමා විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේගෙන් මේ ගැන විමසීය. බුදුහු කුඹුර මැදින් වැඩම කළ බවත්, ආනන්ද තෙරුන්ට මුදල් පොදිය පෙන්වා සර්පයෙැයි ප්‍රකාශ කළ බවත්, බුදුහු රජතුමාට විස්තර කළහ. ස්වාමීනි, "මේ සිද්ධිය නොවුණි නම් මේ අසරණයාගේ ජීවිතය අද විනාශ වන්නට තිබිණි. ඔබවහන්සේ නිසා අද ඔහු ජීවිත දානය ලද්දේයැ"යි ප්‍රකාශ කළේය. බුදුරදුන් මේ සිද්ධිය මුල්කොට දෙසූ දහම අසා ගොවියා සෝවාන් වූයේය.



මෙම කතා පුවතින් පැහැදිලි වන්නේ මුදල් සර්පයෙකුට උපමා කර තිබීමය. මුදල් පසුපස හඹා යෑමේදී ගුණ ධර්ම පසකට දමනු ඇත. පුහුදුන් සත්වයාට මුදල් සෙවීමේ ඇතිවීමක් කිසිදා ඇති නොවේ. පැරණි සමාජය තුළ පැවැතියේ ධාර්මික ජීවන ප්‍රතිපදාවකි. අපේ රටේ ඉතිහාසය පරිශීලනය කර බැලීමෙන් ඒ බව මනාව පැහැදිලි වේ. පැරණි වැසියා ආගන්තුක සත්කාරයට මුල් තැනක් දුන්හ. දානය, ප්‍රියවචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය යන සංග්‍රහ තුළින් පිරිපුන් වූහ. කරුණාව, දයාව, මෛත්‍රිය වර්ධනය කළහ. කළගුණ සැලකීම, මව්පිය උපස්ථානය, අසරණ අයට සැලකීම වැනි උතුම් ගුණාංග වලින් ජීවන ගමන් මඟ සැළසුම් කොටගෙන එය ප්‍රායෝගික ජීවන මාර්ගයට සම්බන්ධ කරගත් ආකාරය ඉතා අගනේය. නුමුදු අද සමාජය දෙස බැලීමේදී එම උසස් ගුණාංග වලපල්ලට දමා මුදල් පසුපසම හඹා යමින් මිනිසත්කමේ වටිනාකම පවා අමතක කොට ඇත.

මුදල් මත හඹා යන අද සමාජය තුළ කරුණාවක්, දයාවක්, ඉවසීමක් නැත. දෙමව්පියන්ට සැලකීම, වැඩිහිටියන්ට සැලකීම, කළගුණ සැලකීම, අසරණයින්ට පිහිටවීම වැනි උතුම් ගුණාංග ක්ෂය වී යමින් පවතී. ඒ සියලු දෙයටම හේතුව වී ඇත්තේ අද මුදල් වලට මිනිසත්කම පවා පරදුවට තබා ප්‍රමුඛස්ථානය දී තිබීමය.


කෙනෙකුට කෙනෙක් පරයා ඉහළට යෑමට කරන උත්සාහය තුළ තරඟකාරී ස්වභාවයකින් සටනක් බිහිවි ඇත. මුදල් මත ජීවිත පවා විනාශ කිරීමට තරම් සමහර පිරිස් අඥාන වී ඇත.

සමාජයේ සෑම අංශයක් දෙසම බැලීමේදී එම තරඟකාරි ස්වභාවය දැකීමට පුලුවන. මුදල රජ වී ඇත. ගුණධර්ම කැලෑ වැදී ඇත. උසස් මනසක් ලැබූ සත්වයා මිනිසා වුවද සමහර තැන් වලදී තිරිසන් සත්වයින්ටත් අන්ත විධියට කටයුතු කිරීමට පෙළඹෙනු ඇත. මුදල්, ධන සම්පත්, පරිහරණ කරන අඥාන සත්වයින්ට මිනිස්කමේ වටිනාකමක් නොපෙනෙනු ඇත. දුර්ලභව ලබාගත මිනිස් දිවියේ ඇති වටිනාම නොතේරීමට තරම් අන්ධ වී ඇත. පංචකාම සම්පත් තුළම ඇලී ගැලී මිරිඟුව පසු පස හඹා යන මුව පෝතකයින් බවට පත්වී ඇත.

බුදුහිමි ව්‍යග්ගපජ්ජ සූත්‍රය තුළින් ගිහි ජීවිතයක් ගතකරන අයුරුත් ධන සම්පත් පරිහරණය කරන අයුරුත් දක්වා ඇත. නමුදු එහි නොපෙනෙන පැත්ත පිළිබඳවද අවධානය යොමුකොට ඇත. සෑම දෙයකටම දෙපැත්තක් ඇති බැවින් අප අන්තයකට වැටීමට තරම් අඥාන නොවිය යුතුය. හොඳ - නරක, කුසල් - අකුසල්, මෙලොව - පරලොව මේ ආදී වශයෙන් සිතා බැලිය යුතුය. පුහුදුන් සත්වයා කාමභෝගී ජීවිතයක් ගතකිරීමේදී ඒ ගැන ද නිරන්තරයෙන් සිතිය යුතුය.

බුද්ධ චරිතයෙන් ඒ සම්බන්ධව අවශ්‍ය පිටුවහල ලබාගත යුතුය. ඉපදී ටික කලක් ජීවත් වී මරණයට පත්වන සත්වයා එම ජීවිත කාලය තුළ සිතිය යුත්තේ අවසන් ගමන යෑමේදී කුමක්ද ගෙන යා යුත්තේ හා මොනවද අප පසු පස්සෙ ගමන් කරන ධන සම්පත් යන වගය. අපට භෞතික ධනය වස්තුව ගෙන යෑමට නොපුළුවන. එබැවින් ඒ මතම ඇලී ගැටී මනුස්සකම, ගුණධර්ම අමතක නොකිරීමට වගබලා ගත යුතුය. ශ්‍රද්ධා, ශීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤා ආදී ආධ්‍යාත්මික ගුණ වගාව දියුණු කරන ඊළඟ ආත්මභාවය යහපත් කරන ධනයම වර්ධනය කරගත යුතුය. එසේ වර්ධනය කොටගෙන දුර්ලභව ලැබූ මිනිසත්කම ගුණධර්ම තුළින් ඔපවත් කර ගැනීමටත් මිනිසත්කම රැකගැනීමටත් පුණ්‍ය ශක්තියෙන් පොහොසත් වීමටත් අධිෂ්ඨාන කර ගැනීමම උතුම් වන්නේය.

**පූජ්‍ය ගලගෙදර රතනවංශ හිමි**



# පරිසරය සමග බැඳුණු බෞද්ධ සිරිත් විරිත්

පරිසරයේ ඇති වැදගත්කම ලෝකයාට අවබෝධකර දුන් ශාස්තෲන් වහන්සේ අපගේ බුදුරජාණන් වහන්සේය. සොබා දහමින් බැඳුනු පරිසරය උන්වහන්සේ වර්ණනා කල සේක. ''රමණීයානි අරඤ්ඤානි, යත්ථති රමණීමනෝ '' යන බුදු වදනින් එය පැහැදිලි වේ. එයට ප්‍රධාන හේතුවනම් පරිසරය මිනිසාගේ කායික හා මානසික සුවයට බලපාන බැවිනි. සිත පිරිසිදුකර ගැනීමට ශාන්තවූත්, සුන්දරවූත් පරිසරය බලපාන්නේය. බාහිර පිරිසිදුකම සඳහා ශරීරය පිරිසිදුව තබාගැනීම, ඇඳුම්, පැලඳුම් පිරිසිදුව තබාගැනීම ඉතා වැදගත් වෙයි.

ඒ සඳහා බෞද්ධ ජනතාවට බුදුදහමින් ලැබෙන උපදෙස් ඉතා වැදගත්ය. භික්ෂූන් වහන්සේලාගේ එදිනෙදා ජීවිත සකස් වී ඇත්තේද එම උපදෙස් හා අවවාද අනුවය. උදැසනින්ම අවදිවන භික්ෂූන් වහන්සේ, තම කාමරය සකස්කොට එය පිරිසිදුකර මලු පෙත්මන් හැමදීම සිදු කරනු ලබයි. ඉන් පසු ශරීරය පිරිසිදු කරගෙන මල් කඩා විහාර වන්දනාකර, තෙරුවන් නමදියි. තම ගුරුවරයාටද වන්දනා කිරිම සිදුකරනු ලබයි.

ඉන්පසු දන් වැලදීමත් අනතුරුව ධර්මයෙහි යෙදීමත් දක්නට ලැබේ. බෞද්ධ ගිහි ජනතාවට බෞද්ධ භික්ෂූන් වහන්සේ අනුගමනය කරමින්, තම ජීවිතය හැඩගස්සා ගැනීමට හැකියාව තිබේ. විහාරස්ථානයකට ඇතුල්වන කෙනෙකුට තම සිතත්, ගතත් මනා කොට සංවර ගැනීමට හැකියාවක් ඇතිබව කිව හැකිය. විහාරස්ථානය ආදර්ශයට ගෙන තම නිවසත්, ඒ අවට ඇති පරිසරයත්, සුන්දරත්වයට පත්කර ගැනීමට හැකියාව පවතී. නිවසට යන පාරද, පිරිසිදුකර ගැනීමද වැදගත්ය. පාර දෙපස මල්ගස් සිටුවා ඒවා ආරක්ෂාකර ගැනීමෙන්, පූජාවට අවශ්‍ය මල් නෙලාගැනීමටද, අවස්ථාව උදාවේ.

නිවසේ ඇති ගෘහ උපකරණ නිසි පරිදි තැබිමද, ඒවා සතියකට වරක් හෝ පිරිසිදු කිරීමද, කල යුතුය. ඉවතලන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා බඳුනක් තැබීමද, එය ඉවත් කිරීම නිසි පරිදි සිදුකල යුතුවේ. දිනපතා අඳින ඇඳුම් සෝදා පිරිසිදුකර, තබා ගැනීමද වැදගත්ය. පළඳින පාවහන්, නිවසට ඇතුල්වනවිට ගලවා සුදුසු තැනක තැබිය යුතුය. අන් අයගේ නිවෙස්වලට යනවිටද ගෙයි ඇතුලත පාවහන් පැළඳීමෙන් වැලකී සිටිම හොඳ සිරිතකි.

ඊලගට වැදගත් වන්නේ, වැසිකිළි කැසිකිළි පද්ධතියයි.භික්ෂූන් වහන් සේලාගේ විනය ශික්ෂා පද මඟින්ද, මෙය තහවුරුකර තිබේ. වැසිකිළිවත නමින්ද වත්පිළිවෙලක් සකසා තිබේ. එය සෑම භික්ෂූවක් විසින්ම පිළිපැදිය යුතුබවට විනයනීති පනවා තිබේ. බුදුරජාණන් වහන්සේ දහවෙනි (10) වස පාරිලෙය්‍ය වනයට වැඩම කෙලේද, භික්ෂූන් වහන්සේලා දෙපිරිසක් අතර ඇතිවූ, වැසිකිළි පාවිච්චි කිරීමේදී සිදු වූ වැරදි පිළිවෙලක් හේතු කොටගෙනය. වැසිකිළිය පාවිච්චිකිරීමෙන් පසුව එය පිරිසිදු කලයුතුය. වතුර ලබාගත් භාජනය, අවසානයේ මුනින් නැමිය යුතුය. වැසිකිළියක දොර වසා ඇති විටක දොරට තට්ටුකර විමසා බලා ඇතුල්වීම කලයුතුය.

වෙනත් කෙනකුගේ නිවසක කාමරයකට ඇතුල්වීමට පෙර දොර වසා ඇත්නම්, පළමුව දොරට තට්ටුකර කෙනෙකු සිටිදැයි විමසා බැලිය යුතුය. ඇතුලත කෙනෙකු සිටීනම් ඔහුගේ හෝ ඇයගේ අවසරය ලැබෙන තුරු එහි රැදී සිටිය යුතුය. අවසරය ලදවිට ඇතුල්විය යුතුය. වැඩිහිටි කීප දෙනෙක් කථා කරමින් සිටින තැනකට අවසරයක් නොලබා එකවරම එතැනට නොයා යුතුය. අවසර ලැබීමෙන් පසුව එතනට යායුතුය. පරිසරයේ ඇති ගස්, වැල් කඩාදමා විනාශ කිරීමට කිසිවෙකුට අයිතියක් නැත.භික්ෂූන් වහන් සේලාටද ගස්වල අතු, කොළ, කඩීම විනයෙන් තහනම් කර ඇත. බුදුරජාණන් වහන්සේ තමන්ට සෙවන ලබාදුන් ඇසතු රුකට සතියක් මුළුල්ලේ අනිමිස ලෝචන පූජාව පැවැත්වීම සිදුකර ඇත්තේද, ලෝකයාට ආදර්ශයක් ලබාදීම සඳහාය.



ගංගා ඇල දොලවල් අපවිත්‍ර කිරීමද, නොකළයතු බවට බුදු දහමෙහි සඳහන්කර ඇත. ඒවා ආරක්ෂා කිරීමත්, පිරිසිදුව තබා ගැනීමත් වැදගත්වන බව ද එහි දක්වා තිබේ.

වර්තමාන සමාජය දෙස බලනවිට පෙනීයන්නේ, පරිසරයට හානිකර සිදුවීම්වලින් යුක්තවන බවයි. ගස්, වැල් කපා දැමීම ගංගා, ඇල දොලවලට අපද්‍රව්‍ය දැමීම. කැලෑගිනි තැබීම. කසල පරිසරයට දැමීම, යන මේවා විශේෂයෙන් දැකිය හැකි වේ. පරිසරයට හානි පමුණුවන්නා දේශද්‍රෝහියෙක් ලෙසට හැඳින්විය හැකිය. බුදු දහමෙන් ඉගැන්වෙන පරිසරය සමග බැදුණු සාරධර්ම අප හදවත්තුලට දැනෙන සේ අවබෝධ කොටගෙන එය ක්‍රියාත්මක කළ යුතුය. එවිට සුන්දර ලෝකයක් නිර්මාණය කර ගත හැකිය.

කේ.ඩී.ඒ.එස්.දිසානායක
තලවත්තේගෙදර

12 පිටුවෙන්...

කාවන්තිස්ස රජුගේ දියණිවරුන් වූ මහිලා හා සමන්තා ඒ අයුරින් රජුගේ පුරෝහිත බමුණාගේ දියණියන් වූ දාසි, ගිරිකලි, සුබ්බපාසිකා, සංඝපාලි යන මෙහෙණිවරු එකළ භික්ෂුණී ශාසනය හෙබ වූ බව සඳහන් වේ.

අනුරාධපුර රාජධානි අවධියේ විසූ භික්ෂුණීහු ධර්මය ඉගෙනීමටද, ඉගැන්වීමටද මූලික ස්ථානය ගෙන කටයුතු කළහ. අනුරාධපුර මහා විහාරයේ වැඩ සිටි භික්ෂුණීන් වහන්සේලා එහි සිට විනය ග්‍රන්ථ 05 හා අභිධර්ම ග්‍රන්ථ 07 ම ඉගැන්වූ බව දීපවංශයේ සඳහන් වේ. වළගම්බා රජු දවස භික්ෂුණීන් දසදහසකට ප්‍රධාන වූ උත්තරා නම් භික්ෂුණියක් ත්‍රිපිටකය උගන්වා ඇත. දෙවනපෑතිස් රජ දවස විසූ මහදේවි, පදුමා, හේමා යන භික්ෂුණීහු විනය ඉගැන්වූහ. දෙටුතිස් රජුගේ බිසව රජුට පින් අනුමෝදන් කලේ පැවිදිවී අභිධර්මය ඉගෙනීමෙනි. ත්‍රිපිටකය ආරක්ෂා කර ගැනීම මුඛ පරම්පරාවෙන් පවත්වා ගෙන යාම කෙරෙහි භික්ෂුණීන් වහන්සේලා ඉතා උනන්දුවෙන් කටයුතු කල බව මේ තොරතුරු වලින් අපට පෙනී යයි.

මෙසේ ඉතාම දීප්තිමත්ව පැවති භික්ෂුණී සමාජය පොළොන්නරු යුගයේ අග භාගය වන විට මේ රටට පැමිණි සොලී ආක්‍රමණ ආදි නොයෙක් ව්‍යසනයන් නිසා අතුරුදහන් විය. එහෙත් දැනට වසර 14 ට පෙර රංගිරි දඹුලු රජමහා විහාරය මුල්කරගෙන ථේරවාදී සම්ප්‍රදානුකූලව භික්ෂුණී සමාජය නැවත ආරම්භ විය. දැන් ශ්‍රී ලංකාව පුරා භික්ෂුණීන් වහන්සේලා දහසකට අධික පිරිසක් ධර්ම විනය ආරක්ෂා කරමින් ලෝක ආර්ථ සේවයෙහි යෙදෙමින් වැඩ වාසය කරති.

වත්මන් භික්ෂුණීන් වහන්සේලා විසින්,

- දහම් පාසල් පවත්වාගෙන යමින් මේ රටේ අනාගත පරපුර ගුණ දහමින් පෝෂණය කිරීම උදෙසා ඇප කැප වී කටයුතු කරන අතරම රජයේ පාසල් පෞද්ගලික පාසල් මෙන්ම විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයටද ඇතුලත් වී දරුවන් උදෙසා අධ්‍යාපනය ලබාදීමේ යෙදී වැඩ වාසය කරති.
- මනෝ විද්‍යාත්මක උපදේශන සේවා පවත්වාගෙන යමින් නොයෙක් ආකාරයේ මානසික ගැටළු වලට මුහුණ පා ඇති පිරිස් එයින් මුදවාගෙන දහම් සිසිල ලබා දෙනු ලැබේ.
- ධර්මය හදාරමින්, ගවේෂණය කරමින්, පොතපත ලියමින්, ග්‍රන්ථ ධූරයෙහි නියලී සිටින අතරම ධර්ම දේශනා භාවනා වැඩ සටහන් පවත්වමින් සත්වයා සසර කතරින් එතෙර කිරීමේ පරමාර්ථයෙන් කටයුතු කරනු ලැබේ.
- පිරිත් දේශනා, බෝධි පූජා, ගිලානෝපස්ථාන ආදිය දේ සිදු කරමින් සත්වයාගේ ලෞකික ජීවිත සුවපත් කිරී මෙහිලා කටයුතු කරනු ලැබේ.
- ගණිකා වෘත්තිය, මත් ද්‍රව්‍ය විකිණීම, පාවිච්චි කිරීම, සොරකම් කිරීම ආදි නොයෙක් අපචාර වලට යොමු වී ඇති කාන්තාවන් සොයා වැඩම කරන කලද භික්ෂුණීන් වහන්සේලා ඔවුන් සුමගට ගැනීමෙහිලා අර්ථ යෙන් ධර්ම යෙන් අනුශාසනා කරනු ලැබේ.
- බෞද්ධයගේ උපතේ සිට මරණය දක්වා සියළු ආගමික කටයුතු කර දෙමින් ඔවුන්ගේ මෙලොව පරලොව ජීවිත සැපවත් කිරී මෙහිලා කටයුතු කරනු ලැබේ.

මේ අයුරින් වත්මන් භික්ෂුණීන් වහන්සේලා නිහඬ සමාජ මෙහෙවරක යෙදෙමින් වැඩ වාසය කරනු ලැබේ.

# බොදු මග ඔස්සේ පියවර ඔසවමු



ලෝක වාසී බෞද්ධ ජනතාවට බොදු මග හැර අන් මගක් තිබිය නොහැකිය. ලෞකික, ලෝකෝත්තර සුවයද නිර්වාණාවබෝධය ප්‍රාර්ථනා කරනා බෞද්ධයෝ නිරතුරු බෝධියෙත් එක් අවස්ථාවකදී සසරින් එතර වීමට පාරමී පුරන්නේ අන් කිසිදු ආගමිකයින්ට නොදෙවනි ජීවිත ඥානය කින් යුතුවය.

අගක් මුලක් නොදන්නා සංසාර ගමනේ අතරමං නොවී සිව් සස් අවබෝධයෙන් ජීවිත විමුක්තිය උදාකරගනු පිණිස ඔවුහු මහත් සේ කැප වෙති.

එහෙයින් බුද්ධ ශාසනයේ දැක්වෙන භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සතර පාර්ශවයම වර්තමානයේ යම්තාක් දුරට අසරණ තත්වයකට පත්වී ඇති බවක් පෙනීයයි.

බටහිර ජාතීන් විසින් උසස් යැයි සම්මත කළාවූ සංස්කෘතිය ගෝලීකරණයට හසුවීමේ ප්‍රතිවිපාක වශයෙන් පළමුව පොදු මහ ජනතාවද දෙවනුවට ජවිපෙ පක්ෂයද ජනප්‍රිය සංස්කෘතියේ ආටෝපයන්ට පත්වීම ඊට මූලික හේතුවය.

ලෝකයේ ආශ්චර්යවත් ජන සන්නිවේදකයාණෝ බුදුරජාණන් වහන්සේය. බුදු දහම දැනට වසර 2567 කල් නොනැසී පවතින්නේද දිනෙන් දින ලෝකය පුරා පැතිරී යන්නේද සදාකාලික පරම සත්‍ය ඒ තුළ ගැබ්ව ඇති නිසාය.

කෙසේ වුවද මාධ්‍ය ආගමක් බවට පත්වූ වත්මන් සමාජ ක්‍රමය තුළ බුදුසසුන මෙන්ම බෞද්ධයින්ද මවා වී ඇත්තේ අසීරුතා රුසකටය.

බුදුදහම කියා දෙන දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය යන සතර සංග්‍රහා වස්තු වර්තමාන මාධ්‍ය තුළ නැත. සිගාලෝවාද සූත්‍රය කියාදෙන සදිශා නමස්කාරය හෝ ආර්ය අෂ්ඨාංගික මාර්ගයටද ඒ තුළ ඉඩ නැත.

අවෛරයයද, අධර්මයද අවිද්‍යාවද රුදුරු හස්තයෙන් වත්මන් බාල තරුණ වැඩිහිටි ආදි සියලු ජනකොටස් මුලාවට පත්කරනුයේ එලොව මෙලොව දෙලොවටම ලෝවැසි ජනතාවගේ මනා බේදවාචකයක් කරමිනි.

දැන් කලෙක සිට ලෝක වාසීහු ලෝක විනාශය ගැන කියවති. එය දැන් හොඳ අලෙවි භාණ්ඩයකි. චිත්‍රපටයේ සිට ගීතය දක්වාද, හිස්වැසුමේ සිට පාවහන දක්වාද ලෝක විනාශය දැන් හොඳින් අලෙවි කෙරෙති.

මිනිසා ණැනවත්වී වසර 10000 කට ආසන්නය. නූතන සමාජ ව්‍යුහය ගොඩනඟාගෙන වසර 500ක් පමණ ගතවී අවසන්ය. එහෙත් තුන් ලෝකයේ අපි දැනගෙන දැන් වසර 2565 කටත් වැඩිය. නමුත් බටහිරයෝ මේ සත්‍ය තාමත් ඉඳුරා නොදනිති. ලෝකය අනිත්‍ය බවත් දුක්සහිත බවත් අනාත්මක බවත් අපේ කුඩාවුන් පවා දනිති.

2565 සම්බුද්ධ ජයන්තිය ඔස්සේ ලෝක සත්‍යයේ පරම දහම වන බුදු දහම ලෝකය වෙත ප්‍රමාණවත්ව දායාද කරන්නට අපි අපොහොසත් වීමු. දැන් කළ යුත්තේ අඩුම තරමින් වත්මන් ශ්‍රී ලාංකිකයින්ට හෝ ත්‍රිපිටකයේ සඳහන් විනය සූත්‍ර අභිධර්මාදි ධර්ම කොටස් නොඅඩුව කියා දෙන වැඩ පිළිවෙලක් ඇති කිරීමය. අනෙක් සියලු ක්ෂේත්‍රවලදී මෙන්ම බුදුදහම අතින් බැලුවද බුදුදහම හොඳින් හැදෑරුවෝ දැන් හිඟය. මිනිසුන් සංස්කෘතියත්, රවටා උසස් අධ්‍යාපන ප්‍රතිපත්තීන්, විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයත් නිසා වත්මන් අධ්‍යාපනය ලැබෙන්නේද බුදුදහමින් අල්ප මාත්‍ර ප්‍රමාණයකි.

ගමක් ගමක් පාසා පන්සල් වෙහෙර විහරස්ථාන ආරාම අසපු තිබුණද සැබෑ බුදු දහම ලඬකාව පුරා පැතිර යාමේ අඩුවක් පවතී.

අන්‍ය ආගමිකයන්ද, මිත්‍යා දෘෂ්ටිකයින්ද, ආගමික මූලධර්මවාදීන්ද බිහිවන්නේ එබැවිණි. බුදු සසුනේ පැවැත්ම සඳහා මෙරට සියලු ජන මාධ්‍යයෙන්ද විශාල දායකත්වයක් ලබාදෙති. එසේ වී සියල්ලද ලාබය හා වෙනත් පරමාර්ථ ඔස්සේ සිදුවන බව ඉතා පැහැදිලිය. පන්සිල් ගැනීම, මතක බණ කීම, පාංශකූල පින්කම, පිරිත හා බෝධි පූජා යන ක්ෂේත්‍ර කීපයකට පමණක් සීමා වී ඇති සද්ධර්මය මෙරට සෑම සියලු බෞද්ධ ජනයා හටම අවබෝධකරදීම වර්තමානයේ සිදුකළ හැකි අනර්ගතම පුණ්‍ය කර්තව්‍යක් වන්නේය.

ඒ සඳහා සියලු බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතුයැයි අපි යෝජනා කරමු.

පොතපත ඇසුරින්

# භික්ෂුණී ශාසනය ඇරඹුණු වගයි



> ලෝකවාසී බොදුනුවන්ගේ අතීතය පරම පූජනීය පාරිභෝගික වස්තුව වූ ජයසිරි මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කළ මහ පොහොය ද ඒ උඳුවප් පොහොය වේ. ශ්‍රී ලංකාවාසී කාන්තාවන්ගේ විමුක්ති මාර්ගය පසක් වුයේ අනුලා දේවියගේ පැතුම පරිදි පැවිදි වීමට අවසර ලැබුණ වැදගත්ම සිද්ධිය සංඝමිත්තා තෙරණියගේ සම්ප්‍රාප්තියයි.

බුද්ධ වර්ෂ ක්‍රමයෙන් නම් අටවෙනි පොහොය උඳුවප් පොහොය වේ. ව්‍යවහාර මාස ක්‍රමයෙන් 12 වෙනි පොහොය උඳුවප් පොහොයයි. කාන්තාවන්ට විමුක්ති මාර්ගය උදා කළ පොහොය උඳුවප් පොහොය වේ.

පෞරාණික භාරතයේ රජුවූ බ්‍රාහ්මණ මති මතාන්තර අනුව ජාතික හෝ ආගමික නිදහසත් අහිමි වූ පිරිසක් ලෙස කාන්තාවට ස්වතන්ත්‍රව සමාජයේ හැසිරීම වාරණය වී තිබිණි. පවුලේ කුළුඳුල් දරුවෙකුව දූරියක උත්පත්තිය පවා අනර්ථයකැයි සැළකූ ස්ත්‍රිය වැන්දඹුවක වන්නේ නම් සති පූජා කළ යුතු යැයි ඇදහූ යුගයක් විය එදවස.

එවන් පසුබිමෙක කාන්තා නිදහස සාක්ෂාත් කරමින් අප බුදුපියාණන් වහන්සේ භික්ෂුණී ශාසනය පිහිටුවීමෙන් විමුක්ති මාර්ගය හිමි කර දුන්නේ මේ උඳුවප් පොහෝ දිනකය. බුද්ධත්වයෙන් පස්වැනි වසරේදීය. මහා ප්‍රජාපතී ගෝතමී, ඛේමා, නන්දා, යශෝදරා ඈ රාජකීය කාන්තාවන් සසුන් ගතව භික්ෂුණී ශාසනය පිහිටවනු ලැබුවද වත්මනෙහි එය ඒකාන්තයෙන් පිළිගැනීමට මැලිවීම කෙසේ සාධාරණීය කළ යුතුද යන්න ප්‍රශ්නකාරීය.

අනුබුදු මිහිඳු හිමිපාණෝ ශ්‍රී ලංකා ද්වීපයට වැඩමවීමෙන් දෙරටක රාජ්‍යත්වය වඩාත් ස්ථාවර වත්මන් දඹදිව අශෝක අධිරාජ්‍යයා සහ දේවානම්පියතිස්ස නරපතියාත් රජකරන සමයකය. එදවස වුවද මෙරට කාන්තාවන් නිදහස් වූයේ නැත.

එසේ වුවද ඒ වෙනස තුනී කෙරුණු සංඝමිත්තා මහා තෙරණින් වහන්සේගේ ලංකාගමනය පරිපූර්ණ වූයේ ද උඳුවප් පොහෝ දිනකය. සංඝමිත්තා තෙරණින් වහන්සේගේ ලංකාගමනය හිස් අතින් වූවක් නොවේ. ලෝකවාසී බොදුනුවන්ගේ අතීතය පරම පූජනීය පාරිභෝගික වස්තුව වූ ජයසිරි මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කළ මහ පොහොය ද ඒ උඳුවප් පොහොය වේ.

ශ්‍රී ලංකාවාසී කාන්තාවන්ගේ විමුක්ති මාර්ගය පසක් වුයේ අනුලා දේවියගේ පැතුම පරිදි පැවිදි වීමට අවසර ලැබීමෙනි. එහි වැදගත්ම සිද්ධිය සංඝමිත්තා තෙරණියගේ සම්ප්‍රාප්තියයි. දේශීය කාන්තාවන් පන්සියයක් දහම අසා පැවිදිවීමට කැමැති වන්නේද මෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

ශ්‍රී ලාංකික ස්ත්‍රී වර්ගය තුළ අපරිමිත වෙනසක සන්ධිස්ථානය සංඝමිත් තෙරණින් වහන්සේගේ සම්ප්‍රාප්තිය සනිටුහන් කරයි. එසේ ඇරඹුණ සිරිලක භික්ෂුණී ශාසනයේ තෙරණීන් වහන්සේ වරෙක චීන දේශයේ භික්ෂුනී ශාසනය පිහිටුවීමට ද පෙරමුණ ගත් වග ශාසන ඉතිහාසය පෙන්වා දෙයි. එසේ වැඩම කළේ දේවසාරා තෙරණින් වහන්සේය.

සමසක් වැනි කෙටි කාලයකින් අනුලා දේවියගේ සසුන් ගතවීමෙන් මෙරට ඇරඹී භික්ෂුණී සංඛ්‍යාව හතලිස් දහසක ඉක්මවූ බවද දක්වේ. දුටුගැමුණු රජ දවස මිරිසවැටි පූජෝත්සවයට භික්ෂුණීන් වහන්සේ අනූදහසක් සැපත් වූ බවද වංශකථාවේ දක්වේ.

රුවන්වැලි සෑ රඳුන්ගේ සමාරම්භක උත්සවය දා පියදස්සී තෙරණින් වහන්සේ දෙසූ දහම් සූත්‍රය ඇසූ දහ හතර දහසක් කාන්තාවන් ධර්මාවබෝධය ලැබූ වග මහා වංශයේ 29 වන පරිච්ඡේදයේ පෙන්වා දෙයි. මහිලා, ගිරිකාලී, දාසී, සමණා ආදී වූ භික්ෂුණීන් වහන්සේ පස් නමක් රුහුණේ සිට අනුරාධපුරය වැඩ කර විනය ඉගැන්වූ පුවත දීපවංශයේ දක්වේ. බැමිණි තියාසාය පැවැති යුගයේ පවා උන් වහන්සේ ශාසන උන්නතිය වෙනුවෙන් පෙනී සිටියහ. පොලොන්නරු යුගයේ මහා මල්ලක නම් වූ භික්ෂුණී ආශ්‍රමයක් සිව්වන මිහිදු රජතුමා වසින් කරවා පූජා කරන ලද බවද දක්වේ.

එසේ නම් භික්ෂුණී සසුන අපේ රටෙන් අතුරුදහන් වීමේ ඛේදවාචකය කුමක් වුවද අද වන විට මෙරට කාන්තාවන් අත්පත් කරගත් වරප්‍රසාද බොහෝය. රජයේ රැකියාවන්ට පමණක් නොව දේශපාලනයට ද කාන්තා සහභාගිත්වය ප්‍රවර්ධනයට ඉඩකඩ හිමිය.

එසේ නම් රංගිරි දඹුලු රජ මහා විහාරය මුල්කොට ගෙන පූජ්‍යපාද ඉනාමලුවේ ශ්‍රී සුමංගල හිමිපාණෝ ප්‍රමුඛ එම සංඝ සභාව යළි භික්ෂුණී ශාසනය පිහිටුවීමට ගත් මූලිකත්වය අතිශය සාධනීය පියවරක්ම බව සිහි කටයුතු එය අප රජ දවස භික්ෂුන් වහන්සේට ලැබුණ තැන ගෞරවය යළිත් එලෙසම සිදුවිය යුතු අතර එය අවප්‍රමාණ කිරීමට යම් යම් අංශවල අදහස් කර පරිශ්‍රමයක් දරත් නම් එය මඟහැරවීම මගින්ම පමණක් භික්ෂුනී සසුන සුරක්ෂිත කරවීම උතුම් ක්‍රියාවකි.

දිවයින පුරා විහිදී සිටින තෙරණීන් වහන්සේ නිස්සරණාධ්‍යාසයෙන් සිදුකරන ශාසනික සාමාජික මෙහෙවර පිළිබඳ අධ්‍යනයක යෙදීමට කාලෝචිතය. බුදුන් වහන්සේ පිහිටුවා වදාළ භික්ෂු, භික්ෂුනී, උපාසක, උපාසිකා හතර වර්ගීකරණය චිරාත්කාලයක් සසුනේ පැවැත්වීමට හේතුවේවා.

ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී
පියදාස රත්නසිංහ

**මෙම තීරුවට ඔබටත් ලිපි එවිය හැකියි. ඔබේ ලිපි වචන 250කට කැටි කොට එයට අදාළ පින්තූරයක්ද සමඟ අප වෙත එවන්න. අප්‍රකට හා ඓතිහාසික පුණ්‍යභූමි පිළිබඳ විස්තරයන්ට ප්‍රමුඛස්ථානය හිමිවේ. ඔබේ ලිපි සෑම මසකම පොහෝ දිනට සති 2කට පෙර එවන්න.**

**රංගිරි ශ්‍රී ලංකා පුවත්පත,රංගිරි ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය,දඹුල්ල.** (rangirinewspapers@gmail.com)